මැතිවරණ කොමිෂන් සභාව

தேர்தல் ஆணைக்குழு

ELECTION COMMISSION

2025 අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කරනු ලබන

# ප්‍රගති වාර්තාව 2024

2025 வரவு செலவுத் திட்ட குழு நிலை விவாதத்திற்கு சமர்ப்பிக்கப்படும்

# முன்னேற்ற அறிக்கை 2024

# PROGRESS REPORT 2024

TO BE TABLED IN PARLIAMENT AT COMMITTEE STAGE OF THE BUDGET 2025



# මැතිවරණ කොමිෂන් සභාව

## 2025 අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කරනු ලබන

# ප්‍රගති වාර්තාව 2024

**2025 අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කරනු ලබන ප්‍රගති වාර්තාව - 2024**

**සම්පාදනය, පරිගණක පිටු සැකසුම හා සැලසුම:**

**නීති, විමර්ශන හා සැලසුම් අංශය**

**ප්‍රකාශනය:**

**මැතිවරණ කොමිෂන් සභාව, සරණ මාවත, රාජගිරිය.**

# පටුන

**I කොටස**


මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ පණිවුඩය....vi

මැතිවරණ කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය....viii

1. මැතිවරණ දෙපාර්තමේන්තුව....1
2. මැතිවරණ කොමිෂන් සභාව....1
3. මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථ හා බලතල....2
4. මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර, අගයන්, අවධාරිත ක්ෂේත්‍ර, උපායමාර්ග, පරමාර්ථ හා අරමුණු....4
5. 1931 සිට 2024 දක්වා මැතිවරණ කොමිෂන් සභාව ක්‍රියාත්මක කරනු ලබන අණ පනත්....8
6. මැතිවරණ කොමිෂන් සභාවේ පරිපාලන සංයුතිය....10
7. මැතිවරණ කොමිෂන් සභාවේ එක් එක් ශාඛා හා ඒවායේ කාර්යභාරය....11
    - I. කොමිෂන් සභා අංශය....11
    - II. ජාතික මැතිවරණ ශාඛාව....11
        - II.I. තොරතුරු තාක්ෂණ අංශය....12
    - III. පළාත් පාලන ඡන්ද විමසීම් ශාඛාව....12
        - III.I. විශේෂ ව්‍යාපෘති අංශය....13
    - IV. පාලන ශාඛාව....13
        - IV.I. ආයතන අංශය....14
        - IV.II. ප්‍රවාහන අංශය....14
        - IV.III. ප්‍රසම්පාදන හා වත්කම් කළමනාකරණ අංශය....14
    - V. මූල්‍ය ශාඛාව....15
    - VI. නීති, විමර්ශන හා සැලසුම් ශාඛාව....15
    - VII. අභ්‍යන්තර විගණන ශාඛාව....16
    - VIII. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල....17
8. මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය....18

II කොටස


1. 2022 - 2025 සහභාගීත්ව උපාය මාර්ග සැලැස්ම ....19
2. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ....19
3. මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම් ....19
4. මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදු කරන ලද මැතිවරණ නීති ප්‍රතිසංස්කරණ ....20
5. මැතිවරණ කාර්යය සඳහා දේශපාලන පක්ෂ පිළිගැනීම ....20
6. ඡන්ද හිමියන් ලියාපදිංචිය ....22
7. 2021 අංක 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත ....23
8. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය 2024 ....25
9. 2023(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීම ....28
10. 2024 පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම. ....29
11. 2025 (1), 2025 (2) සහ 2025 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම. ....31
12. ඡන්දහිමි නාමලේඛන ක්‍රියාවලිය සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම ....31
13. 2025 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය ....33
14. පාර්ලිමේන්තු මන්ත්‍රීධූර පුරප්පාඩු පිරවීම ....34
15. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීම 2024.09.21 ....35
16. පාර්ලිමේන්තු මැතිවරණය 2024.11.14 ....42
17. මැතිවරණ ආරවුල් නිරාකරණය ....48
18. පළාත් සභා ඡන්ද විමසීම ....49
19. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ....50
20. පළාත් පාලන ආයතනවල සභික ධුර පුරප්පාඩු පිරවීම ....52
21. විශේෂ ව්‍යාපෘති ....52
22. ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් ඇති වගකීම ....54
23. මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත හා මැතිවරණ නීති බලාත්මක කිරීමට අදාළ දැනුම්වත් කිරීමේ වැඩසටහන් ....55
24. තොරතුරු තාක්ෂණ භාවිතාව ....57
25. නීති කටයුතු .... 61
26. ඉදිකිරීම් හා අලුත්වැඩියා (වැය විෂය 2001) ....**62**
27. මූල්‍ය පාලනය ....63
28. අභ්‍යන්තර විගණන අංශය ....63
29. විදේශ පුහුණු හා ශිෂ්‍යත්ව ....64
30. විදේශ සම්මන්ත්‍රණ සහ නිල චාරිකා ....64
31. 2024 වර්ෂයේ දේශීය පුහුණු ....65
32. මැතිවරණ ක්‍රමවේද සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IFES) මඟින් පවත්වන ලද පුහුණු ....66
33. දේශපාලනික වශයෙන් කාන්තාවන් සවිබල ගැන්වීම ....66
34. පුහුණුකරුවන් සංචිතයක් ස්ථාපිත කිරීම හා ඔවුන් දැනුම්වත් කිරීම ....66

35. ස්ථාන මාරුවීම් හා අනුයුක්ත කිරීම්...67
36. වාහන භාවිතය හා නඩත්තුව...67
37. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අදාළ කටයුතු...67
38. මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු...67
39. ලේඛනාගාරය...68
40. දැනුම් කළමනාකරණ ඒකකය හා කෞතුකාගාරය...68
41. මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රකාශන...69

III **කොටස**

01. 2025 වාර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා කාර්යයන්...71

# මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ පණිවුඩය

ජනතාව විසින් ජනතාව උදෙසා ජනතා සහභාගීත්වයෙන් පවත්වන පාලනය ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ලෙස හඳුන්වයි. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකදී ජනතාවගේ අවශ්‍යතා මත පදනම්ව රාජ්‍යයක් පාලනය කිරීම සිදුවේ. මෙහිදී ජනතාවගේ අවශ්‍යතා සහ කැමැත්ත හඳුනාගැනීම සඳහා භාවිතා කරන ප්‍රධානතම මෙවලම වනුයේ මැතිවරණයයි. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පරමාධිපත්‍ය බලය ජනතාව වෙත පිහිටා ඇති අතර එයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් හා ඡන්ද බලය ඇතුළත් වේ. මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත්වන සංශෝධනය අනුව 103(2) ව්‍යවස්ථාවෙහි නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථය ලෙස දක්වා ඇති අතර මැතිවරණ නීති අනුව අදාළ ඡන්ද විමසීම් පැවැත්වීමටත් වාර්ෂික ඡන්ද හිමි නාම ලේඛන සැකසීමටත් කොමිෂන් සභාවට බලය ලබා දී ඇත. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි දක්වා ඇති පරිදි පනවා ඇති අණපනත් අනුව ඡන්ද විමසීම් පැවැත්වීමේ වගකීමත් දේශපාලන පක්ෂ පිළිගැනීමත් මැතිවරණ කොමිෂන් සභාව වෙත පවරා ඇති නමුත් ඒවාට පමණක් සීමා නොවන බවද දක්වා ඇත.

2024 වර්ෂය මැතිවරණ කොමිෂන් සභාවට ඉතා සුවිශේෂී වර්ෂයක් වූ අතර මෙම වර්ෂයේ අවසන් කාර්තු දෙක ඇතුළත මෙරට නමවන විධායක ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ජනාධිපතිවරණ ඡන්ද විමසීම සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දසවැනි පාර්ලිමේන්තුව සඳහා මන්ත්‍රීවරුන් තෝරා පත්කරගැනීමේ පාර්ලිමේන්තු ඡන්ද විමසීම ඉතා සාර්ථකව පැවැත්වීමට හා විශේෂයෙන්ම සම තරග බිමක් නිර්මාණය කිරීම සඳහා විද්‍යාත්මකව තක්සේරු කරන ලද කරුණු මත පදනම් වූ සූත්‍රයක් භාවිතයෙන් 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමන පනත පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමටද මැතිවරණ කොමිෂන් සභාවට හැකියාව ලැබුණි. ඒ අනුව 2024 වර්ෂයේ ආරම්භයේ සිට සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ මැතිවරණ කොමිෂන් සභාවට පැවරී ඇති ව්‍යවස්ථාපිත කාර්යභාරය සාක්ෂාත් කරගනු පිණිස ඉටු කරන ලද කාර්යයන් හා එහි ප්‍රගතිය පිළිබඳ සමාලෝචනය මෙම වාර්තාවෙන් ඉදිරිපත් කරනු ලැබේ.

පෙර පැවති මැතිවරණ දෙපාර්තමේන්තුව සහ මැතිවරණ කොමිෂන් සභාව මෙන්ම වර්තමාන මැතිවරණ කොමිෂන් සභාව ද පවතින අවශ්‍යතා අනුව මැතිවරණ ක්‍රමය සහ මැතිවරණ නීතිවලින් අත්‍යාවශයෙන්ම කළ යුතු වූ සංශෝධන හඳුනා ගනිමින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. ඒ අතරට ඡන්ද විමසීම් පනත්වල පවත්නා ඇප තැන්පත් වැඩි කිරීම, ඡන්ද ප්‍රකාශ කිරීමේදී උචිත ලකුණෙන් සලකුණු කිරීමේ ක්‍රියාවලිය ඉවත් කිරීම, ජංගම ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, විවෘත ඡන්දදායක ලියාපදිංචිය, සංක්‍රමණිකයන් සඳහා ඡන්ද ප්‍රකාශ කිරීමේ අයිතිය ලබාදීම යනාදිය සඳහා වූ නීති සම්පාදනය ප්‍රධාන වේ. එමෙන්ම තරුණ, කාන්තා, ආබාධිත හා ආන්තික ජන කණ්ඩායම් මැතිවරණ ක්‍රියාවලිය තුළට සක්‍රීයව දායක කර ගැනීම සඳහා ඒ හා සම්බන්ධ පාර්ශ්ව හා එක්ව වැඩමුළු හා පුහුණු වැඩසටහන් රැසක් පැවැත්වීමටත් කටයුතු කර ඇත. ඊට අමතරව පූර්ණ ආබාධ සහිත තැනැත්තන් සඳහා ඡන්ද මධ්‍යස්ථානවලදී ඍජුවම ඔවුනට අවශ්‍ය සහය ලබාදෙනු වස් තාවකාලික හැඳුනුම්පතක් නිකුත් කිරීම, දෘෂ්‍යාබාධිත තැනැත්තන් සඳහා ඡන්ද පත්‍රිකාව ලකුණු කිරීමට මඟපෙන්වන ස්පර්ශකරාමු හඳුන්වාදීම, ශ්‍රවණබාධ ඇති තැනැත්තන්ට මැතිවරණයට අදාළ වචන ඇතුළත් කර සංඥා භාෂා ශබ්ද කෝෂය පිළිබඳ දැනුම්වත් කිරීම හා ඡන්ද පොළ තුළ දී ඇතිවිය හැකි සන්නිවේදන බාධක අවම කිරීම සඳහා ඡන්ද ස්ථානාධිපතිවරුන්ට සංඥා භාෂාව පිළිබඳ පුහුණුවක් ලබාදීම ආදී වශයෙන් මැතිවරණ කාල සීමාව තුළ දී විශේෂ අවශ්‍යතා ඇති ප්‍රජාවගේ ඡන්ද අයිතිය සුරැකීම සඳහා කොමිෂන් සභාව උපරිම උත්සහයක් ගන්නා ලදි. තවද මැතිවරණ කාලසීමාව තුළදී ඒ සම්බන්ධව පවතින නීති කඩකිරීම් හා ලැබෙන පැමිණිලි සම්බන්ධව ක්‍රියාකිරීමට මැතිවරණ කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථාන රටපුරා ක්‍රියාත්මක කරන ලද අතර සමාජ මාධ්‍ය සම්බන්ධ පැමිණිලි වෙනුවෙන් කටයුතු කිරීමට විශේෂිත ඒකකයක්ද මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටුවන ලදි. කෙසේ වෙතත් පවත්නා නීති රාමුව තුළ තරග වදින සියලුම පක්ෂ අපේක්ෂකයන්ට සාධාරණ සහ සම අවස්ථාවන් ලබා දීම උදෙසා මැතිවරණ කොමිෂන් සභාව ඉහළින්ම කටයුතු කළ බව

සඳහන් කරනු කැමැත්තෙමි. එපමණක් නොව මැතිවරණ කටයුතු මධ්‍යයේ වුවද මැතිවරණ කොමිෂන් සභාවේ 2022-2025 කාලය සඳහා සකස්කරන ලද සහභාගීත්ව උපාය මාර්ග සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම්වලට අදාළ ඉලක්ක සපුරා ගැනීමටද අවශ්‍යය පියවර ගන්නා ලදි.

මෙම වාර්තාවෙහි ඇතුළත්වන කරුණු අනුව සමාලෝචිත කාලය තුළදී මැතිවරණ කොමිෂන් සභාවේ වත්මන් ප්‍රගතිය ළඟාකර ගැනීම සඳහා කොමිෂන් සභා සාමාජිකයන් සහ මැතිවරණ කොමසාරිස් ජනරාල්, ලේකම්, අතිරේක මැතිවරණ කොමසාරිස්වරුන්, ප්‍රධාන මූල්‍ය නිලධාරී ඇතුළු ප්‍රධාන කාර්යාලයේ සියලුම නිලධාරීන් ලබාදුන් සහාය බෙහෙවින් අගය කරන අතර එක් එක් නිලධාරීන් වෙත පැවරී ඇති වගකීම කාර්යක්ෂමව හා ඵලදායි අයුරින් නිසි කාලරාමුව ඔස්සේ ඉටු කරනු ලැබීමද මෙම ප්‍රගතියට මනා පිටුවහලක් වූ බව සඳහන් කරනු කැමැත්තෙමි. මෙම ප්‍රගති වාර්තාව සකස් කර ගැනීම සඳහා දායකත්වය සැපයූ සියලුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන්, සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් ප්‍රමුඛ දිස්ත්‍රික් මැතිවරණ කාර්ය මණ්ඩල නිලධාරීන්, දේශපාලන පක්ෂ, නිරීක්ෂණ සංවිධාන, සිවිල් සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ මාධ්‍ය ආයතන ඇතුළු සියලුම පාර්ශ්වකරුවන්ට මාගේ ප්‍රණාමය පුද කර සිටින අතර මේ සඳහා අවශ්‍ය තොරතුරු, සංඛ්‍යා සහ ඡායාරූප ලබා දුන් සියලු අංශ ප්‍රධානීන්ට, ප්‍රකාශනය සම්පාදනය හා පරිගණක පිටු සැකසුම් කළ නීති විමර්ශන හා සැලසුම් අංශයේ නිලධාරීන්ට භාෂා පරිවර්තන කටයුතු සිදුකළ කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක නිලධාරීන්ට වාර්තාව මුද්‍රණයකොට පොත් බැඳීම සිදුකළ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට ද මාගේ හදපිරි කෘතඥතාව පිරිනමනු කැමැත්තෙමි.

**ආර්.එම්.ඒ.එල්.රත්නායක**
**සභාපති**
**මැතිවරණ කොමිෂන් සභාව**

# මැතිවරණ කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය

"සර්වජන ඡන්ද බලය සුරකින දේශයක්" දැක්ම පෙරදැරි කරගනිමින් ජනතා පරමාධිපත්‍යය සුරකිනු වස්, සර්වජන ඡන්ද බලය හා සබැඳි ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ආරක්ෂා කරමින් පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන පරිදි අදාළ සියලු පාර්ශ්ව දැනුම්වත් කෙරෙන නිදහස්, සාධාරණ හා විශ්වසනීය මැතිවරණ ක්‍රියාවලියක් කාර්යක්ෂමව හා සඵලතාවයෙන් මෙහෙයවීමේ මෙහෙවර ප්‍රමුඛ කර ගනිමින් කටයුතු කිරීම මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රමුඛ කාර්යයි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 2025 වර්ෂයේ අයවැය කාරක සභා අවස්ථා විවාදය සඳහා ඉදිරිපත් කරනු ලබන 2024 වර්ෂයේ මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉටුකරන ලද කාර්යයන් හි ප්‍රගතිය මෙම වාර්තාවෙන් ඉදිරිපත් කෙරේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල අනුව 2024 වර්ෂයේදී ජාතික මට්ටමේ මැතිවරණ දෙකක් වන ජනාධිපතිවරණයත් පාර්ලිමේන්තු මැතිවරණයත් තත්කාලයේ පවත්නා නීතිය ප්‍රකාරව නිදහස්ව හා සාධාරණව පැවැත්වීම මගින් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම නිසි පරිදි ඉටුකිරීමට හැකිවිය. මෙම මැතිවරණ ද්විත්වය පැවැත්වීමට සිදුවූයේ ස්ථිර පොලිස්පතිවරයෙකු හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන) නොමැති වාතාවරණයක් තුළ වුවද, නිදහස් හා සාධාරණ මැතිවරණයන් සාක්ෂාත් කරගනු පිණිස එවකට ජනාධිපති ලේකම්තුමා, වැඩබලන අතිරේක ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමන්, මැතිවරණ විෂය භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමන් ඇතුලු සියලුම පළාත්භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් ඇතුළු සමස්ත පොලිස් දෙපාර්තමේන්තුව වෙතින් ලත් සහය ප්‍රසංශනීය වේ.

මෙම මැතිවරණ ද්විත්වයම ඉතා සාර්ථක ලෙස අවසන් කිරීමේ ගෞරවය මැතිවරණ කොමිෂන් සභාවට පමණක් අයිති වූවක් නොවන අතර රජයේ මුද්‍රණාලය, තැපැල් දෙපාර්තමේන්තුව ප්‍රමුඛකර ගත් සියලුම රාජ්‍ය ආයතනද සතු වේ. එසේම සුදුසු පරිදි පුරවැසියන් දැනුම්වත් කරමින් තම කාර්යභාරය නිවැරදිව ඉටු කළ සියලුම විද්‍යුත් හා මුද්‍රිත ආයතනද එහි පාර්ශවකරුවෝ වෙති.

2022-2025 කාල රාමුව සඳහා සකසන ලද සහභාගීත්ව උපාය මාර්ග සැලැස්ම අනුව යමින් පරමාර්ථ අටක් ඔස්සේ අරමුණු විස්සක් සක්ෂාත් කර ගනු පිණිස මැතිවරණ කොමිෂන් සභාව කටයුතු කරනුයේ, දැනුම්වත් කිරීම් හා සජීවීකරණය, නීති ප්‍රතිසංස්කරණය, ආයතනික සංවර්ධනය සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම යන අවධාරිත ක්ෂේත්‍ර හතර කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දෙමිනි.

ඉතා සීමිත කාලපරාසයක් තුළ අර්බුදකාරී වාතාරණයන් හමුවේ වුවද නොසැලී මැතිවරණ ද්විත්වයක් පවත්වමින්, අරමුණු කරා මැතිවරණ කොමිෂන් සභාව මෙහෙය වීමට ශක්තියක් වූ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ආර්.එම්.ඒ.එල්.රත්නායක මැතිතුමා ඇතුළු කොමිෂන් සභාවේ සාමාජික මහත්ම මහත්මීන් ද කෘතඥපූර්වකව සිහිපත් කරමි. වෙහෙසකාරී තත්ත්වයන් හමුවේ සියලු පීඩාකාරී වාතාවරණයන් විඳ ගනිමින් ආයතනික දෛනික කාර්යයන් ද නොපිරිහෙලා ඉටුකරමින් මෙකී මැතිවරණ ද්විත්වය සාර්ථක කර ගැනීමට ප්‍රශංසනීය මෙහෙයක් ඉටු කළ, මැතිවරණ කොමිෂන් සභාවේ ක්‍රියාකාරී හස්තය වූ මැතිවරණ මහලේකම් කාර්යාලය ඇතුළු සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල නිලධාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය මෙහි ලා විශේෂයෙන් අගය කරනු කැමැත්තෙමි. එසේම සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් මෙන්ම මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යයන් හි දී සමීපව කටයුතු කරනු ලබන සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් ලත් සහයෝගය ද තවදුරටත් සිහිපත් කරනු කැමැත්තෙමි. සියලු රාජ්‍ය නිලධාරීන් ද, සිවිල් සංවිධාන නියෝජිතයින්, දේශපාලන පක්ෂ, නිරීක්ෂණ සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන හා සියලු මාධ්‍ය ආයතන කෘතඥතා පූර්වකව සිහිකරමි.

මෙම ප්‍රකාශනය සම්පාදනයෙහි ලා ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළ අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) ඇතුළු නීති විමර්ශන හා සැලසුම් අංශයේ ප්‍රධානීන්ද, සමස්ත කාර්ය මණ්ඩලයද, ඒ සඳහා අවශ්‍ය සියලු තොරතුරු සම්පාදනය කරමින් සහාය වූ ප්‍රධාන කාර්යාලයේ සියලු අංශ ප්‍රධානීන් ද ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයද කෘතඥතාපූර්වකව සිහිපත් කරමි.

**සමන් ශ්‍රී රත්නායක**
**මැතිවරණ කොමසාරිස් ජනරාල්**

## 01. මැතිවරණ දෙපාර්තමේන්තුව

දිවයිනේ පාලන කටයුතුවල දී දේශීය ජනතාවට සහභාගීවීමේ වැඩි අවස්ථා සැලසිය යුතු යැයි 20 වන සියවසේ මුල් භාගයේ පැන නැගුණු ප්‍රබල උද්ඝෝෂණවලට ප්‍රතිචාරයක් වශයෙන් බ්‍රිතාන්‍ය කිරීටය විසින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා 1944 වසරේ දී සෝල්බරි කොමිසම පත් කරන ලදී. සෝල්බරි කොමිසම විසින් ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමත් පාර්ලිමේන්තු ඡන්ද විමසීම් පැවැත්වීමත් සඳහා වූ නීති සම්පාදනය කරන ලද අතර 1946 සැප්තැම්බර් 26 දින පාර්ලිමේන්තු ඡන්ද විමසීම් රාජ ආඥාව පනවන ලදී. පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම පැවැත්වීම සඳහා 1946 දී පළාත් පාලන ආඥා පනත ඉදිරිපත් කරන ලදී. 1946 සිට 1955 දක්වා වූ කාල වකවානුවේ දී ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමත් පාර්ලිමේන්තු ඡන්ද විමසීම් පැවැත්වීමත් සඳහා එක් කොමසාරිස්වරයෙකු යටතේ පාර්ලිමේන්තු මැතිවරණ දෙපාර්තමේන්තුවත් පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා තවත් කොමසාරිස්වරයෙකු යටතේ පළාත් පාලන මැතිවරණ දෙපාර්තමේන්තුවත් ක්‍රියාත්මක විය. එලෙස වෙන් වෙන්ව පැවති පාර්ලිමේන්තු මැතිවරණ දෙපාර්තමේන්තුව හා පළාත් පාලන මැතිවරණ දෙපාර්තමේන්තුව ඒකාබද්ධ කොට 1955 ඔක්තෝබර් 1 වැනි දින මැතිවරණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී.

## 02. මැතිවරණ කොමිෂන් සභාව

2001 ඔක්තෝබර් 03 වැනිදා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 17 වැනි සංශෝධනය ගෙන එන ලද අතර එම සංශෝධනය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් මැතිවරණ කොමිෂන් සභාව පත්කළ යුතු විය. එසේ වුව ද පත්කිරීම් පිළිබඳව ඇති වූ ගැටලු නිසා අපේක්ෂිත පරිදි මැතිවරණ කොමිෂන් සභාව පත් නොවීය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද 17 වැනි සංශෝධනය අනුව මැතිවරණ කොමිෂන් සභාවක් පත්කරන තුරු එම තනතුරු දැරූ පස්වැනි මැතිවරණ කොමසාරිස්වරයාට මැතිවරණ කොමිෂන් සභාවේ රාජකාරි කටයුතු කිරීමට සිදුවිය. 2010.09.09 දින සම්මත කරන ලද 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් මැතිවරණ කොමිෂන් සභාවේ සංයුතිය සාමාජිකයන් පස් දෙනෙකු දක්වා වැඩි කරන ලදී. එසේම මැතිවරණ කොමිෂන් සභාව සංස්ථාපනය කරන තෙක් කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඉටු කළ යුතු විය. එසේ වුව ද එවරද මැතිවරණ කොමිෂන් සභාව සංස්ථාපනය නොවීය.

2015 වර්ෂයේ දී දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ස්වාධීන කොමිෂන් සභා ස්ථාපනය කිරීමට රජය විසින් පියවර ගත් අතර ඒ අනුව එතෙක් පැවති මැතිවරණ දෙපාර්තමේන්තුව අහෝසි වී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත අතිගරු ජනාධිපතිතුමා විසින් සභාපතිවරයකු ඇතුළු සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත මැතිවරණ කොමිෂන් සභාව 2015.11.13 දින සංස්ථාපනය කරනු ලැබීය.

2020 ඔක්තෝම්බර් 29 දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද විසිවන සංශෝධනය මගින් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාව පහක් දක්වා වැඩි කරන ලදී. ඒ අනුව 2020.12.10 දින පාර්ලිමේන්තු සභාවේ නිර්දේශ මත දෙවන මැතිවරණ කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද අතර එය සභාපති ඇතුළු සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත විය.

නීතිඥ නිමල් ජී. පුංචිහේවා මහතා සභාපතිවරයා ලෙස ද මහ භාණ්ඩාගාරයේ හිටපු නියෝජ්‍ය ලේකම්වරයෙකු වූ එස්.බී. දිවාරත්න මහතා, හිටපු මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙකු වූ එම්.එම්. මොහමඩ් මහතා, හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වූ කේ.පී.පී. පතිරණ මහතා, මානව හිමිකම් ක්‍රියාකාරියෙකු වූ ජීවන් ත්‍යාගරාජා යන මහත්වරු කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයන් ලෙස ද පත් කරන ලදී. ජීවන් ත්‍යාගරාජා මහතා උතුරු පළාත් ආණ්ඩුකාරවර ලෙස 2021.10.10 දින පත්ව ගිය අතර ඒ මහතා වෙනුවට ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරිනියක වූ හිටපු උතුරු පළාත් ආණ්ඩුකාරවර පී.එස්.එම්. චාල්ස් මහත්මිය 2021.10.28 දින පත් කරන ලදී.එම කොමිෂන් සභාවේ සණ පූරණය සාමාජිකයන් තිදෙනෙකි.

2022.10.31 දින සම්මත වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21වන සංශෝධනයට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත තෙවන මැතිවරණ කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලදී. එම කොමිෂන් සභාවේ සභාපති ලෙස හිටපු මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙකු වූ ආර්.එම්.ඒ.එල්.රත්නායක මහතා ද, සාමාජිකයින් ලෙස හිටපු මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙකු වූ එම්.ඒ.පී.සී.පෙරේරා මහතා හා නීතිඥ අමීර් ෆායිස් මහතා පත් කරන ලද අතර ඔවුන් 2023.07.05 දින රාජකාරී ආරම්භ කරන ලදී. නීතිඥ ඒ.ෂන්මුගනාදන් මෙනෙවිය සාමාජිකාවක් ලෙස පත් කරන ලද අතර ඇය 2023.09.11 දින රාජකාරී ආරම්භ කරන ලදී.තෙවන මැතිවරණ කොමිෂන් සභාවේ පස්වන සාමාජිකයා වශයෙන් මහාචාර්ය ඩී.එම්.එස්.ලක්ෂ්මන් දිසානායක මහතා 2024.01.02 වනදින පත් කරන ලදී. ඒ අනුව මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා 2024.01.10 වනදින රාජකාරී භාරගැනීම සිදු කළ අතර කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාව 05ක් වශයෙන් සම්පූර්ණ විය.

## 03. මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථ හා බලතල

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 (2) ව්‍යවස්ථාවෙහි සඳහන් පරිදි නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථය විය යුතු ය. එමෙන්ම පවත්නා මැතිවරණ නීති අනුව මැතිවරණ පැවැත්වීමටත්, වාර්ෂික ඡන්දහිමි නාමලේඛන පිළියෙල කිරීම හා ප්‍රතිශෝධනය කිරීමට ද කොමිෂන් සභාවට බලය ඇති අතර, කොමිෂන් සභාවේ කටයුතු එම බලතලවලට සහ කාර්ය කර්තව්‍යවලට සීමා නොවන බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (1) ව්‍යවස්ථාවෙහි දක්වා ඇත. මේ අනුව අදාළ අණ පනත් අනුව මැතිවරණ පැවැත්වීමේ වගකීම පැවැරුණු මැතිවරණ දෙපාර්තමේන්තුවට වඩා විශේෂිත වගකීමක් මැතිවරණ කොමිෂන් සභාවට පැවරී ඇත. ඊට අදාළව දහනව වන ව්‍යවස්ථා සංශෝධනය මගින් මූලික නීතියට විශේෂ විධිවිධාන ඇතුළත් කිරීම තුළින් මැතිවරණ කොමිෂන් සභාවේ බලතල පුළුල් කර ඇත.

මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවීමේ දී කොමිෂන් සභාවට විශේෂ බලතල ලබා දී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 අ ව්‍යවස්ථාව යටතේ අධිකරණ බලයට යටත්ව,

I. කොමිෂන් සභාවේ තීරණ, විධිවිධාන හෝ ක්‍රියා අවසානාත්මක හා තීරණාත්මක වීම හා

II. මැතිවරණ කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකු හෝ නිලධරයකුට මැතිවරණයක් පැවැත්වීම හා සම්බන්ධ යම් නීතියක් යටතේ සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් පැවරිය නොහැකි වීම,

යන විශේෂ මුක්තීන් ලබා දී ඇත. මෙම මුක්තීන් ලබා දී ඇත්තේ 126 වන ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳ අභියාචනා අධිකරණ බලය, 130 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරණය, මැතිවරණ පෙත්සම් ආදිය සම්බන්ධයෙන් ඇති අභියාචනා අධිකරණ බලය, 144 වන ව්‍යවස්ථාව යටතේ මන්ත්‍රී ධුරයකට තෝරා ගැනීමට අදාළ පෙත්සම් විභාගයට ඇති අභියාචනා අධිකරණ බලයට යටත්ව ය. තවද, මැතිවරණ ක්‍රියාවලිය මෙහෙයවීමේ දී නීති බලාත්මක කිරීම හා සුරක්ෂිත කිරීම ද ස්වකීය කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ද හැර වෙනත් වගකීමට මැතිවරණ කොමිෂන් සභාව බැඳී නැති බව විශේෂිත කාරණයකි. මේ හැර රාජ්‍ය දේපල අවභාවිතාව වැලැක්වීම සම්බන්ධයෙන් විශේෂිත බලයක් 104 ආ (4) (අ) ව්‍යවස්ථාව යටතේ ලබා දී ඇති අතර, 104 (5) (අ) ව්‍යවස්ථාව අනුව ඡන්ද විමසීම් සීමාවේ දී නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සහතික කිරීම සඳහා මාධ්‍ය ආයතන වෙත මාධ්‍ය උපමාන නියම කිරීමට හා ඊට අදාළව විධිවිධාන පැනවීමට ඉඩ සලසා ඇත. 104 ඇ ව්‍යවස්ථාව යටතේ පොලිසිය යොදවා ගැනීමට ද, 104 ඈ ව්‍යවස්ථාව යටතේ සන්නද්ධ හමුදා යෙදවීමට ද, කොමිෂන් සභාව වෙත විශේෂ බලතල ලබා දී තිබේ.

## 04.මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර, අගයන්, අවධාරිත ක්ෂේත්‍ර, උපායමාර්ග, පරමාර්ථ හා අරමුණු

**දැක්ම**

"සර්වජන ඡන්ද බලය සුරකින ප්‍රජාතාන්ත්‍රික දේශයක්"

**මෙහෙවර**

"ජනතා පරමාධිපත්‍යය, සර්වජන ඡන්ද බලය හා සබැඳි ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ආරක්ෂා කරමින් පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන පරිදි අදාළ සියළු පාර්ශව දැනුවත් කෙරෙන නිදහස්, සාධාරණ හා විශ්වසනීය මැතිවරණ ක්‍රියාවලියක් කාර්යක්ෂමව හා සඵලතාවයෙන් යුතුව මෙහෙයවීම"

**අගයන්**

- **අවංක බව (ඍජු බව)**
  මැතිවරණ කොමිෂන් සභාවේ හා එහි නිලධාරීන්ගේ අවංකභාවය, උසස් චරිතවත්භාවය හා ඍජු ප්‍රතිපත්ති පවත්වාගෙන යාම.
- **විනිවිදභාවය**
  සියලුම කටයුතුවල දී මැතිවරණ කොමිෂන් සභාව හා එහි නිලධාරීන් සත්‍යවාදී ලෙස, සාධාරණ ලෙස හා විවෘත ලෙස ක්‍රියාකරන බව.
- **විවෘතභාවය**
  මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් කිසිවක් නොසඟවා කථාකරන බව හා ක්‍රියාකරන බව.
- **කැපවීම**
  මැතිවරණ කොමිෂන් සභාවේ කටයුතුවල දී එහි දැක්මට, මෙහෙවර ප්‍රකාශයට, අපේක්ෂා හා අරමුණුවලට මුළුහදින්ම එකඟව ක්‍රියාකිරීම හා ඉදිරිපත්වන ගැටලු හා අභියෝගවලට නොපසුබටව මුහුණදීම.
- **වගකීමට ඇති බැඳීම**
  රාජකාරී කටයුතුවල දී මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් සදාචාරාත්මකව වගකීමට බැඳී සිටීම.
- **වගවීම**
  මැතිවරණ කොමිෂන් සභාව හා එහි නිලධාරීන් තමන්ගේ සියලු කටයුතු පිළිබඳ වගවීම, ඒ කටයුතුවල වගකීම්වලට බැඳීම, තමන් කරන කටයුතුවල ප්‍රතිඵල විනිවිද පෙනෙන ලෙස ප්‍රකාශයට පත්කිරීම.
- **අපක්ෂපාතීභාවය**
  මැතිවරණ කොමිෂන් සභාව හා එහි නිලධාරීන් එක් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් හා බැඳී නොසිටීම හා එවැනි බලපෑම්වලට ගොදුරු නොවීම, පාර්ශවයන් නොගැනීම.
- **කණ්ඩායම් හැඟීම හා එක් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම**
  මැතිවරණ කොමිෂන් සභාවේ ඉහළම නිලධාරියා ඇතුළු සෑම නිළධාරියකු තුළ ම නිවැරදි ආකල්ප සහිතව එක්ව කටයුතු කිරීම පිළිබඳ හැඟීමක් තිබීම.

# අවධාරිත ක්ෂේත්‍ර

- **දැනුම්වත්කිරීම හා සජීවිකරණය**

  සමස්ත මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම යුගයේ අවශ්‍යතාවක් බව මැතිවරණ කොමිෂන් සභාව දැඩි ලෙස විශ්වාස කරන අතර විශේෂයෙන් සර්වජන ඡන්ද බලය නිසි අයුරින් යොදා ගැනීමෙන් රටේ පාලනය සඳහා තම වගකීම බුද්ධිමත්ව ඉටුකිරීම පිණිස ඡන්දදායකයින් පෙළ ගැස්වීම අරමුණු කරගත් පුළුල් වූ අධ්‍යාපනයක් ලබාදීමට විශේෂ අවධානයක් යොමු කොට ඇත. මේ තුළින් ජනතා පරමාධිපත්‍ය වඩාත් අර්ථවත් වන බව කොමිෂන් සභාවේ අපේක්ෂාවයි.

  ඡන්ද බලයේ වගකීම පිළිබඳව සියළුම පුරවැසියන් දැනුම්වත් කිරීම මැතිවරණ බලධාරීන්ගේ ප්‍රධාන වගකීමකි. ඡන්ද බලය යනු ජනතා පරමාධිපත්‍යයි. එසේම රටේ පාලනයට සහභාගීවීමට ඇති හැකියාව අනුව තමන් කැමති පාලකයකු තෝරා ගැනීම ක්‍රියාත්මක වන්නේ ඡන්ද බලය මගිනි. ඡන්ද බලයේ වැදගත්කම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉහළම ප්‍රමුඛතාවෙන් යුතුව ඇතුළත් කර තිබේ. එය ජනතා පරමාධිපත්‍යයේ ප්‍රධාන අංගයක් බව සඳහන් කර ඇත. ඡන්ද බලය ජනතාවගේ මූලික අයිතිවාසිකමක් ලෙස නඩු තීන්දුවල පවා ප්‍රකාශ කර ඇත. සෑම මැතිවරණයක්ම ජනතා පරමාධිපත්‍යය වන අතර නිදහස් හා සාධාරණ වූ රහස්‍ය ඡන්දය පුරවැසියාගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියේ කොටසකි.

  ඡන්ද බලයේ වැදගත්කම පිළිබඳව ඉතා පුළුල් අයුරින් පාසැල් දරුවන්ගේ සිට තරුණ, කාන්තා, යොවුන් පරපුර මෙන්ම වැඩිහිටි පරම්පරාව ද ප්‍රමාණවත් අයුරින් දායක කර ගැනීම සහ එය අර්ථවත් කිරීමට පුළුල් වූ අධ්‍යාපනයක් සකස් කිරීමට මැතිවරණ කොමිෂන් සභාව අවධාරණයෙන් කටයුතු කිරීමට පෙළගැසී ඇත.

- **නීති ප්‍රතිසංස්කරණ**

  සමස්ත මැතිවරණ ක්‍රියාවලිය තුළ කළ යුතු නීති ප්‍රතිසංස්කරණ පිළිබඳව කොමිෂන් සභාව පසුගිය වසර මුළුල්ලේ දැඩි උත්සාහයක නිරත වූ බව සඳහන් කළ යුතු ය. ඒ අනුව පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාවක් පත්කර ගැනීම සඳහා කොමිෂන් සභාව අනලස්ව කටයුතු කරමින් නීති ප්‍රතිසංස්කරණ සඳහා යෝජනා රැසක් එකී තේරීම් කාරක සභාවේ  අවධානයට යොමු කර ඇත. එකී යෝජනා බොහොමයකට පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාවේ නිර්දේශ ලැබීම පිළිබඳව කොමිෂන් සභාව බලවත් සතුටට පත්වන්නා සේම ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ගත හැකි සියළුම පියවර ගැනීම සඳහා කඩිනම් වැඩසටහනක් ද දැනටමත් දියත් කර ඇත. ඒ තුළින් ජනතා පරමාධිපත්‍ය යථාර්තයක් බවට පත් කරනු පිණිස, මහජන අයිතිවාසිකම් ආරක්ෂා කරමින් බුද්ධිමත් අයුරින් සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක කිරීම තුළින් නිදහස් හා සාධාරණ මැතිවරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ. 2022-2025 උපාය මාර්ග සැලැස්මේ නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය මුළුමනින්ම මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයවනු ලැබේ.

- **ආයතනික සංවර්ධනය**

  උපායමාර්ග සැලසුමේ අවධාරිත ක්ෂේත්‍ර තුළින් ඉටුකිරීමට අපේක්ෂා කරන නව ගමන් මග වඩාත් ඵලදායී කිරීම සඳහා පවත්නා ආයතනික සංවිධාන ව්‍යුහය ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් වේ. ඒ සඳහා අවශ්‍ය කරන භෞතික සම්පත් නිසි පරිදි හසුරුවමින් සංවිධානය සතු

මානව සම්පත උපරිම ධාරිතාවකින් යුක්තව මෙහෙයවමින් ආයතනික ශක්තිය වර්ධනය කිරීම තුළින් ආයතනයේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව තහවුරු කිරීමට කොමිෂන් සභාව විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර, අරමුණු තිරසාර පදනමකින් ළඟාකර ගැනීම සඳහා ආයතනයේ භෞතික, මානව, මූල්‍ය හා තාක්ෂණ සම්පත් මනාව කළමනාකරණ කිරීම අත්‍යාවශ්‍ය උපාය මාර්ගයක් බව කොමිෂන් සභාව විශ්වාස කරයි.

- **තාක්ෂණය උපයෝගීකර ගැනීම**
  ඡන්දදායකයින්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීම උදෙසා ආයතනයේ කටයුතු ජනතා අපේක්ෂාවන් බලගැන්වෙන පරිදි වඩාත් සරලව හසුරවමින්, සංවිධානය කිරීමට නවීන තාක්ෂණයේ මෙවලම් භාවිතා කිරීම වඩාත් පුළුල් කිරීමට කොමිෂන් සභාව දැනටමත් පියවර රැසක් ගෙන ඇත. මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා සජීවීකරණය කිරීම සඳහා තාක්ෂණය උපරිම අයුරින් යොදා ගැනීමට විශේෂ වැඩපිළිවෙලක් යොදා ගැනේ.

## උපාය මාර්ග

- ආයතනික සංවර්ධනය
- කාර්ය මණ්ඩල හැකියා වර්ධනය
- අරමුදල් ප්‍රවර්ධනය
- ජාලකරණය

## පරමාර්ථ

- පුරවැසියන් සහ ඡන්ද හිමියන් යන දෙපාර්ශ්වයම ඡන්දයේ බලය හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් පිළිබඳව ප්‍රමාණවත් ලෙස දැනුම්වත්ව සිටිති.
- සුදුසුකම්ලත් සියළුම පුරවැසියන් මැතිවරණවල දී බියෙන් තොරව නිදහස්ව සහ විශ්වාසයෙන් යුතුව ස්වකීය ඡන්දය ප්‍රකාශ කරති.
- ජනතා පරමාධිපත්‍ය සුරැකීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව ප්‍රමාණවත් ලෙස නෛතිකව බලගැන්වී ඇත.
- මැතිවරණ සඳහා තරග කරනු ලබන සියළුම අපේක්ෂකයන්ට සමාන හා සාධාරණ අවස්ථා පවතී.
- ස්වාධින ආයතනයක් ලෙස මැතිවරණ කොමිෂන් සභාව කෙරෙහි ඇති පුරවැසි විශ්වාසය තිරසාරව පවතී.
- සඵලතාවෙන් යුතුව ක්‍රියාත්මක වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව සියළු සම්පත්වලින් (මානව,භෞතික, මූල්‍ය) පරිපූර්ණය.
- මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීහු ස්වකීය කාර්යයන් ඵලදායීව ඉටු කරලීම පිණිස නිපුණතාවෙන් හෙබි වුවෝ වෙති.
- මැතිවරණ කොමිෂන් සභාව නවීන තාක්ෂණය භාවිතා කරමින් සඵල මැතිවරණ කළමනාකරණ ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ.

# අරමුණු

- මනාව සැලසුම් කරන ලද ඡන්දහිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- වැඩිහිටි ඡන්ද බලයේ වැදගත්කම පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම.
- මැතිවරණ ක්‍රම සහ මැතිවරණ ක්‍රියා පටිපාටි පිළිබඳ විෂය ප්‍රවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාල සම්බන්ධ කර ගැනීම.
- නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා කාන්තාවන් සහ තරුණයින් බලමුලු ගැන්වීම.
- ඡන්ද අයිතිය සහ නිසිලෙස ඡන්ද සලකුණු කිරීම පිළිබඳව ජනමාධ්‍ය තුළින් ඡන්දහිමියන් දැනුවත් කිරීම.
- නීති විධිවිධාන අනුව ඡන්ද හිමි නාමලේඛණය ප්‍රතිශෝධනය කිරීම හා යාවත්කාලීන කිරීම.
- තේරී පත් වූ නියෝජිතයන්ගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය සඳහා පුරවැසියන්ට අවශ්‍ය පහසුකම් සැලසීම.
- මැතිවරණ පැවැත්වීම.
- මැතිවරණ නිරීක්ෂකයින්ට පහසුකම් සැලසීම.
- දේශපාලන පක්ෂ පිළිගැනීම.
- නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට උපදේශන ලබාදීම.
- නව නීති ප්‍රතිසංස්කරණ පිළිබඳව ඡන්දහිමියන් දැනුවත් කිරීම.
- තරග කරනු ලබන සියලුම අපේක්ෂකයින් සඳහා සම අවස්ථා ලබාදීම.
- මැතිවරණ කොමිෂන් සභාව පිළිබඳව ඇති විශ්වසනීයත්වය පවත්වාගෙන යාම.
- මැතිවරණ කොමිෂන් සභාවේ උපාය මාර්ග සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් සම්පත් සම්පාදනය කිරීම.
- මැතිවරණ කොමිෂන් සභාවේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.
- මැතිවරණ කොමිෂන් සභාවේ ධාරිතා වර්ධනය කිරීම.
- පවත්නා මැතිවරණ කළමනාකරණ යාන්ත්‍රණය අංකිත කරණය.
- දියුණු තාක්ෂණය භාවිතා කිරීමට මැතිවරණ කොමිෂන් සභාවේ සියලුම කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- සියලූම පාර්ශ්වකරුවන් නවීන තාක්ෂණයට අනුගත කිරීම.

## 5. 1931 සිට 2024 දක්වා මැතිවරණ කොමිෂන් සභාව ක්‍රියාත්මක කරනු ලබන අණ පනත්

- **ජනාධිපතිවරණය**

- 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනත
- 1988 අංක 16 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ (සංශෝධන) පනත - 1988 මැයි මස 24
- 1988 අංක 35 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ (සංශෝධන) පනත - 1988 ඔක්තෝබර් මස 21
- 2004 අංක 14 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ (සංශෝධන) පනත - 2004 නොවැම්බර් මස 18
- 2011 අංක 28 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ (සංශෝධන) පනත - 2011 මැයි මස 25

- **පාර්ලිමේන්තු මැතිවරණ**

- 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත - 1981 ජනවාරි මස 22
- 1988 අංක 15 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත - 1988 මැයි මස 24
- 1988 අංක 29 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත - 1988 අගෝස්තු මස 16
- 1988 අංක 35 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත - 1988 ඔක්තෝම්බර් මස 21
- 1988 අංක 54 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත - 1988 දෙසැම්බර් මස 17
- 2004 අංක 14 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත - 2004 නොවැම්බර් මස 18
- 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත - 2009 ඔක්තෝම්බර් මස 16
- 2011 අංක 28 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත - 2011 මැයි මස 25

- **පළාත් සභා ඡන්ද විමසීම**

- 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත - 1988 ජනවාරි මස 27
- 1988 අංක 35 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 1988 ඔක්තෝම්බර් මස 21
- 1988 අංක 55 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 1988 දෙසැම්බර් මස 17
- 1990 අංක 29 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 1990 ජුලි මස 06
- 1993 අංක 7 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 1993 පෙබරවාරි මස 18
- 2004 අංක 5 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 2004 පෙබරවාරි මස 03
- 2004 අංක 14 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 2004 නොවැම්බර් මස 18
- 2011 අංක 28 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 2011 මැයි මස 25
- 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 2017 සැප්තැම්බර් මස 22

- **පළාත් පාලන ආයතන ඡන්ද විමසීම**

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 වන අධිකාරය)
- 1990 අංක 24 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත
- 1990 අංක 25 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත
- 2002 අංක 1 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත

- 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 2017 අගෝස්තු මස 31
- 2017 අංක 28 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත
- 2017 අංක 31 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත

- **ජනමතවිචාරණය**
  - 1981 අංක 7 දරන ජනමතවිචාරණ පනත - 1981 පෙබරවාරි මස 27
  - 1988 අංක 17 දරන ජනමතවිචාරණ (සංශෝධන) පනත - 1988 මැයි මස 24


- **ඡන්දහිමියන් ලියාපදිංචි කිරිම**
  - 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත - 1980 ඔක්තොම්බර් මස 24
  - 2017 අංක 10 දරණ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත - 2017 ජුලි මස 21
  - 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත - 2021 ඔක්තෝම්බර් මස 13

- **2023 අංක 03 දරණ මැතිවරණ වියදම් නියාමන පනත**

- **2023 අංක 21 දරණ මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත**

## 6. මැතිවරණ කොමිෂන් සභාවේ පරිපාලන සංයුතිය

මැතිවරණ කොමිෂන් සභාව ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල 26 කින් සමන්විත වේ. ඒ අනුව ස්වකීය ව්‍යවස්ථාපිත, පරිපාලන හා සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන විෂයන් ආවරණය වන පරිදි ශාඛා/ අංශ ස්ථාපිත කොට ඇති අතර එක් එක් ශාඛා/ අංශ විසින් ඉටුකළ යුතු කාර්යයන් නිශ්චිතව මෙම පරිපාලන සංයුතියට ඇතුළත්ව තිබේ.



## 7. මැතිවරණ කොමිෂන් සභාවේ එක් එක් ශාඛා හා ඒවායේ කාර්යභාරය

### I. කොමිෂන් සභා ලේකම් කාර්යාලය.

- කොමිෂන් සභාවේ පරිපාලන කාර්යයන්.
- ව්‍යවස්ථාපිත කාර්යයන් සම්බන්ධීකරණය හා මෙහෙයවීම.
- කොමිෂන් සභාවේ සාමාජිකයන් පිළිබඳ ආයතනික කටයුතු.
- මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීම, මාරු කිරීම හා නිදහස් කිරීම, මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල සේවයේ නියුතු දීප ව්‍යාප්ත සේවා හා මාණ්ඩලික නිලධාරීන් 65 දෙනෙකුගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් සහ විශ්‍රාම ගැන්වීම්වලට අදාළ කටයුතු.
- කොමිෂන් සභාවේ රැස්වීම් හා වාර්තා සකස් කිරීම.
- මාණ්ඩලික නිලධාරීන්ගේ ආයතන කටයුතු ඇතුළුව මානව සම්පත් සංවර්ධන කටයුතු.
- පාර්ලිමේන්තුව, ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය යන ආයතනයන් සමග සම්බන්ධීකරණ කටයුතු
- ස්වාධීන කොමිෂන් සභා, අමාත්‍යාංශ ඇතුළු රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය.
- මාණ්ඩලික නිලධාරීන්ගේ වාර්ෂික වත්කම් බැරකම් ප්‍රකාශ පිළිබඳ කටයුතු.
- කොමිෂන් සභාව වෙත පැවරෙන ඡන්ද විමසීම් නිදහස් හා සාධාරණ අන්දමින් පැවැත්වීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, උපදෙස් හා මගපෙන්වීම් ලබාදීම හා ඒ අනුව ක්‍රියා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

### II. ජාතික මැතිවරණ ශාඛාව

- මැතිවරණ කොමිෂන් සභාව හා මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු මැතිවරණ සහ ජනමත විචාරණ පැවැත්වීම සඳහා වූ කාර්යයන් මෙහෙයවීම.
- 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත අනුව වාර්ෂික ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය හා පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීමට අදාළ සියලු කටයුතු මෙහෙයවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 (8) ව්‍යවස්ථාව අනුව එක් එක් ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීමෙන් අනතුරුව එයට අනුරූපීව පාර්ලිමේන්තු මන්ත්‍රීධූර සංඛ්‍යාව ගණනය කිරීම සහ ඡන්දහිමි නාමලේඛන ආශ්‍රිත වෙනත් කාර්යයන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- පාර්ලිමේන්තු මන්ත්‍රී ධූර පුරප්පාඩු පිරවීමට අදාළ මූලික කටයුතු.

- ඡන්දහිමි නාමලේඛනය හා ඡන්ද විමසීම් ක්‍රියාවලිය පිළිබඳව පුරවැසියන් දැනුම්වත් කිරීම හා ඡන්දහිමියන්ගේ දිනයට අදාළ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.
- ආබාධිත ප්‍රජාව ඡන්ද විමසීම් ක්‍රියාවලියට සක්‍රීය ලෙස සම්බන්ධ කර ගැනීමට අදාළ කාර්යයන් හා ආන්තික ජන කොටස් ලියාපදිංචියට ආදළ කටයුතු

II.I. **තොරතුරු තාක්ෂණ අංශය**

- තොරතුරු තාක්ෂණ භාවිතයෙන් ආයතනයේ කටයුතු කාර්යක්ෂමව කරගැනීමටත් පාර්ශ්ව කරුවන්ට අවශ්‍ය තොරතුරු තාක්ෂණ සේවාවන් ලබා දීමටත්, තොරතුරු තාක්ෂණ අවශ්‍යතා අධ්‍යයනය, සැලසුම් කිරීම ව්‍යාපෘති වාර්තා සැකසීම හා අනුමත තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති ස්ථාපනය හා පවත්වාගෙන යෑම.
- නව තාක්ෂණික ආරක්ෂක ක්‍රමවේද යොදා ගනිමින් මැතිවරණ කොමිෂන් සභාවට අයත් තොරතුරු තාක්ෂණ පද්ධතීන් සහ උපාංග ආරක්ෂාකාරීව පවත්වාගෙන යෑම හා විගණනය කිරීම.
- නව තාක්ෂණික ආරක්ෂක ක්‍රමවේද යොදා ගනිමින් මැතිවරණ කොමිෂන් සභාවට අයත් තොරතුරු තාක්ෂණ පද්ධතීන් සහ උපාංග ආරක්ෂාකාරීව පවත්වාගෙන යෑම.
- මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය පරිපාලනය සහ තොරතුරු භාෂාත්‍රයෙන් යාවත්කාලීන කිරීම
- මැතිවරණ කොමිෂන් සභාවේ ඉ-සේවා පද්ධතිය වැඩි දියුණු කිරීම සහ මහජනතාව සහ විවිධ පාර්ශ්වකරුවන් වෙත වඩා පහසුවෙන් සේවා ලබාගැනීමට අවශ්‍ය පහසුකම් ලබා දීම.
- මධ්‍යගත ඡන්දහිමි නාමලේඛන දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම් හා පවත්වාගෙන යෑම.
- මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය පරිපාලන හා තොරතුරු, යාවත්කාලීන කිරීම, ඉ-සේවා සැපයීම.
- දත්ත මධ්‍යස්ථාන හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන යෑම
- පරිගණක ජාලය හා VPN ජාලය පවත්වාගෙන යාම.
- තොරතුරු තාක්ෂණ කටයුතු නිසි ආකාරව ඉටුකර ගැනීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් පුහුණු කිරීම.
- සමාජ ජාල තොරතුරු පද්ධති පවත්වාගෙන යාම.
- නිල ඉ තැපැල් (e-mail) ජාලය පවත්වාගෙන යාම.
- මැතිවරණ අධ්‍යාපන ද්වාරය හඳුන්වා දීම හා බහු මාධ්‍ය මඟින් මැතිවරණ අධ්‍යාපන සහභාගීත්වය වැඩි දියුණු කිරීම.
- තොරතුරු තාක්ෂණ භාවිත කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ අඩංගු කරුණු පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම සහ අදාළ තොරතුරු යාවත්කාලීන කිරීම.
- මැතිවරණ ප්‍රතිඵල සැකසීමේ කටයුතුවලට තාක්ෂණය යොදාගැනීම.

## III. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ශාඛාව

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළ කාර්යයන් හා වාර්තා පිළියෙල කිරීම.
- පළාත් සභා ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළ කාර්යයන් හා වාර්තා පිළියෙල කිරීම.
- පළාත් පාලන ආයතන සභික ධූර පුරප්පාඩුව පිරවීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු හා පළාත් සභා මන්ත්‍රී ධූර පුරප්පාඩු පිරවීමට අදාළ කාර්යයන්.
- පළාත් පාලන ආයතනවල කොට්ඨාස සීමා නිර්ණය පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනතේ සංශෝධනවලට අදාළ කාර්යයන්
- විදේශීය මැතිවරණ කළමනාකරණ ආයතන සම්බන්ධීකරණය
- දේශීය මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සම්බන්ධීකරණය
- රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය
- ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන හා ආන්තික ජන කොටස් ඡන්ද විමසීම් ක්‍රියාවලියට සක්‍රීය ලෙස දායක කර ගැනීමට අදාළ කාර්යයන්

### III.I. විශේෂ ව්‍යාපෘති අංශය

- රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය.
- මහජන නියෝජිත ආයතන සඳහා කාන්තා නියෝජනය ශක්තිමත් කිරීම හා සම්බන්ධ දැනුම්වත් කිරීම.
- තරුණ පාර්ශ්වකාර කණ්ඩායම් සම්බන්ධීකරණය සහ දැනුම්වත් කිරීම.
- ආබාධිත පාර්ශ්වකාර කණ්ඩායම් සම්බන්ධීකරණය සහ දැනුම්වත් කිරීම.
- මහජන පාර්ශ්වකාර කණ්ඩායම් සම්බන්ධීකරණය සහ දැනුම්වත් කිරීම.
- සමාජ මාධ්‍ය සම්බන්ධීකරණය හා ඊට අදාළ කාර්යයන්.
- මැතිවරණ කොමිෂන් සභාවට අදාළ ජාත්‍යන්තර දින සැමරුම් උත්සව සංවිධානය.

## IV. පාලන ශාඛාව

- මැතිවරණ කොමිෂන් සභාවේ භෞතික සම්පත් කළමනාකරණය.
- වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම.
- නිලධාරීන්ගේ විදේශ නිල සම්මන්ත්‍රණ හා විදේශ පුහුණු වැඩසටහන්වලට අදාළ කාර්යයන් සිදුකිරීම.
- නිර්මාණාත්මක ප්‍රවේශයක් තුළින් සැලසුම් පර්යේෂණ හා සංවර්ධනය සඳහා දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමේ පුහුණු සැලසුම් සකස් කිරීම.
- කාර්ය මණ්ඩලයේ දේශීය පුහුණුවීම් සහ ධාරිතා වර්ධනයට සම්බන්ධ කාර්යයන්.
- දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල සුබසාධක කටයුතු අධීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය.
- මාණ්ඩලික නිලධාරීන්ගේ සාකච්ඡා පැවැත්වීම අදාළ කටයුතු සම්බන්ධීකරණය.

- ගොඩනැගිලි ඉදිකිරීම හා අළුත්වැඩියා කටයුතු.
- ස්ත්‍රී - පුරුෂ සමාජභාවය ක්‍රියාත්මක කිරීම හා ඡන්ද විමසීම් ක්‍රියවලියෙහි දී කාන්තා නියෝජනය ශක්තිමත් කිරීමට අදාළ කාර්යයන්.
- දෛනික තැපැලට අදාළ කාර්යයන්.
- දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයවල මාණ්ඩලික නිලධාරීන්ට අදාළ පරිපාලන කටයුතු සම්බන්ධීකරණය.
- මැතිවරණ කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලැස්මට අදාළව පාලන අංශය වෙත පැවරෙන කාර්යයන් ඉටු කිරීම.

## IV.I. ආයතන අංශය

- මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි මාණ්ඩලික නොවන සියලුම නිලධාරීන්ගේ හා සේවකයින්ගේ පෞද්ගලික ලිපි ගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- ආරක්ෂක හා පවිත්‍රතා සේවාවන්ට අදාළ කටයුතු
- කාර්යාල නිලධාරීන්ගේ සුභ සාධන කටයුතු
- මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, ස්ථාන මාරු හා විශ්‍රාම ගැනීම්වලට අදාළ කටයුතු
- නිවාඩු කළමනාකරණය

## IV.II. ප්‍රවාහන අංශය

- කොමිෂන් සභාවේ රථ වාහන පාලනය, නඩත්තු කිරීම හා රාජකාරී කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම

## IV.III. ප්‍රසම්පාදන හා වත්කම් කළමනාකරණ අංශය

- ප්‍රසම්පාදන කටයුතු
- ගබඩා කළමනාකරණය
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය
- වත්කම් කළමනාකරණය
- සන්නිවේදන උපකරණ ඇතුළු යන්ත්‍ර හා උපකරණ නඩත්තුව
- දුරකථන හා ජල බිල්පත් පියවීම හා අනෙකුත් අදාළ කටයුතු

V. මූල්‍ය ශාඛාව

- ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල මූල්‍ය කටයුතු අධීක්ෂණය හා ගිණුම් උපදෙස් ලබාදීම.
- ආදායම් එකතු කිරීම හා ගිණුම්ගත කිරීම.
- සියලුම ගෙවීම් කටයුතු හා ගෙවීම් ගිණුම් තැබීම.
- නිල බැංකු ගිණුම් මෙහෙයවීම.
- වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් “B” පිළිබඳ කටයුතු
- සාමාන්‍ය පරිපාලන හා මැතිවරණ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සහ අක්මුදල් පාලනය
- මැතිවරණ වියදම් ඇස්තමේන්තු/ වියදම් වාර්තා පිළියෙල කිරීම.
- වාර්ෂික විසර්ජන ගිණුම්/ අවසන් ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ කටයුතු
- පොදු තැන්පතු ගිණුම් පිළිබඳ කටයුතු
- ස්ථාවර වත්කම් ගිණුම් තැබීම හා පාලනයට අදාළ කටයුතු
- වැටුප් ගෙවීමේ වැඩසටහන (Payroll) පිළිබඳ කටයුතු
- සිගාස් වැඩසටහන (CIGAS) පිළිබඳ කටයුතු
- ITMIS වැඩසටහන පිළිබඳ කටයුතු
- EMS වැඩසටහන පිළිබඳ කටයුතු
- විගණන විමසීම්වලට පිළිතුරු සැපයීම, අයවැය කාරක සහා අවස්ථා කටයුතු හා රාජ්‍ය ගිණුම් කාරක සභාව සමඟ කටයුතු කිරීම.
- ගිණුම් හා මූල්‍ය පාලන කටයුතු පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීම.
- මැතිවරණ පැවැත්වෙන කාලසීමාවලදී සියලුම රාජ්‍ය ආයතන වෙත ගෙවීම් ප්‍රතිපූර්ණය සිදු කිරීම.

VI. **නීති විමර්ශන හා සැලසුම් ශාඛාව**

- මැතිවරණ කොමිෂන් සභාවේ නීති කටයුතු සම්බන්ධව ක්‍රියා කිරීම.
- මැතිවරණ නීති සම්පාදනය පිළිබඳව කාර්යයන් සම්බන්ධීකරණය.
- දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම හා ඒවා අධීක්ෂණය කිරීම සම්බන්ධ කටයුතුග
- පිළිගත් දේශපාලන පක්ෂ ලැයිස්තුව වාර්ෂිකව සකස් කිරීම සහ එම පක්ෂවලට අදාළ සංශෝධන යාවත්කාලීන කිරීම.
- පිළිගත් දේශපාලන පක්ෂවල නිලධාරී මණ්ඩලයේ වත්කම් හා බැරකම් ප්‍රකාශ වාර්ෂිකව ලබා ගැනීම හා වාර්ෂික ගිණුම් වාර්තා ලබා ගැනීම.
- පක්ෂ ලේකම්වරුන්ගේ රැස්වීම් පැවැත්වීමට අදාළ කාර්යයන් සංවිධානය කිරීම.
- පිළිගත් දේශපාලන පක්ෂවලට අදාළ පක්ෂ ලකුණු හා පක්ෂවලට වෙන්කර නොමැති ලකුණු පනතේ ප්‍රතිපාදන අනුව ගැසට් නිවේදන මගින් පළකිරීම.

- මැතිවරණ ආරවුල් කළමනාකරණයට අදාළ කටයුතු.
- 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත ක්‍රියාත්මක කිරීම.
- තරුණ ප්‍රජාව මැතිවරණ ක්‍රියාවලියට සක්‍රියව දායක කර ගැනීමට අදාළ කාර්යයන්
- තොරතුරු පනතට අදාළ කාර්යයන්
- ඡන්දහිමියන් ලියාපදිංචිය සම්බන්ධව මතුවන ගැටළු සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 (ඇ) වගන්තියට අනුව ඡන්ද අයිතිය තහවුරු කිරීම.
- සමාජ මාධ්‍ය සම්බන්ධ ක්‍රියාකාරකම්.
- උපාය මාර්ගික සැලසුම සකස් කිරීම හා ප්‍රගති සමාලෝචන කටයුතු.
- වාර්ෂික අයවැය ප්‍රගති වාර්තාව සකස් කිරීම.
- මැතිවරණ කොමිෂන් සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ප්‍රගති සමාලෝචන කටයුතු.
- කොමිෂන් සභාවේ කාර්යයන්ට අදාළ පර්යේෂණ පැවැත්වීම, පසුවිපරම් සිදු කිරීම තොරතුරු හා දත්ත කළමනාකරණය කිරීම.
- දැනුම් කළමනාකරණ ඒකකය, ලේඛනාගාරය හා ප්‍රකාශන නිකුත් කිරීමට අදාළ කාර්යයන් හා ප්‍රකාශන නිකුත් කරන අලෙවි කවුළුව පවත්වාගෙන යාම.
- මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රකාශන/වාර සඟරා නිකුත් කිරීමට අදාළ කටයුතු.
- මාධ්‍ය සම්බන්ධීකරණය.

## VII. අභ්‍යන්තර විගණන ශාඛාව

- මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ එම අවදානම් ක්ෂේත්‍රවලට අදාළව අභ්‍යන්තර විගණන සිදුකිරීම හා වාර්තා සකස් කොට ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තාවලින් හෙළිදරව් කරන ලද කරුණුවල නිවැරදි කිරීම් පිළිබඳ විමසිලිමත්වීම හා පසුවිපරම
- මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් හා පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රම තක්සේරු කිරීම හා ඉන් පැන නගින අඩුපාඩු හා දුර්වලතා වැළැක්වීම.
- අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත්භාවය හා ප්‍රමාණාත්මකභාවය පිළිබඳ අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් සිදු කොට වඩාත් ඵලදායී අයුරින් පවත්වා ගනිමින් රාජ්‍ය සම්පත් මනා කළමනාකරණයකට ලක්කිරීමට කටයුතු කිරීම.
- ඡන්ද විමසීම් හා මැතිවරණ පවත්වන කාල සීමාවේ දී මැතිවරණ නීති රීති උල්ලංඝනය කිරීම් විමර්ශනය කිරීමට අදාළව මැතිවරණ කොමිෂන් සභාව විසින් පවරනු ලබන විශේෂ රාජකාරී.
- ඡන්ද විමසීම් කාලසීමාවේ දී ජාතික මැතිවරණ පැමිණිලි මධ්‍යස්ථානය හා ඒකාබද්ධව විමර්ශන කටයුතු සිදු කිරීම.

## VIII. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල

- වාර්ෂික ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ දිස්ත්‍රික් මට්ටමේ කටයුතු සිදු කිරීම.
- ඡන්දහිමි නාමලේඛන උපුටන නිකුත් කිරීම.
- ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළ කාර්යයන් සංවිධානය කිරීම හා ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළ කටයුතු.
- පළාත් පාලන ආයතනවල සභික ධුර පුරප්පාඩු පිරවීමට අදාළ කටයුතු.
- ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා/ තොරතුරු ලබා දීම.
- ප්‍රජාතන්ත්‍රවාදය/ සර්වජන ඡන්ද බලය/ ශිෂ්‍ය හා යොවුන් පාර්ලිමේන්තුව/ කාන්තා, තරුණ, ආබාධිත කණ්ඩායම් සම්බන්ධව දැනුම්වත් කිරීම් සංවිධානය කිරීම, අවශ්‍ය අවස්ථාවල දී ඒ වෙනුවෙන් වෙනත් ආයතන වෙත සම්පත්දායකත්වය ලබා දීම සහ උපාය මාර්ග සැලැස්මට අදාළ දිස්ත්‍රික් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- අධිකරණ නියෝග මත අධිකරණ කටයුතු සඳහා අවශ්‍ය ලේඛන ඉදිරිපත් කිරීම.
- නඩු කටයුතු සම්බන්ධව ප්‍රධාන කාර්යාලයට තොරතුරු ලබාදීම.
- දිස්ත්‍රික්කය තුළ තොරතුරු පනතේ තොරතුරු නිලධාරීයා ලෙස කටයුතු කිරීම.

## 8. මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

මැතිවරණ කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලය, පහත සඳහන් තනතුරුධාරීන්ගෙන් සමන්විත වේ. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ඇතුළු සාමාජිකයින් පස් දෙනා හැරුණු විට මැතිවරණ කොමසාරිස් ජනරාල්, ලේකම් ඇතුළු මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (ශ්‍රී ලං.ප.සේ.) නිලධාරීන්, ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ (ශ්‍රී ලං.ග.සේ.) නිලධාරීන්, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ (ශ්‍රී ලං.තො.ස.තා.සේ.) නිලධාරීන්, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ (ශ්‍රී ලං.ක්‍ර.සේ.) නිලධාරීන්, නීති අධ්‍යක්ෂ හා නීති නිලධාරීන්, භාෂා පරිවර්තක නිලධාරීන්, සම්බන්ධීකරණ ලේකම්, රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි (ක.සේ.නි. අධි ශ්‍රේණියේ) නිලධාරීන් හා මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලයේ කළමනාකරණ සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන්, තොරතුරු තාක්ෂණ සහකාර නිලධාරීන්, ලේඛන සහකාරවරුන්, කාර්යාල කාර්ය සහයකයින් හා රියදුරන් ඇතුළත් වේ. ඒ අනුව 2024.12.31 දිනට මැතිවරණ කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2024.12.31 දිනට සේවයේ නියුතු සංඛ්‍යාව |
|---|---|---|
| මාණ්ඩලික නිලධාරීන් (ශ්‍රී ලං.ප.සේ., ශ්‍රී ලං.ග.සේ., ශ්‍රී ලං.තො.ස.තා.සේ., ශ්‍රී ලං.ක්‍ර.සේ., නීති අධ්‍යක්ෂ, නීති නිලධාරි, සම්බන්ධීකරණ ලේකම්, භාෂා පරිවර්තක, ක.සේ.නි අධි ශ්‍රේණියේ නිලධාරීන් ඇතුළුව) | 77 | 60 |
| කළමනාකරණ සේවා නිලධාරි | 390 | 365 |
| සංවර්ධන නිලධාරි | 67 | 57 |
| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 14 | 10 |
| ලේඛන සහකාර | 51 | 38 |
| පිළිගැනීමේ නිලධාරි | 01 | 01 |
| කාර්මික නිලධාරි (සිවිල්) | 01 | - |
| කාර්යාල සේවක සේවය | 126 | 101 |
| කාර්යාල සේවක සේවය - රා.ප.ච.25/2014 | 31 | 31 |
| රියදුරු | 52 | 48 |
| රිය ශෝධක | 01 | - |
| විදුලි කාර්මික | 01 | - |
| ජලනල කාර්මික | 01 | - |
| **එකතුව** | **813** | **711** |

## II කොටස

# ප්‍රගතිය 2024

## 1. 2022 - 2025 සහභාගීත්ව උපාය මාර්ග සැලැස්ම

මැතිවරණ කොමිෂන් සභාවේ 2022-2025 කාලය සඳහා සකස් කරන ලද සහභාගීත්ව උපාය මාර්ග සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කොට ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

## 2. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

මැතිවරණ කොමිෂන් සභාවේ එක් එක් අංශ විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව කාර්තුමය වශයෙන් ප්‍රගතිය සමාලෝචනය කොට ප්‍රගති වාර්තා සකස් කිරීම හා එම වාර්තා මුදල් අමාත්‍යාංශයට යොමු කිරීම කරනු ලබයි. මෙම වර්ෂයේ දී ද ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම්වල ප්‍රගතිය විමර්ශනය කිරීම හා නියමිත ඉලක්ක සපුරා ගැනිමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

## 3. මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම්

මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යය හා කර්තව්‍යවලට අදාළව ඉදිරිපත් කරනු ලබන කොමිෂන් පත්‍රිකා සාකච්ඡා කිරීම හා තීරණ ගැනීම සහ වෙනත් නිර්දේශ අනුව කොමිෂන් සභා රැස්වීම් අවශ්‍යතාව අනුව පවත්වනු ලැබේ. මේ අනුව 2024 වර්ෂයේ පළමු කාර්තුව තුළ රැස්වීම් වාර 11 ක් ද දෙවන කාර්තුව තුළ රැස්වීම් වාර 10 ක් ද තෙවන කාර්තුව තුළ රැස්වීම් වාර 16 ක් ද සිව්වන කාර්තුව තුළ රැස්වීම් වාර 11 ක් ද වශයෙන් 2024 වර්ෂය තුළ රැස්වීම් වාර 48 ක් පවත්වා ඇත.

### 3.1 කොමිෂන් සභාව සමග පැවැති විශේෂ සාකච්ඡා

පෙර මැතිවරණ කොමිෂන් සභාව විසින් කල් තබන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව පවරන ලද නඩු සඳහා අවශ්‍ය බාහිර නීතිඥ සහාය ලබා ගැනීම පිණිස නීතිපති දෙපාර්තමේන්තුව හා බාහිර නීතිඥවරුන් සමග ද විශේෂ සාකච්ඡා කීප අවස්ථාවකදීම සිදු කළ යුතු විය එමෙන්ම ඉහත කී නඩුවලට අදාළව දෙන ලද තීරණයට අනුව ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා අදාළ පාර්ශ්ව සමග විටින්විට විශේෂ සාකච්ඡා පැවැත්වීමට ක්‍රියා කරන ලදී.

මේ අතරතුර ජනාධිපතිවරණය නියමිත කාලසීමාව තුළ පැවැත්වීමට ක්‍රියා කිරීමට සිදුවීම නිසා ඊට අදාළව විශේෂ රැස්වීම්, සාකච්ඡා කොමිෂන් සභාව විසින් පවත්වන ලදී. මෙහිදී දේශපාලන පක්ෂ, ජන මාධ්‍ය ආයතන, අපේක්ෂකයන් සමග පවත්වන ලද සාකච්ඡාවලට අමතරව, නාමයෝජනා භාර ගැනීම ඇතුළු මැතිවරණ ක්‍රියාවලිය නිසි පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය පාර්ශ්ව සමග සාකච්ඡා පවත්වන ලද අතර කොමිෂන් සභාවේ විශේෂ රැස්වීම් පැවැත්වීමට ද ක්‍රියා කරන ලදී.

ජනාධිපතිවරණය අවසන් වූ වහාම පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට ක්‍රියා කළ යුතුවීම නිසා ඒ සඳහා ද කොමිෂන් සභාව විසින් රැස්වීම්, සාකච්ඡා හා සම්මන්ත්‍රණ අවශ්‍ය පරිදි යොදා ගන්නා ලදී. නියමිත පරිදි විධිමත්ව, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් දෙකක් ඉතා කෙටි කාලයක් තුළ පැවැත්වීමට හැකිවීමට කොමිෂන් සභාව විසින් අදාළ පාර්ශ්ව සමග පවත්වන ලද සාකච්ඡා හා රැස්වීම් බෙහෙවින් ඉවහල් විය.

යුරෝපා සංගමයේ දූත මණ්ඩල ප්‍රධානී, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නේවාසික නියෝජිත, ප්‍රංශ තානාපති, බ්‍රිතාන්‍ය මහ කොමසාරිස්වරයා, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නේවාසික සම්බන්ධීකාරක, ඇමෙරිකා එක්සත් ජනපද තානාපති, යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂන කණ්ඩායම, පොදු රාජ්‍ය මණ්ඩලීය මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම , නෙදර්ලන්ත තානාපති, රුසියානු සමූහාණ්ඩුවේ තානාපති ඇතුළු විදේශ තානාපතිවරුන් සහ දූත මණ්ඩල ප්‍රධානීන් සහ නියෝජිතයන් මෙම කාල සීමාව තුළ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ මැතිවරණ කොමිසම මැතිවරණ ලේකම් කාර්යාලයේ දී අවස්තාවන් කිහිපයක දී මුණ ගැසී සාකච්ඡා කරන ලදී.

## 4. මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ නීති ප්‍රතිසංස්කරණ සඳහා සිදු කර ඇති කටයුතු

4.1. මැතිවරණ නීති සංශෝධනය සඳහා හිටපු අගවිනිසුරුවරයකු වන ජනාධිපති නිතිඥ ප්‍රියසාත් ඩෙප් මහතාගේ ප්‍රධානත්වයෙන් පත් කළ කමිටු වාර්තාවේ නිර්දේශ සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාවේ නිරීක්ෂණ යොමු කර ඇත.

4.2. පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා විසින් 2022 ජුලි මස 06 වන දින පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කරන ලද 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ අදහස් හා යෝජනා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් කාර්යාංශය වෙත යොමු කරන ලදී.

4.3. නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කර ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් කරන ලද මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතට අදාළව මැතිවරණ කොමිෂන් සභාවේ යෝජනා ද ඉදිරිපත් කළ පසු ඒ පිළිබඳව අවධානය යොමුකොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස ජනාධිපති ලේකම් වෙත දන්වා ලිපි යොමු කරන ලදී. එසේ වුවද ජනාධිපතිවරයා විසින් පත් කරන ලද මැතිවරණ නීති ප්‍රතිසංස්කරණය පිළිබඳ කොමිෂන් සභාවේ නිර්දේශ ජනාධිපතිවරණය හේතු කොට ගෙන ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එබැවින් මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති යෝජනා පිළිබඳව අවධානය යොමුකරමින් මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනාධිපති ලේකම් වෙත ලිපි යොමු කර ඇත.

4.4. “උචිත ලකුණින් ” සලකුණු කිරීමේ පියවර සියලු මැතිවරණ පනත්වලින් ඉවත් කිරීම සඳහා සකස් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයක් යොමු කරන ලදී. ඒ සඳහා 2024.03.26 දින අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇති අතර, එම පනත් කෙටුම්පතෙහි සඳහන් යෝජනා සම්බන්ධයෙන් ලැබී ඇති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව ඉදිරි කටයුතු සිදු කර ඇත.

4.5. ඡන්ද විමසීම් පනත්වල පවත්නා ඇප තැන්පත් මුදල් විධිමත් කිරීම සඳහා වූ නීති සංශෝධනය කිරීම සම්බන්ධව සකස්කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් යොමු කළ අතර, 2024.04.26 වන දින ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. නීතිපතිවරයාගේ විමසීම මත ඇප මුදල් විධිමත් කිරීම සම්බන්ධව සාධාරණීකරණයක් අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දී ඇත.

## 5. මැතිවරණ කාර්යය සඳහා දේශපාලන පක්ෂ පිළිගැනීම

රටක පාලනය සඳහා නියෝජිතයන් තෝරා ගැනීමට මෙන්ම දේශපාලන පරිසරය හුරු පුරුදු කිරීමට දේශපාලන පක්ෂ ක්‍රමය සිදුකරන්නේ විශාල කාර්ය භාරයකි. එම නිසා නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය තුළ දේශපාලන පක්ෂ වල භූමිකාව ඉතා වැදගත් වේ.දේශපාලන පක්ෂයක් යනු කිසියම් ප්‍රතිපත්තියක් මත රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා උත්සාහ කරන දේශපාලන සංවිධානයකි. මෙම දේශපාලන ක්‍රියාකාරී සංවිධාන මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂ ලෙස මැතිවරණ කොමිෂන් සභාවේ ලියාපදිංචි කිරීමේ නෛතික විධිවිධාන 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7වන වගන්තියේ දක්වා ඇත.

ඒ අනුව යම් දේශපාලන ක්‍රියාකාරී සංවිධානයක් මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස

සලකුණු ලැබීමට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසට දන්වමින් සෑම වර්ෂයකම ජනවාරි මාසයේ 31 දිනට ප්‍රථම ප්‍රසිද්ධ දැන්වීමක් මැතිවරණ කොමිෂන් සභාව විසින් පළ කරනු ලැබේ. අදාළ ක්‍රියාකාරී සංවිධානය එම දැන්වීමේ සඳහන් නියමිත කාලය තුළ දී තම ඉල්ලීම ඉදිරිපත්කළ යුතු අතර එම කාල සීමාවේ කුමන හෝ මැතිවරණයක් සඳහා දින ප්‍රකාශ කර ඇත්නම් , මෙම ක්‍රියාවලිය එම මැතිවරණ කාල සීමාව අවසන් වී දින 30ක් ගත වන තෙක් අත්හිටුවනු ලැබේ. ඒ අනුව 2023.01.04 දින පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ප්‍රකාශයට පත් කළ බැවින් සහ එය 2024.01.01 වන විටත් එකී නාමයෝජනා බලාත්මකව පවත්නා හෙයින් පළාත් පාලන ඡන්ද විමසීම පවත්වා අවසන් වී දින 30ක් ගත වන තෙක් දේශපාලන පක්ෂ පිළිගැනීමට අයදුම්පත් කැඳවීමක් සිදු නොවේ.

දේශපාලන ක්‍රියාකාරී සංවිධානයක් පිළිගත් දේශපාලන පක්ෂ ලෙස සලකනු ලැබීමට නම් මැතිවරණ කොමිෂන් සභාව වෙත අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර එම අයදුම්පත සමග, මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඡන්ද ලකුණු අතරින් තමන් තෝරා ගන්නා ලකුණක්, පක්ෂ ව්‍යවස්ථාව, අනිවාර්යයෙන්ම එක් කාන්තා නියෝජිතයෙක් හෝ ප්‍රධාන තනතුරකට ඇතුළත් කරන ලද පක්ෂ නිලධාරී ලැයිස්තුව, පක්ෂයේ පසුගිය වසර හතරේ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශ, පක්ෂයේ තත්කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශය යන තොරතුරු සමග මෙම ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ දිනයට අවම වශයෙන් අවුරුදු හතරක කාලයකට පෙරාතුව සිට ක්‍රියාකාරීව දේශපාලන කටයුතු වල නියැලී සිටි බවට හෝ පක්ෂය නියෝජනය කරමින් තරඟ වැදුණු අපේක්ෂකයන් දෙදෙනෙකු අතරින් අවම වශයෙන් එක් අපේක්ෂකයකු එම ඉල්ලීම් ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුව පවත්වන ලද පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී ජයග්‍රහණය කර ඇති බව හෝ විවිධ පළාත් සභා පහකට පක්ෂය විසින් නම් කරන ලද අවම වශයෙන් අපේක්ෂකයන් පස් දෙනෙකු අතරින් තිදෙනෙකු මෙම ඉල්ලීම් ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුව පවත්වන ලද පළාත් සභා ඡන්ද විමසීමේ දී දී ජයග්‍රහණය කර ඇති බව යන තොරතුරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර, කොමිෂන් සභාව ඒ සම්බන්ධයෙන් සෑහීමකට පත්විය යුතු ය.

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(4)(ආ) වගන්තියට අනුකූලව මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂවල නම් ඇතුළත් ලයිස්තුවක් අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරනු ඇති අතර 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ කාර්යයන් සඳහා අති විශෂ ගැසට් පත්‍රය මඟින් "දේශපාලන පක්ෂ වෙත වෙන් කර දී ඇති ලකුණු" සහ "දේශපාලන පක්ෂ සඳහා වෙන් කර දී නොමැති ලකුණු" ප්‍රකාශයට පත් කරනු ඇත. ඒ අනුව 2024 ජනාධිපතිවරණය සඳහා පිළිගත් දේශපාලන පක්ෂවල නම් ඇතුළත් ලැයිස්තුවක් 2024.07.29 දිනැතිව අංක 2395/08 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති අතර, 2024.07.29 දිනැතිව අංක 2395/07 දරන ගැසට් පත්‍රය මඟින් පිළිගත් දේශපාලන පක්ෂ ලකුණු ඉදිරිපත් කර ඇත. එමෙන්ම 2024.11.14 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා 2024.10.04 දිනැතිව අංක 2404/64 ට අනුව පිළිගත් දේශපාලන පක්ෂ සලකුණු සහ 2024.10.04 දිනැතිව අංක 2404/63 අනුව පිළිගත් දේශපාලන පක්ෂවල නම් ඉදිරිපත් කර ඇත.

2024.12.31 දින වන විට මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගත් දේශපාලන පක්ෂ ලැයිස්තුව පහත දක්වා ඇත.

1. අකිල ඉලංකෙයි තමිල් කොංග්‍රස්
2. අඛිල ඉලඞකෙ ද්‍රවිඩ මහාසභා
3. අපේ ජනබල පක්ෂය
4. අභිනව නිවහල් පෙරමුණ
5. අරුණළු ජනතා පෙරමුණ
6. අහිල ඉලංගෙයි මහජන කොංග්‍රසය
7. ඉලංකෙයි තමිල් අරසු කච්චි
8. ඊරෝස් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
9. ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
10. ඊලාම් ජනතා විප්ලවවාදී විමුක්ති පෙරමුණ

11. එක්සත් ජනරජ පෙරමුණ
12. එක්සත් ජාතික නිදහස් පෙරමුණ
13. එක්සත් ජාතික පක්ෂය
14. එක්සත් ජාතික සන්ධානය
15. එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය
16. එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී හඬ
17. එක්සත් මහජන පක්ෂය
18. එක්සත් වාමාංශික පෙරමුණ
19. එක්සත් සමාජවාදී පක්ෂය
20. එක්සත් සාම සන්ධානය
21. කඳුරට ජනතා පෙරමුණ
22. කම්කරු ජාතික පෙරමුණ
23. ජනතා විමුක්ති පෙරමුණ
24. ජනඅරගල සංධානය
25. ජනතා සේවක පක්ෂය
26. ජනනායක තමිල් තේසිය කූට්ටනි
27. ජනසෙත පෙරමුණ
28. ජාතික කොංග්‍රසය
29. ජාතික ජන බලවේගය
30. ජාතික ජනතා පක්ෂය
31. ජාතික නිදහස් පෙරමුණ
32. ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
33. ජාතික සංවර්ධන පෙරමුණ
34. ජාතික සමගි පෙරමුණ
35. තමිල් මක්කල් කූට්ටනි
36. තමිල් මක්කල් විඩුදලෙප් පුළිකල්
37. දමිල ප්‍රගතිශීලි සන්ධානය
38. දෙමළ සමාජ ප්‍රජාතන්ත්‍ර පක්‍ෂය
39. දෙවන පරපුර
40. දේශප්‍රේමී ජන බලවේගය
41. දේශ විමුක්ති ජනතා පක්‍ෂය
42. ද්‍රවිඩ ඊලාම් විමුක්ති සංවිධානය
43. ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ
44. නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
45. නව ප්‍රජාතන්ත්‍රවාදී මාක්ස් ලෙනින් වාදී පක්ෂය
46. නව ලංකා නිදහස් පක්ෂය
47. නව සමසමාජ පක්ෂය
48. නව සිහළ උරුමය
49. නිදහස් ජනතා පෙරමුණ
50. පිවිතුරු හෙළ උරුමය
51. පෙරටුගාමී සමාජවාදී පක්ෂය
52. පොදුජන එක්සත් නිදහස් සන්ධානය
53. පොදුජන එක්සත් පෙරමුණ
54. ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ
55. ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ
56. ප්‍රජාතන්ත්‍රවාදී ජනතා විමුක්ති පෙරමුණ
57. ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය
58. ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
59. ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ
60. මහජන එක්සත් පෙරමුණ
61. යහපාලනය සඳහා වූ ජාතික පෙරමුණ
62. ලංකා කම්කරු කොංග්‍රසය (දේශපාලන අංශය)
63. ලංකා ජනතා පක්ෂය
64. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
65. ශ්‍රී ලංකා කම්කරු පක්ෂය
66. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
67. ශ්‍රී ලංකා මහජන පක්ෂය
68. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය
69. ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය
70. ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
71. ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය
72. සමගි ජන බලවේගය
73. සමබිම පක්ෂය
74. සමාජවාදී සමානතා පක්ෂය
75. සර්වජන බලය

**ලේකම් ධුරය සම්බන්ධ ගැටළු පවතින පිළිගත් දේශපාලන පක්ෂ**

76. ඊලවර් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
77. එක්සත් ජනතා නිදහස් සන්ධානය
78. එක්සත් ලංකා පොදුජන පක්ෂය
79. එක්සත් ලංකා මහා සභා පක්ෂය
80. ලංකා සමසමාජ පක්ෂය
81. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
82. ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ
83. සිංහලදීප ජාතික පෙරමුණ

## 6. ඡන්ද හිමියන් ලියාපදිංචිය

සුදුසුකම් සැපිරූ සියලු පුරවැසියන්ට ජාතිය, ආගම, භාෂාව, වර්ගය, කුලය, අධ්‍යාපන මට්ටම, දේපළ හිමිකම, උපත, උපන් ස්ථානය, වත්පොහොසත්කම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආදී කිසිදු විශේෂත්වයකින් තොරව රටෙහි

පාලන බලයට හවුල්වීමේ අයිතිය හා ඒ සඳහා නියෝජිතයින් තෝරා පත්කර ගැනීමට ඇති අයිතිය ලබාගත හැකි වනුයේ සර්වජන ඡන්ද බලය මඟිනි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන ව්‍යවස්ථාව ප්‍රකාරව සර්වජන ඡන්ද බලය සහතික කර ඇත. පරමාධිපත්‍ය ජනතාව සතු බවත්, අන්සතු කළ නොහැකි බවත්, පැවරිය නොහැකි බවත්, එකී පරමාධිපත්‍ය යන්නට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය යන අංග ඇතුළත් වන බවත් එහි සඳහන් වේ.

ඒ අනුව රටේ පුරවැසියන්ට ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ඡන්ද විමසීමක දී, පාර්ලිමේන්තු මහ මැතිවරණයක දී, ජනමත විචාරණයක දී, පළාත් සභා ඡන්ද විමසීමක දී හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක දී තම ඡන්ද බලය ක්‍රියාත්මක කළ හැකිය. ඉහත සඳහන් ඡන්ද විමසීම්වල දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පුරවැසියන් අදාළ ඡන්ද විමසීමේ දී වලංගුව පවත්නා ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිටීම අනිවාර්ය වේ.

මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම කටයුතු සිදුකරනු ලබනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා 2021 **අංක** 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ දැක්වෙන විධිවිධාන අනුව වේ.

### 6.1. ඡන්දහිමියෙකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය කරනු ලබන මූලික සුදුසුකම්;

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන දිනය වන පෙබරවාරි මස 01 වන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම. ( ඒ අනුව 2024 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන්නේ 2006.01.31 හෝ එදිනට පෙර උපන් තැනැත්තන්ය.)
- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචියට ඉල්ලුම් කරන ලිපිනයේ සුදුසුකම් ලබන දිනයට සාමාන්‍ය පදිංචිය තිබීම.

### 6.2. ඡන්දහිමියෙකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා නුසුදුසුකම්;

- බල පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් බවට අධිකරණය මඟින් තීරණය වී තිබීම.
- අවුරුදු 02 කට නොඅඩු කාලයක් බන්ධනාගාරගත කිරීමකට යටත් කළ හැකි වරදකට අධිකරණය මඟින් වරදකරුවකු වී මාස 06 ක් හෝ ඊට වැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ ගතවූ සත් අවුරුදු කාලය තුළ ඒ දඬුවම සම්පූර්ණයෙන්ම විඳ සිටීම හෝ මරණ දණ්ඩනයට යටත්ව සිටීම.
- අල්ලස් චෝදනාවකට වරදකරු වී අවුරුදු 07ක කාලයක් ගත වී නොතිබීම.
- මැතිවරණ නීති උල්ලංඝනය කිරීම හේතුකොට ගෙන අධිකරණය විසින් වරදකරුවකු කර තිබීම.
- මහජන ආයතන (දූෂණ වැළැක්වීමේ) ආඥා පනත යටතේ වරදකරුවකු වී තිබීම.

ඉහත සඳහන් නුසුදුසුකම් ඇතුළුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාව යටතේ සඳහන් ඡන්ද බලය අහිමිවීමේ නුසුදුසුකම්වලට යටත් නොවූ තැනැත්තෙක් විය යුතු ය.

## 7. 2021 අංක 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

මෙම සංශෝධන පනතේ ප්‍රධාන අරමුණ වයස අවුරුදු 18 සම්පූර්ණ කළ විගස පරිපූරක ඡන්දහිමි නාමලේඛන මඟින් ඡන්ද බලය ලබා දීම සහ ඡන්දහිමියන් ගණන් ගන්නා සුදුසුකම් ලැබීමේ දිනය සංශෝධනය කිරීම විය. 2022 වර්ෂයේ මුල්වරට ක්‍රියාත්මක වූ මෙම

සංශෝධන පනතට අනුකූලව 2024 වර්ෂයේදී තෙවන වරටත් ප්‍රතිශෝධන කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

## 7.1. 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතට (ප්‍රධාන ප්‍රඥප්තියට) සිදු කළ මූලික සංශෝධන සහ ඊට අදාළ සුවිශේෂී කරුණු

- මෙම පනත 2021 ඔක්තෝම්බර් මස 13 දින සහතික කරන ලදී.
- මෙම සංශෝධිත පනත 2022 පෙබරවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වේ.
- ඡන්දහිමියෙකු ලෙස ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා සුදුසු වීම පිණිස යම් තැනැත්තෙකුගේ අටළොස්විය සම්පූර්ණ කර තිබිය යුතු දිනය ජුනි මස පළමු වන දිනය වෙනුවට පෙබරවාරි මස පළමු වන දිනය ලෙස සංශෝධනය කර ඇත.
- යම් කිසි මැතිවරණ කොට්ඨාසයක නාමලේඛනයෙහි ඇතුළත් කිරීම හෝ තබා ගැනීම සඳහාත්, සාමාන්‍යයෙන් පදිංචිව සිටිය යුතු සුදුසුකම් ලැබීමේ ලිපිනය සඳහාත් ඒ ආශ්‍රිත වෙනත් තීරණ සඳහාත් පැවති ජුනි මස පළමුවන දිනය වෙනුවට පෙබරවාරි මස පළමු වන දිනය ලෙස සංශෝධනය කර ඇත.
- එක් එක් වර්ෂයේ ජුනි මස පළමුවන දිනයෙහි හෝ එදිනට පෙර ප්‍රතිශෝධන කටයුතු ආරම්භ කිරීම වෙනුවට පෙබරවාරි මාසයේ පළමු වන දිනයෙහි හෝ එදිනට පෙර යන්න සංශෝධනය විය.
- 'අ' සහ 'ආ' ලැයිස්තු සම්පූර්ණ කිරීම ඊළඟට එළඹෙන වර්ෂයේ ජනවාරි තිස් එක් වන දින හෝ එදිනට පෙර සම්පූර්ණ කරනු ලැබිය යුතු යන කරුණු වෙනුවට අදාළ වර්ෂයේ සැප්තැම්බර් මස තිස්වන දිනය ලෙස සංශෝධනය විය.

## 7.2. පරිපූරක ඡන්දහිමි නාමලේඛන

- යම් වර්ෂයක පෙබරවාරි මස පළමු වන දිනෙන් ආරම්භ වී එම වර්ෂයේම මැයි මස තිස් එක් වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත;
- යම් වර්ෂයක ජුනි මස පළමු වන දිනයෙන් ආරම්භ වී එම වර්ෂයේම සැප්තැම්බර් මස තිස් වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත;
- යම් වර්ෂයක ඔක්තෝබර් මස පළමු වන දිනෙන් ආරම්භ වී පසුව එළඹෙන වර්ෂයේ ජනවාරි මස තිස් එක් වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත;
  අටලොස්විය සම්පූර්ණ කරන තැනැත්තෙකු ඡන්දහිමියෙකු ලෙස නාමලේඛනයට නම ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ලබන බවත් ඒ සඳහා උප්පැන්න සහතිකයේ පිටපතක් හෝ ජාතික හැඳුනුම්පතේ පිටපතක් සමඟ ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත ඉල්ලීම් කළ හැකි බවත් සංශෝධිත පනතට ඇතුළත් කර ඇත.
- එමෙන්ම ලියාපදිංචි කිරීමේ නිලධාරි විසින් පරිපූරක ලැයිස්තු සකස් කළ යුතු බවත් , එම පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කළ යුතු බවත්, මේ සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ හා භාෂාත්‍රයෙන් ප්‍රවෘත්ති පත්‍රවල දැන්වීම් පළ කළ යුතු බවත් , එම දැන්වීම් පළ කළ දින සිට දින 10ක් ඇතුළත හිමිකම් ඉල්ලීම් හා විරෝධතා ඉල්ලීම් සිදු කළ හැකි බවත්, සංශෝධිත පනතට ඇතුළත් කර ඇත. එමෙන්ම හිමිකම් හා විරෝධතා පරීක්ෂණ පැවැත්වීමට අදාළ විධිවිධාන හා එම පරීක්ෂණ අවසානයේ පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කරන දිනය දක්වා කාර්යයන්ට අදාළ ප්‍රතිපාදන ඇතුළත් කර ඇත.
- පරිපූරක නාමලේඛන බලාත්මක වීම සහ නිෂ්ප්‍රභා වීම පිළිබඳව සංශෝධිත පනතේ සඳහන් කර ඇත.

**7.3.** ඡන්දහිමියන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මතුවන දුෂ්කරතා සහ පූර්වයෙන් අපේක්ෂා නොකළ කරුණු පිළිබඳව තීරණය කිරීම හෝ උචිත පරිදි වෙනස් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන නිකුත් කිරීමට කොමිෂන් සභාවට බලතල පවරා ඇත.

## 8. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය 2024

2021 අංක 22 දරණ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත මඟින් සිදු කළ සංශෝධන අනුව 2024 පෙබරවාරි 01 දින හෝ ඊට පෙර 2024 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනය සඳහා ඡන්දහිමියන් ගණන් ගැනීම ආරම්භ කළ යුතු විය.

**8.1.** 2024 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය අනුව ප්‍රධාන නාමලේඛනය සැකසීම මෙම කාර්යය මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කිරීමේ නිලධාරීගේ සහ දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ මෙහෙය වීම මත දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මඟින් සිදු කරනු ලබන අතර, ගෙයින් ගෙට ගොස් ක්ෂේත්‍රය තුළ ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ගණන් ගන්නා නිලධාරීන් ලෙස ග්‍රාම නිලධාරීවරුන් හා ඔවුන්ට අමතරව කොළඹ මහ නගර සභා සීමාව හා මීගමුව මහ නගර සභා සීමාව තුළ විශේෂ ගණන් ගන්නා නිලධාරීන් කටයුතු කරනු ලැබේ.

**8.2.** කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 සහ 2022 වර්ෂවල ගණන් ගැනීමේ නිලධාරීන් ගෙයින්ගෙට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීම සිදු නොකරන ලදී. එහෙත් 2023 වර්ෂයේ මෙන්ම 2024 වර්ෂයේ ද ගෙයින්ගෙට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීම සිදු කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

**8.3.** පනතේ 12(1) වගන්තියට අනුකූලව නාමලේඛන ප්‍රතිශෝධනය ආරම්භ කරන බව, ඡන්ද හිමියන් ගණන් ගන්නා ක්‍රමවේදය පිළිබඳව නිවේදනය අංක 2365/02 හා 2024.01.01 දිනැති රජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. ඊට අමතරව ඒ පිළිබඳව දිනමිණ, තිනකරන් හා ඩේලිනිවුස් පුවත්පත්වල ද භාෂාත්‍රයෙන් පළ කරන ලදී.

**8.4.** ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සඳහා උපදෙස් චක්‍රලේඛය සියළුම දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරින් වන දිස්ත්‍රික් ලේකම්වරුන්ට හා සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරින් වන දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත 2023.12.04 දින නිකුත් කරන ලදී. ඡන්දහිමියන් ගණන් ගැනීමේ නෛතික හා ප්‍රායෝගික කරුණු පිළිබඳව උපදෙස් ලබා දීම සිදු කළ අතර ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීම දක්වා ඉදිරි ක්‍රියාකාරකම් සිදු කළ යුතු දින වකවානු පිළිබඳ සැලැස්මද ලබා දෙන ලදී.

**8.5.** 2023(3) වන පරිපූරක නාමලේඛනය සහතික කිරීම 2024.02.01 දින සිදු කරන ලදී. නමුත් 2023(3) පරිපූරක නාමලේඛණය සකස්කිරීමේ කටයුතු 2023 දෙසැම්බර් මාසයේ අවසන් කළ බැවින්, 2023 ප්‍රධාන නාමලේඛනයට සහතික කරන ලද 2023(1), 2023(2) නාමලේඛන සහ කටයුතු අවසන් කරන ලද 2023(3) පරිපූරක නාමලේඛනය ඒකාබද්ධ කර ඡන්ද හිමියන් ගණන් ගැනීම සඳහා දත්ත මුද්‍රිත ඒකාබද්ධ ලැයිස්තු සකස් කිරීමත් ඉන් අනතුරුව 2024.01.01 දින සිට ගෙයින් ගෙට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීමත් සැලසුම් කරන ලදී.

**8.6.** 2023 වර්ෂයේ ඒකාබද්ධ ලැයිස්තුව A3 ප්‍රමාණයට මුද්‍රණය කිරීම නිසා භාවිතයේ දී ගැටළු ඇති වූ බව ගණන් ගන්නා නිලධාරීන් හා දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් දැනුම් දීම නිසා 2024 වර්ෂයේ දී ඒකාබද්ධ ලැයිස්තුවේ ප්‍රමාණය කුඩා කොට පොතක් ලෙස සකසා ලබාදෙන ලදී.

**8.7.** ඡන්ද හිමියන් ගණන් ගැනීම සඳහා ලැයිස්තු ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. එම ලැයිස්තුවෙහි 2024.02.01 දින වන විට වලංගු ඡන්ද හිමි නාමලේඛන ඇතුළත් සියළුම ඡන්ද හිමියන්ගේ නම් සඳහන් වූ අතර ගෘහමූලික හෝ නිවසේ වැඩිහිටියෙකු පරීක්ෂා කර බලා එම ලැයිස්තුවෙහි අත්සන් තැබීම සිදු කළ යුතු වේ. 'අ' සහ 'ආ' ලැයිස්තුගත වන නම්

සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා ER ආකෘතියක් භාවිත කරන ලදී (2024/ER). සෑම ගෘහයකටම වලංගු නාමලේඛනයේ නම් සඳහන් වන තැනැත්තන්ගේ විස්තර සඳහන් කුඩා පත්‍රිකාවක් ලබාදීමටද කටයුතු කරන ලදී.

**8.8.** ක්ෂේත්‍ර ගණන් ගැනීමේ කාලසීමාව තුළ ග්‍රාම නිලධාරී ස්ථාන මාරුවීම් අත්හිටුවීම සහ එම කාලය තුළ කාර්යාල දින සීමා කිරීම් සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම මත රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත 2023.12.29 දිනැතිව උපදෙස් ලබා දෙන ලදී.

**8.9. ‘අ’ ‘ආ’ ලැයිස්තු ප්‍රදර්ශනය ; හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම**

2023 ඒකාබද්ධ ඡන්දහිමි නාමලේඛනයේ නම් සඳහන්ව ඇති අයගෙන් මියගොස් ඇති හෝ පදිංචිය හැරගොස් ඇති හෝ වෙනත් හේතුවක් මත හෝ සුදුසුකම් නොලබන තැනැත්තන්ගේ එනම් 2024 වර්ෂයේ ඉවත් කිරීමට නිර්දේශ කරන තැනැත්තන්ගේ නම් සඳහන් වන ‘අ’ ලැයිස්තුව හා 2023 වර්ෂයේ ඒකාබද්ධ ඡන්දහිමි නාමලේඛනයේ නම් ඇතුළත් නොවන නමුත් වයස අවුරුදු 18 සම්පූර්ණ වීම හෝ පදිංචියට පැමිණීම හෝ වෙනත් හේතුවක් මත හෝ 2024 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයට අලුතින් නම් ඇතුළත් කිරීම සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්ගේ නම් සඳහන් වන ‘ආ’ ලැයිස්තු ප්‍රදර්ශනය 2024.04.09 දින සිට සිදු කරන ලදී. මේ පිළිබඳව අංක: 2379/16 හා 2024.04.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ හා භාෂාත්‍රයෙන් පුවත්පත්වල දැන්වීම් පළ කරන ලදි.

**8.9.1 වලංගු නාමලේඛනය (හෝ කොටසක්) සහ “අ” ලැයිස්තු හා “ආ” ලැයිස්තු ප්‍රදර්ශන ස්ථාන**

- එක් එක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය
- එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- එක් එක් පළාත් පාලන ආයතනය
- එක් එක් ග්‍රාම නිලධාරී කාර්යාලය

**8.9.2.** එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාල වූ එකී ඡන්දහිමි නාමලේඛනයේ තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නමක් ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ඇත්තාවූ එහෙත් තමාගේ නම ඡන්දහිමි නාමලේඛනයෙන් හා “ආ” ලැයිස්තුවෙන් ඉවත් කොට හෝ “අ” ලැයිස්තුවේ ඇතුළත් කර හෝ ඇති යම්කිසිවෙකු විසින් තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නම නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ අවස්ථාවෝචිත පරිදි තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙන කෙනෙකු විසින් හෝ හිමිකම් ඉල්ලා සිටින්නේ නම් එසේ හිමිකම් ඉල්ලා සිටින අය විසින් ඒ බව යථෝක්ත ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ උප ලේඛනයේ නියම කර ඇති “අ” සහ “ආ”ආකෘතියට සාරානුකූලව ඉල්ලුම් කළ යුතු බවට වන දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 2024 අප්‍රේල් මස 09 දින පළ කරන ලද අතර එදින සිට සති 4 ක් ඇතුළත එනම් 2024.05.06 දිනට පෙර මේ සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ලැබිය යුතු බව ප්‍රසිද්ධ කරන ලදී.

**8.9.3.** මැතිවරණ කොට්ඨාසයට අදාල වූ ඡන්දහිමි නාමලේඛනයේ හෝ “ආ” ලැයිස්තුවේ තමාගේ නම ඇතුළත්ව ඇත්තාවූ යම් කෙනෙකුට, තමාගේ නම හෝ එකී නාමලේඛනයේ හෝ “ආ” ලැයිස්තුවේ හෝ නම සඳහන් වී ඇත්තා වූ වෙන යම් කෙනෙකුගේ නමක් හෝ එකී නාමලේඛනයේ ඇතුළත් කර තිබීම ගැන හෝ එකී නාමලේඛනයේ නම ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ විරුද්ධතාවය දක්වා සිටීමට පුළුවන. එසේ දක්වා සිටින විරුද්ධතාවන් යථෝක්ත පනතේ උපලේඛනයේ නියම කර ඇති පරිදි “ඇ” ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින්

යුක්ත කොට, මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. නාමලේඛනයේ නම ඇතුළත් කිරීම ගැන සඳහන් වනු ලබන සෑම විරුද්ධතාවක්ම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට එනම් 2024 අප්‍රේල් මස 09 දින සිට සති 4ක් ඇතුළත එනම් 2024.05.06 දිනට පෙර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ලැබෙන සේ එවිය යුතු බව ප්‍රසිද්ධ කරන ලදී.

**8.9.4.** හිමිකම් ඉල්ලා සිටින අයකුගේ නමක් ඡන්දහිමි නාමලේඛනයේ ඇතුළත් කිරීම ගැන දක්වනු ලබන සෑම විරුද්ධතාවක්ම හිමිකම් ඉල්ලා සිටින්නන්ගේ නම් ලැයිස්තුවක් අඩංගු දැන්වීමක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ප්‍රදර්ශනය කරනු ලැබූ දින සිට දින 14 ක් ඇතුළත යථෝක්ත පනතේ උපලේඛනයේ නියම කර ඇති පරිදි 'ඇ' ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් සකස් කොට ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු වේ. මෙම දැන්වීම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල 2024 අප්‍රේල් මස 25 වන දින සහ 2024 මැයි මස 09 වන දින ප්‍රසිද්ධ කරන ලදී.

**8.9.5.** හිමිකම් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන 'අ' 'ආ' ආකෘති පත්‍ර සහ විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන 'ඇ' 'ඈ' ආකෘති පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් හා ග්‍රාම නිලධාරී කාර්යාලවලින් ලබා ගැනීම සඳහා පහසුකම් ලබා දෙන ලදී.

### 8.10. හිමිකම් සහ විරෝධතා පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රමාද ඉල්ලීම් පිළිබඳව ක්‍රියා කිරීම

**8.10.1.** 'අ' 'ආ' ලැයිස්තුගත සංඛ්‍යාව හා හිමිකම් භාරගැනීමේ කාලපරිච්ඡේදය අවසානයේ ලැබී ඇති හිමිකම් සංඛ්‍යාව පිළිබඳව අවධානය යොමු කළ මැතිවරණ කොමිෂන් සභාව ඡන්දහිමියන් ගණන් ගැනීමේදී සිදුවිය හැකි දෝෂ නිවැරදි කිරීම සඳහා යම් අයුරකින් මගහැරී ඇති සුදුසුකම් ලැබූ ඡන්දහිමියන් ප්‍රමාද ඉල්ලීම් ලෙස සලකා නාමලේඛන ගත කිරීමට අදාල උපදෙස් දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත නිකුත් කරන ලදී. 2381/49 හා 2024.04.26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ එක් එක් දිස්ත්‍රික්කය සඳහා සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන් ප්‍රසිද්ධ කරන ලදී.

**8.10.2.** ප්‍රධාන නාමලේඛනය හා පරිපූරක නාමලේඛනය සකස් කිරීමේ දී අනාවරණය වූ බහු ලියාපදිංචි ඡන්දහිමියන් සම්බන්ධයෙන් ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12(7) උප වගන්තිය අනුව ක්‍රියා කරන ලදී. ඒ අනුව ඡන්දහිමියන් ලියාපදිංචි වීමට කැමති ලිපිනය විමසීම ප්‍රථමයෙන් සිදු කරන ලදී. ඊට ලද පිළිතුරු අනුව එක් ලිපිනයකින් ඉවත් කර ඡන්දහිමියන් කැමති ලිපිනයේ ලියාපදිංචි කිරීම සිදු කරන ලදී. මැතිවරණ කොට්ඨාසය තුළ බහු ලියාපදිංචිය සඳහා පිළිතුරු නොලද විට ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ගේ අභිමතය පරිදි එක් ලිපිනයක ලියාපදිංචි කිරීම සිදුකරන ලදී. මැතිවරණ කෙට්ඨාස දෙකක බහු ලියාපදිංචිය සම්බන්ධයෙන් තීරණය මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කිරීමෙන් අනතුරුව ලබා දෙන ලදී. ජාතික හැඳුනුම්පත් අංක අනුව බහු ලියාපදිංචි බව අනාවරණය වුව ද පුද්ගලයන් දෙදෙනෙකු බව නිරීක්ෂණය වන අවස්ථාවක දී හා එක් පුද්ගලයෙක් ද යන්න සැක සහිත අවස්ථාවන්හි දී තවදුරටත් ලිපින දෙකෙහිම තබා ගැනීමට තීරණය කරන ලදී.

**8.11.** ජනාධිපතිවරණය නියමිත දිනවල පැවැත්වීමේ අවශ්‍යතාවය හා ඒ අනුව මූලික කටයුතු සංවිධානය කර ගැනීමේ අවශ්‍යතාව ද සලකා බලා 2024 ප්‍රධාන නාමලේඛනය හා 2024 (1) පරිපූරක නාමලේඛනය සහතික කරන දින සංශෝධනයට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී. ඒ අනුව 2024.07.15 දින සහතික කිරීමට නියමිතව තිබූ ප්‍රධාන නාමලේඛනය 2024.07.01 දින සහතික කිරීමටත්,

2024.07.15 දින සහතික කිරීමට නියමිතව තිබූ 2024 (1) පරිපූරක නාමලේඛනය 2024.07.08 දින සහතික කිරීමටත් කටයුතු කරන ලදී.

**8.12.** 2024 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීමේ කටයුතු දිස්ත්‍රික් මට්ටමෙන් අවසන් කර 2024 ජූලි මස 01 වන දින දිවයිනේ සියලු මැතිවරණ කොට්ඨාසවල සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින් සහතික කරන ලදී.

ඒ පිළිබඳව 2024.07.01 දිනැතිව අංක 2391/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, භාෂාත්‍රයෙන් පුවත්පත් දැන්වීම් පළ කිරීමටත් කටයුතු කළ අතර මැතිවරණ කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීම මෙන්ම, සහතික කරන ලද ඡන්දහිමි නාමලේඛනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හා දිවයිනේ සියලුම ග්‍රාම නිලධාරී කාර්යාලවල මහජන ප්‍රදර්ශනය සඳහා තබන ලදී.

**8.13.** 2024 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව

| දිස්ත්‍රික්කය | 2024 ප්‍රධාන නාමලේඛනයේ ඡන්ද ගණන | තෝරා පත්කර ගතයුතු මන්ත්‍රී ධුර ගණන |
|---|---:|---:|
| කොළඹ | 1,761,536 | 18 |
| ගම්පහ | 1,873,825 | 19 |
| කළුතර | 1,019,679 | 11 |
| මහනුවර | 1,185,646 | 12 |
| මාතලේ | 427,851 | 5 |
| නුවරඑළිය | 602,887 | 8 |
| ගාල්ල | 898,653 | 9 |
| මාතර | 682,587 | 7 |
| හම්බන්තොට | 518,154 | 7 |
| යාපනය | 590,022 | 6 |
| වන්නි | 304,971 | 6 |
| මඩකලපුව | 446,953 | 5 |
| දිගාමඩුල්ල | 552,204 | 7 |
| ත්‍රිකුණාමලය | 314,135 | 4 |
| කුරුණෑගල | 1,410,925 | 15 |
| පුත්තලම | 661,257 | 8 |
| අනුරාධපුර | 737,764 | 9 |
| පොලොන්නරුව | 349,801 | 5 |
| බදුල්ල | 702,293 | 9 |
| මොනරාගල | 397,221 | 6 |
| රත්නපුර | 919,207 | 11 |
| කෑගල්ල | 706,690 | 9 |
| **එකතුව** | **17,064,261** | **196** |

## 9. 2023(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීම

ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ සංශෝධිත පනත අනුව 2023 ඔක්තෝම්බර් මස 01 දින සිට 2024 ජනවාරි මස 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ කිසියම් දිනයක දී වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන් ඇතුළත් පරිපූරක ඡන්දහිමි නාමලේඛනයක් සකස් කළ යුතුවේ.

මෙම පරිපූරක නාමලේඛනයට අදාල ගණන් ගැනීමේ කටයුතු 2023.02.01 දින ප්‍රධාන නාමලේඛනය ගණන් ගැනීමට සමගාමීව සිදු කරන ලදී.

**9.1.** පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම, හිමිකම් හා විරෝධතා සම්බන්ධයෙන් අංක: 2352/03 හා 2023.10.02 දිනැති ගැසට් පත්‍රයේ හා පුවත්පත්වල භාෂාත්‍රයෙන් දැන්වීම පළ කරන ලදී.

**9.2.** අවස්ථා කිහිපයකදී පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් මෙම කාල පරිච්ඡේදය තුළ අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන්ගේ විස්තර ලබාගත් අතර එම විස්තර දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් මගින් ග්‍රාම නිලධාරීනට යැවීමට කටයුතු කරන ලදී. ඊට අමතරව එක් එක් තැනැත්තන් වෙත ලියාපදිංචි වීමට කටයුතු කරන ලෙස ලිපි මගින් දැනුම් දෙන ලදී.

**9.3.** හිමිකම් පරීක්ෂණ පැවැත්වීමෙන් අනතුරුව පරිපූරක ඡන්දහිමි නාමලේඛනය ආරම්භයේදී සැලසුම් කළ ආකාරයට 2024.02.01 දින සහතික කිරීම සිදු කරන ලදී. මේ සම්බන්ධයෙන් අංක 2369/28 හා 2024.02.01 දිනැති ගැසට් නිවේදනය හා පුවත්පත් දැන්වීම මගින් නිවේදනය කරන ලදී. මෙම පරිපූරක නාමලේඛනයේ ලියාපදිංචි මුළු ඡන්දහිමියන් සංඛ්‍යාව 72,757ක් වේ.

| දිස්ත්‍රික්කය | 2023(3) පරිපූරක නාමලේඛනයේ ඡන්ද ගණන | තෝරා පත්කර ගතයුතු මන්ත්‍රී ධුර ගණන |
|---|---|---|
| කොළඹ | 2,571 | 18 |
| ගම්පහ | 6,520 | 18 |
| කළුතර | 4,317 | 11 |
| මහනුවර | 6,027 | 12 |
| මාතලේ | 1,510 | 5 |
| නුවරඑළිය | 2,107 | 8 |
| ගාල්ල | 4,300 | 9 |
| මාතර | 3,439 | 7 |
| හම්බන්තොට | 2,768 | 7 |
| යාපනය | 3,442 | 7 |
| වන්නි | 1,387 | 6 |
| මඩකලපුව | 3,026 | 5 |
| දිගාමඩුල්ල | 3,996 | 7 |
| ත්‍රිකුණාමලය | 1,765 | 4 |
| කුරුණෑගල | 5,537 | 15 |
| පුත්තලම | 2,336 | 8 |
| අනුරාධපුර | 3,951 | 9 |
| පොලොන්නරුව | 1,483 | 5 |
| බදුල්ල | 3,189 | 9 |
| මොනරාගල | 1,942 | 6 |
| රත්නපුර | 4,169 | 11 |
| කෑගල්ල | 2,975 | 9 |
| **එකතුව** | **72,757** | **196** |

**9.4.** සෑම ඡන්දහිමි නාමලේඛනයක් සහතික කළ පසු තත් කාලයේ බලපවත්නා වලංගු ඡන්දහිමි නාමලේඛනයේ ඡන්ද සංඛ්‍යාව පදනම් කරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 හා 98 ව්‍යවස්ථාවන්ට අනුකූලව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත් කර ගැනීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව නිශ්චය කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් නිවේදනය අංක 2374/23 හා 2024.03.06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

## 10. 2024 පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම.

**10.1.** ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ සංශෝධිත පනත අනුව 2024 පෙබරවාරි මස 01 දින සිට 2024 මැයි මස 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ, 2024 ජූනි මස 01 දින සිට 2024 සැප්තැම්බර් මස 30 දින දක්වා කාල පරිච්ඡේදය තුළ හා 2024 ඔක්තෝබර් මස 01 දින සිට 2025 ජනවාරි මස 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ කිසියම් දිනයක දී වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන් ඇතුළත් පරිපූරක ඡන්දහිමි නාමලේඛනයක් සකස් කළ යුතුවේ.

**10.2.** මෙම පරිපූරක නාමලේඛනයට අදාළ මූලික තොරතුරු ලබාගැනීම 2023 වර්ෂයේ ඡන්දහිමියන් ගණන් ගැනීමට සමගාමීව ආරම්භ කරන ලදී. සුදුසුකම් ලැබූ සෙසු තැනැත්තන් ගණන් ගැනීමේ කටයුතු 2024 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනය ගණන් ගැනීමට සමගාමීව සිදු කරන ලදී.

**10.3.** අවස්ථා කිහිපයකදී පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් මෙම කාල පරිච්ඡේදය තුළ අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන්ගේ විස්තර ලබාගත් අතර එම විස්තර දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වරුන් මගින් ග්‍රාම නිලධාරීන්ට යැවීමට කටයුතු කරන ලදී. ඊට අමතරව එක් එක් තැනැත්තන්ගේ පෞද්ගලික නිවාස වෙත ලිපි මගින් ද දැනුම් දෙන ලදී.

**10.4.** පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම, හිමිකම් හා විරෝධතා සම්බන්ධයෙන් අංක 2381/41 හා 2024.04.26 දිනැති ගැසට් පත්‍රයේ

හා පුවත්පත්වල භාෂාත්‍රයෙන් දැන්වීම පළ කරන ලදී.

**10.5.** සෑම ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනයක් හා පරිපූරක ඡන්ද හිමි නාමලේඛණයක් සහතික කළ පසු තත් කාලයේ බලපවත්නා වලංගු ඡන්දහිමි නාමලේඛනයේ ඡන්ද සංඛ්‍යාව පදනම් කරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 හා 98 ව්‍යවස්ථාවන්ට අනුකූලව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත් කර ගැනීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව නිශ්චය කළ යුතු වේ.

### 10.6. 2024 (1) වන පරිපූරක නාමලේඛණය

**10.6.1.** හිමිකම් පරීක්ෂණ අවසන්කර මෙම පරිපූරක නාමලේඛනය 2024.07.08 දින සහතික කරන ලදී.

**10.6.2.** මෙම පරිපූරක ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව

| **දිස්ත්‍රික්කය** | **2024(1) පරිපූරක නාමලේඛනයේ ඡන්ද ගණන** | **තෝරා පත්කර ගතයුතු මන්ත්‍රී ධුර ගණන** |
|---|---:|---:|
| කොළඹ | 3,815 | 18 |
| ගම්පහ | 7,304 | 19 |
| කළුතර | 4,565 | 11 |
| මහනුවර | 5,753 | 12 |
| මාතලේ | 2,140 | 5 |
| නුවරඑළිය | 2,405 | 8 |
| ගාල්ල | 4,510 | 9 |
| මාතර | 3,588 | 7 |
| හම්බන්තොට | 2,786 | 7 |
| යාපනය | 3,165 | 6 |
| වන්නි | 1,110 | 6 |
| මඩකලපුව | 2,733 | 5 |
| දිගාමඩුල්ල | 3,228 | 7 |
| ත්‍රිකුණාමලය | 1,790 | 4 |
| කුරුණෑගල | 6,301 | 15 |
| පුත්තලම | 2,416 | 8 |
| අනුරාධපුර | 4,098 | 9 |
| පොළොන්නරුව | 1,501 | 5 |
| බදුල්ල | 3,479 | 9 |
| මොනරාගල | 1,945 | 6 |
| රත්නපුර | 4,529 | 11 |
| කෑගල්ල | 2,932 | 9 |
| **එකතුව** | **76,093** | **196** |

**10.6.3.** 2024 පළමුවන පරිපූරක ඡන්දහිමි නාමලේඛණයේ වලංගු ඡන්ද සංඛ්‍යාව පදනම් කරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 හා 98 ව්‍යවස්ථාවන්ට අනුකූලව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත් කර ගැනීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව සම්බන්ධයෙන් නිවේදනය අංක 2393/26 හා 2024.07.17 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

### 10.7. 2024 (2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය

**10.7.1.** හිමිකම් පරීක්ෂණ අවසන්කර මෙම පරිපූරක නාමලේඛනය 2023.10.01 දින සහතික කරන ලදී.

**10.7.2.** මෙම පරිපූරක ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව 78,901ක් වේ.

| **දිස්ත්‍රික්කය** | **2024(2) පරිපූරක නාමලේඛනයේ ඡන්ද ගණන** | **තෝරා පත්කර ගතයුතු මන්ත්‍රී ධුර ගණන** |
|---|---:|---:|
| කොළඹ | 4,287 | 18 |
| ගම්පහ | 7,725 | 19 |
| කළුතර | 4,561 | 11 |
| මහනුවර | 5,601 | 12 |
| මාතලේ | 2,137 | 5 |
| නුවරඑළිය | 2,414 | 8 |
| ගාල්ල | 4,689 | 9 |
| මාතර | 3,737 | 7 |
| හම්බන්තොට | 2,808 | 7 |
| යාපනය | 3,732 | 6 |
| වන්නි | 1,291 | 6 |

| දිස්ත්‍රික්කය | 2024(2) පරිපූරක නාමලේඛනයේ ඡන්ද ගණන | තෝරා පත්කර ගතයුතු මන්ත්‍රී ධුර ගණන |
|---|---|---|
| මඩකලපුව | 3,172 | 5 |
| දිගාමඩුල්ල | 3,572 | 7 |
| ත්‍රිකුණාමලය | 1,779 | 4 |
| කුරුණෑගල | 6,467 | 15 |
| පුත්තලම | 2,407 | 8 |
| අනුරාධපුර | 4,193 | 9 |
| පොලොන්නරුව | 1,496 | 5 |
| බදුල්ල | 3,290 | 9 |
| මොනරාගල | 2,136 | 6 |
| රත්නපුර | 4,517 | 11 |
| කෑගල්ල | 2,890 | 9 |
| **එකතුව** | **78,901** | **196** |

**10.7.3.** 2024 දෙවන පරිපූරක ඡන්දහිමි නාමලේඛණයේ වලංගු ඡන්ද සංඛ්‍යාව පදනම් කරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 හා 98 ව්‍යවස්ථාවන්ට අනුකූලව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත් කර ගැනීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව සම්බන්ධයෙන් නිවේදනය අංක 2415/60 හා 2024.12.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

### 10.8. 2024(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය

2024.12.15 දින වන විට මෙම පරිපූරක නාමලේඛනයට අදාල බොහෝ කටයුතු අවසන් කර තිබුණි. පෙර සැලසුම් කළ පරිදි 2025.02.01 දින මෙම පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීමට නියමිතය.

## 11. 2025 (1), 2025 (2) සහ 2025 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම

2025.02.01 සිට 2025.05.31 දක්වා සකස් කළ යුතු 2025 (1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය 2025.06.01 සිට 2025.09.30 දක්වා සකස් කළ යුතු 2025 (2) පරිපූරක ඡන්දහිමි නාමලේඛන සහ 2025.10.01 සිට 2026.01.31 දක්වා සකස් කළ යුතු 2025 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්ගේ විස්තර 2024 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට සමගාමීව එකතු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලදි.

**11.1.** ඒ අනුව 2024.12.31 දිනට 2025 වර්ෂයට අදාල පරිපූරක නාමලේඛන සඳහා නිර්දේශිත නම් සංඛ්‍යාව පහත දැක්වේ.

| පරිපූරක නාමලේඛනය | නිර්දේශිත නම් සංඛ්‍යාව |
|---|---|
| 2025(1) | 22,463 |
| 2025(2) | 20,320 |
| 2025(3) | 18,488 |

## 12. ඡන්දහිමි නාමලේඛන ක්‍රියාවලිය සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම

**12.1.** ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා ග්‍රාම නිලධාරී කාර්යාල, මැතිවරණ කාර්යාල වෙත යාම වෙනුවට මාර්ගගත ඉ-සේවාවක් ඔස්සේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීමට මහජනතාවට අවස්ථාව ලබාදීම.

**12.2.** එසේම 2021 වර්ෂයේදී හඳුන්වා දුන් සියළු පුරවැසියන් හට ඡන්දහිමි නාමලේඛන තොරතුරු ඇතුළත් ප්‍රකාශයක් තම ජංගම දුරකථනය/ පරිගණකය ඔස්සේ ලබා ගැනීමේ පහසුකම මෙම වසරේ ද එලෙසින්ම ක්‍රියාත්මක විය.

**12.3.** පළමු වසර සඳහා පාසල්වල ට සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා කලාප /කොට්ඨාස අධ්‍යාපන කාර්යාල වලට නොමිලයේ හා ඉල්ලුම් කරන පාසල් වලට නියමිත ගාස්තු අයකර ඉ- සේවාවක් මගින් පදිංචි විස්තර ලබාදීමේ සේවාවක් ක්‍රියාත්මක විය.


**12.4.** මැතිවරණ කොමිෂන් සභාවේ ඉ-සේවා පද්ධතිය වැඩිදියුණු කිරීම මගින් මහජනතාව ඇතුළු මැතිවරණ කොමිෂන් සභාවේ පාර්ශවකරුවන් වෙත පහසුවෙන් තම සේවාවන් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම.


**12.5.** ග්‍රාම නිලධාරීන්ගේ මැතිවරණ කොමිෂන් සභාව හා සම්බන්ධ කටයුතු මැතිවරණ ඉ-සේවා හරහා මාර්ගගතව සිදු කිරීමේ පහසුකම් ලබාදීම.


**12.6.** ආබාධිත පුරවැසියන්ට පහසුකම් සැලසීම සඳහා විශේෂ පහසුකම් ලබාදීම. මැතිවරණ ඉ-සේවා හරහා පුද්ගලයන්ගේ ආබාධිත බව පිළිබඳ දත්ත රැස්කිරීමේ කටයුතු ආරම්භ කිරීම. (මෙමගින් මැතිවරණයකදී ඔවුන්ට අවශ්‍ය විශේෂ පහසුකම් සැලසීමට හැකියාව ලැබේ.)


**12.7** ඡන්දහිමි නාමලේඛණ ප්‍රතිශෝධනය පිළිබඳව වරින් වර කෙටි පණිවිඩ (SMS) මඟින් ජනතාව දැනුම්වත් කිරීම.


**12.8.** 2024 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව මහජනතාව දැනුම්වත් කිරීම සඳහා ඩයලොග්, මොබිටෙල්, එයාර්ටෙල් සහ හච්සන් යන ජංගම සහ CDMA දුරකථන ග්‍රාහකයන් වෙත “Elections” යන ශීර්ෂ පාඨය යටතේ පහත සඳහන් කෙටි පණිවිඩය මුදල් අයකිරීමකින් තොරව 2024.03.08 දින යැවීමට කටයුතු කරන ලදී.




















**12.9** 2024 ඡන්ද හිමි නාමලේඛනයට නිර්දේශ නොවූ හෝ පදිංචි ලිපිනය වෙනස් කිරීමට අවශ්‍ය මේ දක්වා නිර්දේශ නොවූ පුරවැසියන් දැනුම්වත් කිරීම සඳහා ඩයලොග්, මොබිටෙල්, එයාර්ටෙල් සහ හච්සන් යන ජංගම සහ CDMA දුරකථන ග්‍රාහකයන් වෙත “Elections” යන ශීර්ෂ පාඨය යටතේ පහත සඳහන් කෙටි පණිවිඩය මුදල් අයකිරීමකින් තොරව 2024.04.29 දින යැවීමට කටයුතු කරන ලදී.




**12.10** මෙම කෙටි පණිවිඩ මඟින් ජනතාව විශාල ලෙස දැනුම්වත් වීමක් සිදු විය. මේ සම්බන්ධයෙන් ඩයලොග් මාධ්‍ය ඡාලය, මොබිටෙල් පුද්ගලික සමාගම, භාරති එයාර් ටෙල් ලංකා සමාගම සහ හච්සන් ටෙලි කොමියුනිකේෂන් ශ්‍රී ලංකා සමාගමට අතිශය කෘතඥතාව පළ කරමු. එමෙන්ම සම්බන්ධීකරණ කාර්යය භාරය ඉටු කළ ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ද කෘතඥතාව පළ කරමු.

## 13. 2025 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

**13.1.** 2024.07.01 දින සහතික කරන ලද 2024 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය; 2024.07.08 දින සහතික කරනලද 2024(1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය; 2024.10.01 දින සහතික කරනලද 2024(2) පරිපූරක

ඡන්දහිමි නාමලේඛනය සමග 2025.02.01 දින සහතිකකිරීමට නියමිත 2024(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සඳහා නිර්දේශිත නම් ඒකාබද්ධ කර 2025 වර්ෂය සඳහා ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ඒකාබද්ධ ලැයිස්තු සකස් කරන ලදී.

**13.2.** 2025 වර්ෂයේ ඡන්දහිමියන් ගණන් ගැනිම සඳහා ගණන් ගැනීමේ නිලධාරීන් ගෙයින් ගෙට නොයැමට 'අ' හා 'ආ' ලැයිස්තු යාවත්කාලීන කිරීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම මඟින් ප්‍රතිශෝධන කාර්යයන් සිදු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලදී.

**13.3.** ඒ අනුව ඒකාබද්ධ ලැයිස්තුව පදිංචිය වෙනස්වීම නිසා හෝ වයස සම්පූර්ණ වීම නිසා හෝ වෙනත් යම් හේතුවක් මත ඇතුළත් විය යුතු නම් ඇතුළත් කිරීමටත්, මියයාම, පදිංචිය හැරයාම හෝ යම් නුසුදුසුකමකට ලක්වන නම් ඉවත් කිරීමටත් ගණන් ගන්නා නිලධාරීන්ට උපදෙස් ලබාදීමට තීරණය කරන ලදී. එවැනි අවස්ථාවක දී 2025/ER ආකෘතිය ගෘහ මූලිකයා විසින් සම්පූර්ණ කර ගණන් ගන්නා නිලධාරියාට භාරදිය යුතු අතර, අනෙක් අවස්ථාවලදී එම එකාබද්ධ ලැයිස්තුවේ සඳහන් ලිපිනය යටතේම ඡන්දහිමියන් 2025 සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

**13.4.** 2025 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සිදු කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් හා ප්‍රතිශෝධන කාල සටහන ඇතුළත් චක්‍රලේඛය 2024.12.17 දින සියලුම දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරීන් හා සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලදී.

**13.5.** 2025 වර්ෂයේ ඡන්දහිමියන් ගණන් ගන්නා ක්‍රමවේදය හා ප්‍රතිශෝධනය සඳහා පක්ෂ නියෝජිතයන් පත්කිරීමට අදාළ උපදෙස් 2024.12.30 වන දින සියලුම පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් වෙත නිකුත් කරන ලදී.

## 14. පාර්ලිමේන්තු මන්ත්‍රීධූර පුරප්පාඩු පිරවීම

**14.1** අංක 19 බදුල්ල මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද ලොකුගස්තොට විතාරණගේ චමින්ද විජේසිරි මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා වාසලතිලක ගෙදර නයන ප්‍රියංකර වාසලතිලක මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2366/26 හා 2024.01.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

**14.2.** අංක 16 පුත්තලම මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද සනත් නිශාන්ත මහතා මියයාම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා ඇල්.කේ. ජගත් ප්‍රියංකර මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2369/08 හා 2024.01.30 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

**14.3.** අංක 17 අනුරාධපුර මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද එච්. නන්දසේන මහතා මියයාම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා ඇම්.ජී. වීරසේන මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2378/34 හා 2024.04.05 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

**14.4.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද ඩයනා ගමගේ මහත්මියගේ මන්ත්‍රී ධූරය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66 (ඇ) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 91 (1) (ඇ) (xiii) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වීම සඳහා නුසුදුස්සෙකු වන බවත්, ඒ අනුව මන්ත්‍රී ධූරයක් දැරීමට හිමිකමක්

නොමැති බවත් අංක S.C. Appeal No. 11/2024 දරන අයදුම්පත්‍රය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරනු ලැබ ඇති හෙයින් ඇති වූ පුරප්පාඩුව සඳහා මොහොමඩ් මුජිබර් රහුමාන් මහතා මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2383/32 හා 2024.05.09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

**14.5.** අංක 14 ත්‍රිකුණාමලය මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද ඉරාජවරෝදයම් සම්බන්දන් මහතා මියයාම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා කදිරවේලු සන්මුගම් කුහදාසන් මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2391/14 හා 2024.07.02 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

**14.6.** අංක 07 ගාල්ල මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද මලිගස්පේ කෝරලේගේ නලින් මනූෂ නානායක්කාර මහතා පක්ෂයෙන් පහකිරීමට එරෙහිව ඔහු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කරන ලද අංක SC/(EXPULSION) No. 02/2023 දරන පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිශ්ප්‍රභා කිරීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2397/34 හා 2024.08.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

**14.7.** අංක 21 රත්නපුර මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද තලතා අතුකෝරල මහත්මිය ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා කරුණාරත්න පරණවිතානගේ මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2399/34 හා 2024.08.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

**14.8.** අංක 01 කොළඹ මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද අනුර කුමාර දිසානායක මහතා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා ලෙස එම ධුරය 2024 සැප්තැම්බර් මස 23 වන දින සිට භාර ගන්නා ලද හෙයින් ඔහු විසින් ස්වකීය මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩු සඳහා ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2403/01 හා 2024.09.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

## 15. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීම 2024.09.21

**15.1.** 2019 නොවැම්බර් මස 16 පැවති ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ ඡන්ද විමසීමේ දී, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ පනතේ 56 (2) වගන්තිය යටතේ ජනාධිපතිවරයා වශයෙන් තෝරාපත් කරගන්නා ලද ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් තම ධුරකාලය අවසන් වීමට පෙර 2022 ජූලි මස 14 දින ඉල්ලා අස්වීම නිසා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන ව්‍යවස්ථාව අනුව 2022 ජූලි මස 22 දින රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති ධූරය භාරගන්නා ලදී. පූර්වගාමී ජනාධිපතිවරයාගේ ඉතිරි ධුර කාලය 2024 නොවැම්බර් මස 17 දින අවසන් වන බැවින් හා ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීම, ධූරය දරන ජනාධිපතිවරයාගේ ධුරකාලය ඉකුත් වීමට පෙර මාසයකට අඩු නොවන හා මාස දෙකට වැඩි නොවන කාලසීමාවක් තුළ පැවැත්විය යුතු යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවෙන් නියමිතව ඇති හෙයින්, මැතිවරණ කොමිෂන්

සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ දෙවැනි වගන්තිය යටතේ වූ දැන්වීම 2024.07.26 දින අංක: 2394/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතර එම දැන්වීම මඟින් නාම යෝජනා භාර ගැනීම 2024.08.15 වන දිනට හා ඡන්ද විමසීම පැවැත්වීම 2024.09.21 දිනට නියම කරන ලදී. ඒ අනුව 2024 සැප්තැම්බර් මස 21 දින පැවැත්වීමට නියමිත වූ නමවන විධායක ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීමට අදාළ මූලික සංවිධාන කටයුතු 2024 වර්ෂයේ ජූලි, අගෝස්තු හා සැප්තැම්බර් යන මාසවල සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

**15.2.** 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 2 වගන්තිය යටතේ නියමය පළ කරන ලද දිනය වූ 2024.07.26 දිනයත් නාමයෝජනා කිරීමේ දිනය වූ 2024.08.15 දිනයට පෙර දිනය වූ 2024.08.14 දින මධ්‍යාහන දොළහට පෙර හෝ අතර වූ කාලය තුළ කාර්යාල දිනවල දී (සෙනසුරාදා හා ඉරිදා හැර) පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා ද 2024.08.14 වන දිනයේ දී පමණක් පෙ.ව. 8.30 සිට මධ්‍යහ්න 12.00 දක්වා ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයෙකු විසින් හෝ අපේක්ෂකයෙකු වෙනුවෙන් යම් තැනැත්තෙකු විසින්, මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ඇප වශයෙන් තැන්පත් කළ යුතු විය. ඒ අනුව නියමිත කාලය තුළ පිළිගත් දේශපාලන පක්ෂ නියෝජනය කරමින් අපේක්ෂකයින් විසි දෙදෙනෙකු සඳහා සහ අනෙකුත් අපේක්ෂකයින් දහඅට දෙනෙකු සඳහා ඇප මුදල් තැන්පත් කරන ලදී.

**15.3.** නාමයෝජනා භාරගැනීම 2024.08.15 දින රාජගිරිය මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ දී සිදු කරන ලද අතර, නියමිත කාලය තුළ ඇප මුදල් තැන්පත් කරන ලද අපේක්ෂකයන් හතලිස් දෙනා අතරින්, තිස්නව දෙනෙකු විසින් නාමයෝජනා පත්‍ර මැතිවරණ කොමිෂන් සභාව වෙත ඒ සඳහා නියම කරන ලද වේලාව තුළ භාර දීම සිදු කෙරිණි. නාමයෝජනා භාර ගැනීමෙන් පසුව මැතිවරණ කොමිෂන් සභාව විසින් එම නාමයෝජනා පත්‍ර පරීක්ෂා කර, ඒවා පිළිගන්නේද නැතිද යන්න ප්‍රකාශ කිරීම කළ යුතු විය. ඒ අනුව භාරදෙන ලද සියලුම නාමයෝජනා පත්‍ර 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ පනතේ විධිවිධානවලට අනුකූලව භාරදී තිබූ බැවින් සියලුම නාමයෝජනා පත්‍ර පිළිගනු ලැබූ බව මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරන ලදී.

**15.4.** ශ්‍රී ලංකා ඉතිහාසයේ වැඩිම ජනාධිපති අපේක්ෂකයන් ගණන ලෙස අපේක්ෂකයන් තිස්නව දෙනෙකු මෙවර ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වීම හේතුවෙන් ඡන්ද පත්‍රිකාව දිගින් වැඩි කිරීමට සිදුවිය. ඒ අනුව ඡන්ද පත්‍රිකාව උප පත්‍රිකාව රහිතව අඟල් 27 දිගින් යුක්තව මුද්‍රණය කරන ලදී. ඡන්ද පත්‍රිකාවේ විශාලත්වය සැලකිල්ලට ගනිමින් මෙවර ද කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි ඡන්ද පොළ වෙත ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

**15.5.** 2024 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය 2024 ජූලි මස 01 දින හා 2024 පළමු පරිපූරකය 2024 ජූලි මස 08 දින සහතික කිරීමට පියවර ගත් බැවින් ජනාධිපතිවරණය සඳහා 2024 ප්‍රධාන නාමලේඛනය සමඟ 2024 පළමු පරිපූරක නාමලේඛනය ද යොදාගත හැකි විය. ඒ නිසාම 2024.02.01 දින සිට 2024.05.31 දක්වා කාලය තුල වයස සම්පූර්ණ කළ 76093 ක යොවුන් ඡන්දහිමියන්ට මෙම ඡන්ද විමසීමේ දී ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව උදාවිය. 2024 වර්ෂයේ ඒකාබද්ධ ඡන්දහිමි නාමලේඛනයට අනුව ඡන්දහිමියන්ගේ සංඛ්‍යාව 17,140,354 කි. ඡන්ද කොට්ඨාස 13,314 ක් වූ අතර, ගැහැණු ඡන්ද දායිකාවන් සඳහා වෙන්කරන ලද ඡන්ද පොළවල් සමඟ මුළු ඡන්ද පොළවල් සංඛ්‍යාව 13,421 ක් විය.

**15.6.** ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනිම පිළිබඳ පනතේ 2 වගන්තිය යටතේ ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම 2024.07.26 දින

නිකුත් කිරීමට අනුව අදාළ පනතේ 23 (2) වගන්තියට අනුව ඡන්ද විමසීම් රාජකාරිවලට සම්බන්ධ වන රජයේ නිලධාරීන් සඳහා තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් සැලසිය යුතුව තිබුණි. ඒ අනුව තැපැල් ඡන්ද ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට 2024.08.05 දක්වා නියමිතව තිබූ කාලය තැපෑලේ දී සිදු විය හැකි ප්‍රමාදවීම් සහ මැතිවරණ කොමිෂන් සභාව වෙත කරනු ලැබූ ඉල්ලීම් සැලකිල්ලට ගෙන 2024.08.09 දින දක්වා දින හතරකින් දීර්ඝ කරන ලදී. මෙම ඡන්ද විමසීම වෙනුවෙන් තැපැල් ඡන්ද අයදුම්පත් 736,589 ක් අතරින් පිළිගත් තැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාව 712,319 ක් විය. තැපැල් ඡන්ද නිකුත් කිරීම හා තැපැල් දෙපාර්තමේන්තුවට භාරදීම 2024.08.26 සිදුකරන ලදී. සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලවලදී තැපැල් ඡන්ද සලකුණු කිරීම සඳහා 2024 සැප්තැම්බර් මස 05 හා 06 යන දෙදින සිදු කරන ලද අතර, එදිනට සලකුණු කළ නොහැකි වූ තැපැල් ඡන්ද පැකැට්ටු තේරීම්භාර නිලධාරි වෙත භාරගෙන ඒවා සලකුණු කිරීම සඳහා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලවලදී 2024 සැප්තැම්බර් මස 11 හා 12 යන දිනවලදී පහසුකම් සලසන ලදී.

**15.7.** 1988 අංක 16 දරන පනතින් සංශෝධනය කරන ලද 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 119 ආ වගන්තිය යටතේ තමාගේ ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතුකොට ගෙන, එම ඡන්ද මධ්‍යස්ථානයට ගොස් තමාගේ ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති ඡන්ද හිමියන්ට වෙනත් ඡන්ද මධ්‍යස්ථානයකදී ඡන්දය දීම සඳහා පහසුකම් සලසා දෙන ලෙස, නාමයෝජනා දැන්වීමේ දින සිට දින 7ක් ඇතුළත දී ඉල්ලුම්කල හැකිය. ඒ අනුව 2024 අගෝස්තු මස 01 දින හෝ ඊට පෙර මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය වෙත අයදුම්පත්‍ර 10 ක් ලැබී තිබූ අතර, ඒවා සියල්ල පනත ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබූ බැවින් ප්‍රතික්ෂේප කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

**15.8.** 2014 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතට අනුව ඡන්ද විමසීමක දී ඡන්ද පත්‍රිකාවක් කිසියම් ඡන්ද දායකයකු වෙත ලබාදීමට පෙර අනන්‍යතා ලේඛණයක් ඉදිරිපත් කළ යුතුවේ. ඡන්දදායකයා ජාතික හැඳුනුම්පත අනුව හඳුනාගත යුතු වේ. එහෙත් කිසිදු බාධාවකින් තොරව ජාතික හැඳුනුම්පත මහජනතාව වෙත ලබාගැනීමට අවශ්‍ය පහසුකම් සලසන තෙක් හා සියලුම ඡන්දදායකයන් වෙත ජාතික හැඳුනුම්පත් නිකුත් කර අවසන් වන තෙක් වෙනත් අනන්‍යතා ලේඛන ද ඡන්ද විමසීමේ කාර්යය සඳහා පිළිගැනීමට තීරණය කෙරිණි. ඊට අමතරව ජාතික හැඳුනුම්පත හෝ වෙනත් අනන්‍යතා ලේඛනයක් නොමැති ඡන්දදායකයන් වෙත මැතිවරණ කොමිෂන් සභාව විසින් තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීමටත්, පසුගිය ඡන්ද විමසීම් සඳහා නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත් නැවත වලංගුකොට ලබාදීමටත් කටයුතු කරන ලදී.

**15.9.** ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 24 වගන්තියට අනුව ලියාපදිංචි සියලුම ඡන්දදායකයන් වෙත නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් යැවිය යුතු වේ. ඒ අනුව ඡන්දදායකයන්ගේ ලියාපදිංචි විස්තර හා ඡන්දපොළට අදාළ විස්තර සටහන් කරන ලද නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා ඡන්දදායකයන් වෙත බෙදා හැරීම සඳහා 2024 සැප්තැම්බර් මස 02 දින තැපැල් දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදී. තවද, ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්ද හිමියන්ගේ නම් වලට අදාළව නිල ඡන්ද දැන්වීම් පත්වල මුද්‍රා තබා භාරදෙන ලදී. ඡන්ද පොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත ලබා දී තිබූ ඡන්දහිමි නාමලේඛනවලද තැපැල් ඡන්දහිමියන්ගේ විස්තර සටහන් කර යවන ලද අතර, ඒ තුළින් හොර ඡන්ද දැමීම වැළැක්වීම අපේක්ෂා කරන ලදී. නිල ඡන්ද දැන්වීම් පත් බෙදීමේ විශේෂ දිනය ලෙස 2024 සැප්තැම්බර් මස 08 දින වෙන්කල අතර, 2024 සැප්තැම්බර් මස 14 දින අවසන් බෙදීම සිදුකරන ලදී.

**15.10.** 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර වශයෙන්,

- සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත මාධ්‍ය උපමාන නිකුත් කිරීම.
- රාජ්‍ය සම්පත් අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සඳහා සියලුම රාජ්‍ය ආයතන වෙත ලිඛිත දැන්වීම් කිරීම.
- මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ සහ සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි කාර්යාලවල පැමිණිලි මධ්‍යස්ථාන විවෘත කර, වගකිව යුතු නිලධාරීන් පත්කර, පැමිණිලි භාරගැනීම හා ඒ සඳහා ක්ෂණික විසඳුම් ලබාදීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- අපේක්ෂක ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීම.
- මැතිවරණ රාජකාරි සඳහා පත් කරනු ලබන පොලිස් නිලධාරීන්ගේ මඟ පෙන්වීමේ උපදෙස් මාලාවක් පොලිස්පතිවරයා මාර්ගයෙන් ලබාදීම වැනි ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**15.11. නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීම**

2024 සැප්තැම්බර් මස 21 වන දින පැවැති ජනාධිපතිවරණයේ දී නිවේදිත ඡන්ද කාර්යාල යන්න සැලකීමේ දී නිවේදිත යනුවෙන් අදහස් කරනු ලබන්නේ අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරීට හෝ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ට හා කාර්යාලය පිහිටුවනු ලබන පොලිස් බල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිට දැනුම්දීම වන අතර, ඡන්ද කාර්යාල පිහිටුවීම සඳහා නියම කරනු ලබන කොන්දේසිවලට එකඟව පිහිටුවනු ලබන කාර්යාල අවසරලත් නිවේදිත කාර්යාල ලෙස හඳුන්වනු ලැබේ. මෙහි දී ප්‍රධාන වශයෙන් නිවේදිත ඡන්ද කාර්යාල වර්ග, ඒ ඒ නිවේදිත ඡන්ද කාර්යාලවලට අදාළ නෛතික තත්ත්වය පහදාදීම, නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීමට අදාළ උපදෙස් හා ඉල්ලුම් පත්‍ර අඩංගු ලිපියක් මැතිවරණ කොමිෂන් සභාව විසින් සියලුම ජනාධිපති අපේක්ෂකයන් ඇතුළු ඡන්ද නියෝජිතයන් හා බලයලත් නියෝජිතයන් වෙත නිකුත් කරන ලදී. මෙම උපදෙස් ලිපිය හරහා නිවේදිත කාර්යාලවල ප්‍රචාරක පුවරු, ධජ, අපේක්ෂකයාගේ ඡායාරූපය වැනි දෑ ප්‍රදර්ශනය කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර පිළිබඳ දැනුම් දෙනු ලැබූ අතර, බලයේ සිටින කණ්ඩායම් විසින් රජයට අයත් භූමි ප්‍රදේශ, ආයතන වැනි පොදු ස්ථාන මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට අයුතුව යොදාගැනීම වැළැක්වීම සඳහා රජය/ පළාත් සභා/ පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා හෝ මණ්ඩල සතු ගොඩනැගිල්ලක, ඉඩමක, නිල නිවසක, රක්ෂිතයක පෙර කී කිසිඳු කාර්යාලයක් ස්ථාපිත කළ නොහැකි බව දන්වන ලදී. යම්කිසි අපේක්ෂකයකුගේ කාර්යාලයක වෙනත් අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන අයුරින් හෝ අගතියක් වන අයුරින් ප්‍රචාරක කටයුතු කිරීම වැනි නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් ද, සෘජුවම ඡන්ද විමසීම හා සම්බන්ධ රාජ්‍ය ආයතනයක් ආසන්නයේ නිවේදිත ඡන්ද කාර්යාලයක් පිහිටුවීමේ දී අනුගමනය කළ යුතු නියමිත දුර ප්‍රමාණයන් සඳහන් කිරීමෙන් එක් පක්ෂයකට, කණ්ඩායමකට වාසි සහගත තත්ත්වයක් ඇතිවීම හැකිතාක් අවම කිරීමටත් කටයුතු කරන ලදී.

ඉහත සඳහන් කොන්දේසි හා නියම පැනවීමට සිදුව ඇත්තේ ඡන්ද විමසීම් කාලසීමාව තුළ ඡන්ද විමසීම් හා බැඳි ගැටුම්, පහරදීම්, තුවාල කිරීම්, මනුෂ්‍ය ඝාතන හා දේශපාලන පළිගැනීම් වැනි නොමනා ක්‍රියා වැළැක්වීම හා මහජනතාවට ඇති විය හැකි අවහිරතා වැළැක්වීම සඳහා මෙන්ම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය වාතාවරණය ඇති කිරීම සඳහාය.

**15.12. 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත ක්‍රියාත්මක කිරීම**

**15.12.1.** 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 03 වන වගන්තිය ප්‍රකාරව 2024 ජනාධිපතිවරණ ඡන්ද විමසීම සඳහා තරග කරනු ලබන අපේක්ෂකයන් හා ඔවුන්ගේ ඡන්ද නියෝජිතයන් හෝ ඔවුන් නාමයෝජනා කළ තැනැත්තන් සමග මැතිවරණ කොමිෂන් සභාව

සාකච්ඡා කරන ලද අතර, මෙලෙස අපේක්ෂකයන්ගේ සහ ඔවුන් නාමයෝජනා කළ පුද්ගලයන්ගේ අදහස් විමසීමෙන් අනතුරුව ජනාධිපතිවරණය සඳහා තරග කරනු ලබන අපේක්ෂකයන්ගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂයක්, වෙනත් දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයා නාමයෝජනා කළ ලියාපදිංචි ඡන්ද හිමියෙකු සහ අපේක්ෂකයෙකු විසින් වැයකල යුතු වියදම් සීමා මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබ ඒ සම්බන්ධයෙන් 2397/66 හා 2024.08.16 දිනැතිව ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

**15.12.2.** ඒ අනුව තරග කරනු ලබන එක් එක් අපේක්ෂකයෙකු වෙනුවෙන් වලංගු ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි එක් ඡන්ද හිමියෙකු වෙනුවෙන් රුපියල් 109.00 කට නොවැඩි මුදලක් වියදම් කල හැකිය. ඒ අනුව වියදම්කල හැකි උපරිම වියදම් සීමාව රු. 1,868,298,586.00 වේ. එහිදී තරග කරනු ලබන අපේක්ෂකයෙකුට එකී මුදලින් 60% හෙවත් රු.1,120,979,151.60 හා දේශපාලන පක්ෂයකට හෝ නාමයෝජනා කළ ඡන්ද හිමියාට එකී මුදලින් 40% හෙවත් රු. 747,319,434.40 ප්‍රචාරක වියදම් ලෙස වැය කල හැකි බව තිරණය කරන ලදී.

**15.12.3.** මැතිවරණ ප්‍රචාරක වියදම් ඇතුළත් වියදම් වාර්තාව ජනාධිපතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර දින 21 ඇතුළත නාමයෝජනා කල දේශපාලන පක්ෂය හෝ ඡන්ද හිමියා සහ අපේක්ෂකයා විසින් වෙන් වෙන් වශයෙන් සකස් කොට මැතිවරණ කොමිෂන් සභාව වෙත භාරදිය යුතුවේ. මෙම වියදම් වාර්ථා ලැබී දින 10 ඇතුළත, එකී වාර්තා ලැබී ඇති බවත්, ඒවා මැතිවරණ කොමිෂන් සභාවේ දී යම් තැනැත්තෙකුට පරීක්ෂා කර බැලිය හැකි බවත්, අවශ්‍ය අයට එම වාර්තාවල පිටපත් ලබා ගත හැකි ආකාරයත් සඳහන් කරමින් පුවත්පත් දැන්වීමක් පළකරන ලදී.

**15.12.4.** ඒ අනුව නියමිත කාලය තුළ අපේක්ෂකයන් 35 ක් සහ අපේක්ෂකයන් නාමයෝජනා කළ දේශපාලන පක්ෂ හෝ නාමයෝජනා ඉදිරිපත් කළ ලියාපදිංචි ඡන්ද හිමියන් 28 ක් විසින් සිය වියදම් ප්‍රකාශ මැතිවරණ කොමිෂන් සභාව වෙත භාරදෙන ලදී. මෙම වාර්තා ලැබීමෙන් පසු ඒවා සියල්ල පරිලෝකනය කර මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියටද ඇතුළත් කර ඇති අතර, අවශ්‍ය අයෙකුට පරිශීලනය කළ හැක. සිය මැතිවරණ වියදම් වාර්තා නිසි පරිදි භාරදී නොමැති අපේක්ෂකයන් 03 හා අපේක්ෂකයන් නාමයෝජනා කළ දේශපාලන පක්ෂ/ලියාපදිංචි ඡන්ද හිමියන් 10 පිළිබඳව ශ්‍රී ලංකා පොලීසියට පැමිණිලි කිරීමෙන් අනතුරුව ඔවුනට එරෙහිව නීතිමය කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

**15.13. නොමිලේ ගුවන් කාලය වෙන් කිරීම**
තරග කරනු ලබන අපේක්ෂකයන් සඳහා ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ පනතේ 117 (1) වන වගන්තිය අනුව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මඟින් නොමිලයේ ප්‍රචාරණ පහසුකම් ලබාදෙන ලදී. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින්ද සිය ප්‍රතිපත්ති ජනතාව වෙත ඉදිරිපත් කිරීම සඳහා තරග කරනු ලබන අපේක්ෂකයෙකු වෙනුවෙන් පැය 1 ක ගුවන් කාලයක් වෙන්කර දෙන ලදී.

**15.14.** එමෙන්ම, 2024 ජනාධිපතිවරණයට අදාළව සිදු කළයුතු ඉදිරි කටයුතු පිළිබඳව උපදෙස්/ චක්‍රලේඛ සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් හා නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත යැවීමට කටයුතු කරන ලද අතර, මෙම මූලික කටයුතුවලට සහායවීම සඳහා මැතිවරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලය ඇතුළු සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට අවශ්‍ය වන ප්‍රමාණයට විශ්‍රාමික නිලධරයන්/ අනියම් සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරන ලදී. එසේම, මැතිවරණය පැවැත්වීමේ කටයුතු සඳහා අවශ්‍ය වන සියලුම ලිපි ලේඛන/ ආකෘති ද මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී. එසේම ඡන්ද විමසීම්, ඡන්ද ගණන් කිරීම් හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීම් සම්බන්ධ සියලුම ලිපි ලේඛන/ ඡන්ද පත්‍රිකා/ කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි/ ඡන්ද

කුටි ඒ ඒ අංශය මඟින් නියමිත දින වකවානුව තුළ සියලුම දිස්ත්‍රික් කාර්යාලවලට ලබාදීමට කටයුතු කරන ලදී.

**15.15.** ඡන්ද විමසීම හා ගණන් කිරීමේ කාර්යය සඳහා රජයේ දෙපාර්තමේන්තු/ ආයතනවල සේවයේ නියුතු නියමිත සුදුසුකම් සපුරන ලද රාජ්‍ය නිලධාරීන් යොදවනු ලැබීය. ඡන්ද ගණන් කිරීම ගණන් කිරීමේ පරිශ්‍ර 49 කදී ගණන් කිරීමේ මධ්‍යස්ථාන 1713 කදී සිදුකරන ලද අතර, එම සංඛ්‍යාවෙන් 439ක් තැපැල් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන විය.

**15.16.** ඡන්ද විමසීමේ සහ ඡන්ද ගණන් කිරීමේ කටයුතු නිරීක්ෂණය සඳහා දේශීය/ විදේශීය නිරීක්ෂණ ආයතන සඳහා ද අවස්ථාව සලසා දෙන ලදී.

**15.16.1.** දේශීය නිරීක්ෂණ සංවිධාන අතරින් නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PEFERAL) හා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) ඡන්ද පොළ අවට මෙන්ම ඡන්දපොළ තුළ ද නිරීක්ෂකයන් රඳවා තබමින් නිරීක්ෂණ කටයුතු කිරීමට අවසර ලබාදුන් අතර, තවත් දේශීය නිරීක්ෂණ සංවිධාන අටක් ඡන්ද පොළින් පිටත සිට නිරීක්ෂණ කටයුතු කිරීමට අවස්ථාව සලසන ලදී. ජනාධිපතිවරණයේ දී තේරීම්භාර නිලධාරී කාර්යාලවලදී ඡන්ද ගණන් කිරීමේ කටයුතු මෙන්ම ප්‍රතිඵල වගුගත කිරීමේ කටයුතු නිරීක්ෂණයට ද නිරීක්ෂණ සංවිධානවලට ඉඩසලසන ලදී. ඊට පරිබාහිරව මැතිවරණ කොමිෂන් සභාවේ අවසන් ප්‍රතිඵලය සකස් කිරීමේ කටයුතු නිරීක්ෂණයට ද නිරීක්ෂණ සංවිධානවලට අවසර ලබාදෙන ලදී.

**15.16.2.** විදේශීය නිරීක්ෂණ සංවිධාන වශයෙන් ඉන්දියාව, රුසියාව, පිලිපීනය, භූතානය, මාලදිවයින, බංගලාදේශය සහ නේපාලය යන රටවලින් නිරීක්ෂකයන් සෘජුවම මැතිවරණ කොමිෂන් සභාවේ සම්බන්ධීකරණයෙන් සහභාගී විය. යුරෝපා සංගමය, ආසියානු මැතිවරණ නිරීක්ෂණ ජාලය හා පොදුරාජ්‍ය මණ්ඩලීය නිරීක්ෂණ කණ්ඩායම් ඡන්ද විමසීම් දිනයට පූර්වයේ සිටම තම නිරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී. ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කළ අවස්ථාවේ සිටම එම සංවිධාන නියෝජනය කරමින් දිගුකාලීන නිරීක්ෂකයන් මෙරට රැඳීසිටි අතර, ඡන්ද විමසීම් දිනය ආසන්න වනවිට එම නිරීක්ෂකයන් ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිකරන ලදී.

**15.17.** ජනාධිපති ධූර අපේක්ෂකයෙකු ලෙස නාමයෝජනා භාරදෙන ලද, අයිඩෲස් මොහමඩ් ඉල්යාස් මහතා 2024 අගෝස්තු මස 22 දින මිය ගිය අතර, එම අපේක්ෂකයා නාමයෝජනා කළ තැනැත්තා වන කේ.එම්.එන්. සංජය සම්පත් රේමන් මහතා වෙත වෙනත් අපේක්ෂකයෙකු නාමයෝජනා කරන ලෙස 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 22 (1) උපවගන්තිය අනුව විධාන කළ ද, වෙනත් අපේක්ෂකයෙකු නාමයෝජනා කිරීමට කටයුතු කර නොමැති බැවින්, පනතේ 22(1) (ආ) උප වගන්තිය අනුව ඡන්ද පත්‍රිකාව සහ ඡන්ද විමසීමට අදාළ සෙසු සියලු ලේඛනවලින් මියගිය අපේක්ෂකයාගේ නම ඉවත් කරනු ලැබ ඇත්තාක් මෙන් සලකණු ලැබූ අතර අයිඩෲස් මොහමඩ් ඉල්යාස් මහතාට ඡන්දය ලකුණු කර ඇත්නම්, එය ප්‍රතික්ෂේපිත ඡන්දයක් ලෙස සලකා කටයුතු කරන ලෙස සියළුම ගණන් කිරීමේ නිලධාරීන් දැනුම්වත් කරන ලදී.

**15.18.** ඡන්ද විමසීම සඳහා අවශ්‍ය බඩුබාහිරාදිය සහ නිලධාරීන් ඡන්ද මධ්‍යස්ථාන වෙත පිටත්කර යැවීම 2024 සැප්තැම්බර් මස 20 දින සිදුකරන ලද අතර, ඊට පසු දින එනම්, 2024 සැප්තැම්බර් මස 21 දින ඡන්ද විමසීම අවසන් කොට ඡන්ද පෙට්ටි සියල්ල ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙත ලැබීමෙන් පසුව මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ඡන්ද ගණන් කිරීමට අදාළ කටයුතු සිදුකොට ප්‍රතිඵලය මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම තේරීම්භාර නිලධාරීන්ගේ වගකීම විය. දිස්ත්‍රික්

තේරීම්භාර නිලධාරීන් විසින් ඡන්ද ප්‍රදේශ මට්ටමේ සහ දිස්ත්‍රික් මට්ටමේ ප්‍රතිඵලය අතින් සකස් කර එය පරිලෝකණය කර උඩුගත කිරීම හා මැතිවරණ කොමිෂන් සභාවේ පරිගණක පද්ධතියට දත්ත ඇතුළත්කිරීම මගින් යන දෙයාකාරයෙන්ම මැතිවරණ කොමිෂන් සභාව වෙත ප්‍රතිඵලය සම්ප්‍රේශනය කරන ලදී. එසේම තේරීම්භාර නිලධාරීන්ගෙන් ලැබෙන ඡන්ද ගණන් කිරීමේ ශාලා මට්ටමේ ප්‍රතිඵලය තුළින්, ඡන්ද ප්‍රදේශ මට්ටමින් ප්‍රතිඵලය හා දිස්ත්‍රික් ප්‍රතිඵලය සැකසීම මැතිවරණ කොමිෂන් සභාවේ දී ද සිදුකරන ලදී.

මෙම ජනාධිපතිවරණයේ දී මැතිවරණ කොමිෂන් සභාවේ දී ප්‍රතිඵල වගුගත කිරීම, මාණ්ඩලික නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් විසින් ප්‍රතිඵලය අතින් සැකසීම, දිස්ත්‍රික්ක මගින් ප්‍රතිඵල ලේඛන පරිලෝකණය කර ගෙන්වාගෙන මැතිවරණ කොමිෂන් සභාවේ පරිගණක අංශයෙන් ප්‍රතිඵල සැකසීම හා MS-Excel හරහා ප්‍රතිඵල සැකසීම යන තුන් ආකාරයකින් ප්‍රතිඵල සකස් කිරීම සිදු කරන ලදී. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාවේ අංශ තුනකින් පිළියෙල කරන ලද ප්‍රතිඵල ලේඛන හා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් එවන ලද අවසන් ප්‍රතිඵලය පරීක්ෂා කරමින්, එම සිව් ආකාරයේ ප්‍රතිඵලය සමාන වේ නම් පමණක් ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් දිස්ත්‍රික් මට්ටමේ දී ඡන්ද ප්‍රදේශ හා දිස්ත්‍රික් අවසන් ප්‍රතිඵලය මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය ලද පසු ප්‍රචාරණය කරනු ලැබූ අතර, ප්‍රතිඵල නිවැරදි බවට තහවුරු කරගැනීමෙන් පසු මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ප්‍රතිඵලය රූපවාහිනී හා ගුවන්විදුලි මාධ්‍ය මඟින් ප්‍රචාරය කිරීමට ද කටයුතු කරන ලදී.

**15.19.** ඉහත කී ආකාරයෙන් මැතිවරණ කොට්ඨාස 22 කට අදාළ ප්‍රතිඵල ලේඛන ලැබීමෙන් පසුව එක් එක් අපේක්ෂකයාගේ වාසියට දී ඇති ඡන්ද සංඛ්‍යාව මැතිවරණ කොමිෂන් සභාව විසින් ගණන් බලා, ජනාධිපතිවරයා ලෙස තේරීපත්වන අපේක්ෂකයා කවුරුන්ද යන්න මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කළ යුතු විය. මෙම ඡන්ද විමසීමේ දී සියලුම මැතිවරණ කොට්ඨාසවලින් ප්‍රකාශ කරන ලද වලංගු ඡන්දවලින් එක් අඩකට වැඩි සංඛ්‍යාවක් කිසිම අපේක්ෂකයෙකුට නොලැබී ඇති බව තහවුරු වූ පසුව ඒ අවස්ථාවේ දී මැතිවරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේ අවසන් ප්‍රතිඵල සැකසුම් මධ්‍යස්ථානයේ සිටි අපේක්ෂකයන්ගේ නියෝජිතයන් සමග මැතිවරණ කොමිෂන් සභාව සාකච්ඡා කර, ඉතාම වැඩි ඡන්ද සංඛ්‍යාව ලබාගත් අනුර කුමාර දිසානායක මහතා සහ ඊළඟට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් සජිත් ප්‍රේමදාස මහතා හැර අනෙක් අපේක්ෂකයන් තරගයෙන් ඉවත් කර, තරඟයෙන් ඉවත් කරනු ලැබූ අපේක්ෂකයන්ගේ දෙවන හා තුන්වන මනාපයේ තරගයේ සිටින අපේක්ෂකයන්ට වාසියට ලබාදී ඇත්ද යන්න ගණනය කිරීම සිදුකරන ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත නියෝග කරන ලදී.

**15.20.** ඉතිහාසයේ ප්‍රථම වතාවට 2024 ජනාධිපතිවරණයට අදාළව දෙවන මනාප ගණන් කිරීම සිදුවිය. ඒ අනුව මුල්වටයේ ප්‍රතිඵලය හා එක් එක් ගණන් කිරීමේ ශාලාවේ මනාප ගණනය කිරීමෙන් පසු ලබාගත් ඡන්ද සංඛ්‍යාව එයට එකතුකර ලබාගත් අවසන් ප්‍රතිඵලය ගණනය කිරීමෙන් අනතුරුව, 1981 අංක 15 දරන ජනාපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 64 (2) වගන්තිය අනුව ඡන්ද 5,634,915 (42.31%) ලබාගත් අනුර කුමාර දිසානායක මහතා ජනාධිපතිවරයා ලෙස තෝරාපත් කර ගනු ලැබූ බව 2024 සැප්තැම්බර් මස 22 දින මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති විසින් මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ප්‍රකාශ කරන ලදී. අපේක්ෂක අනුර කුමාර දිසානායක මහතා ජනාධිපතිවරයා ලෙස තෝරාපත්කර ගත් බවට වූ නිවේදනය ඇතුලත් 2024.09.22 දින අංක: 2402/26 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය එදිනම පළ කරන ලදී.

## 16. පාර්ලිමේන්තු මැතිවරණය - 2024.11.14

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දහවැනි පාර්ලිමේන්තු මැතිවරණය 2024 නොවැම්බර් 14 වැනි දින පෙරවරු 7.00 සිට පස්වරු 4.00 දක්වා ඡන්ද මධ්‍යස්ථාන 13,421 කදී සිදු කරන ලදී.

**16.1.** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලැබී ඇති බලතල අනුව අතිගරු ජනාධිපතිතුමා විසින් 2024.09.24 දිනැති අංක: 2403/13 දරන ගැසට් නිවේදනය මඟින් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී. ඒ අනුව පාර්ලිමේන්තු මැතිවරණය 2024.11.14 දින පැවැත්වීමටත්, අභිනව පාර්ලිමේන්තුව 2024.11.21 දින රැස්වීම සඳහා කැඳවන බවට ප්‍රකාශයට පත්කිරීමත් සමඟ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට අදාළ මූලික කටයුතු සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී.

**16.2.** පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ නිවේදනය ප්‍රකාශයට පත්කරන අවස්ථාව වනවිට වලංගුව පැවති 2024 ප්‍රධාන නාමලේඛනය හා 2024 පළමු පරිපූරක නාමලේඛනය අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව යටතේ තෝරාපත්කර ගත යුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව පිළිබඳ නියමය මැතිවරණ කොමිෂන් සභාව විසින් අංක 2393/26 හා 2024.07.17 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකර තිබුනි. එම ගැසට් පත්‍රයේ සඳහන් මන්ත්‍රී සංඛ්‍යාව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙන් තෝරාගත යුතු විය.

**16.3.** පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ නාමයෝජනා ක්‍රියාවලිය සම්බන්ධයෙන් අංක 2403/13 හා 2024.09.24 දිනැති ගැසට් පත්‍රය මඟින් එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා නාමයෝජනා පත්‍රයට ඇතුළත් කළ යුතු අපේක්ෂක සංඛ්‍යාව හා ස්වාධීන කණ්ඩායම් විසින් ඇප තැන්පත් කළ යුතු තොරතුරු සහිතව ගැසට් පත්‍රයක් පළකරන ලදී. එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී හැටියට නාමයෝජනා භාරගනු ලබන බව හා පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත යාපනය මැතිවරණ කොට්ඨාසය (යාපනය හා කිලිනොච්චිය) වෙනුවෙන් යාපනය දිස්ත්‍රික් ලේකම්වරයාද, පරිපාලන දිස්ත්‍රික්ක තුනකින් සමන්විත (වවුනියාව, මන්නාරම හා මුලතිව්) වන්නි මැතිවරණ කොට්ඨාසය සඳහා වවුනියාව දිස්ත්‍රික් ලේකම්වරයාද, නාමයෝජනා භාරගනු ලබන බවට වන නිවේදනය අංක 2403/13 හා 2024.09.24 දිනැති ගැසට් පත්‍රයේ පළකරන ලදී.

**16.4.** දිවයිනේ මැතිවරණ කොට්ඨාස 22ක තේරීම්භාර නිලධාරී කාර්යාලයේ දී 2024.09.24 සිට 2024.10.11 දින මධ්‍යාහ්න 12.00 දක්වා ඇප තැන්පත් භාර ගැනීමට කටයුතු කරන ලද අතර, පාර්ලිමේන්තු මැතිවරණය සඳහා 2024.10.04 සිට 2024.10.11 දින මධ්‍යාහ්න 12.00 දක්වා කාර්යාල දිනවලදී තේරීම්භාර නිලධාරීන් විසින් නාමයෝජනා භාර ගැනීමට කටයුතු කරන ලදී. නාමයෝජනා පත්‍රවල විරෝධතා දැක්වීම සඳහා 2024.10.11 දින මධ්‍යාහ්න 12.00 සිට පස්වරු 1.30 දක්වා කාලය තුළ අවස්ථාව ලබාදෙන ලදී.

**16.5.** නාමයෝජනා භාර ගැනීමේ කටයුතු 2024.10.11 දින මධ්‍යාහ්න 12.00ට අවසන් කරන ලද අතර, මැතිවරණ කොට්ඨාස 22 වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂ 49 කින් නාමයෝජනා පත්‍ර 443 ක් භාරදී තිබුණි. ස්වාධීන කණ්ඩායම් 316 කින් නාමයෝජනා පත්‍ර 316 ක් භාර දී තිබුණි. ඒ අනුව මුළු නාමයෝජනා පත්‍ර 759 ක් අදාල තේරීම්භාර නිලධාරීන් වෙත ලැබුණු අතර, එයින් පිළිගත් දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කළ නාමයෝජනා පත්‍ර 36 ක් පනතේ විධිවිධාන අනුව ඉදිරිපත් කර නොතිබූ බැවින් ප්‍රතික්ෂේප කළ අතර ඒ අනුව පිළිගත් නාමයෝජනා පත්‍ර

ගණන 407 විය. ස්වාධීන කණ්ඩායම් විසින් ඉදිරිපත්කල නාමයෝජනා පත්‍ර 34 ක් පනතේ විධිවිධාන අනුව ඉදිරිපත් කර නොතිබූ බැවින් ප්‍රතික්ෂේප කළ අතර, පිළිගත් නාමයෝජනා පත්‍ර ගණන 282 ක් විය. ඒ අනුව නාමයෝජනා පත්‍ර 689 ක් පිළිගන්නා ලද අතර නාමයෝජනා 70 ක් ප්‍රතික්ෂේප කරන ලදී. 2024 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා පිළිගත් දේශපාලන පක්ෂ නියෝජනය කරමින් අපේක්ෂකයන් 5006 ක්ද, ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරමින් අපේක්ෂකයන් 3346 ක්ද ලෙස, තරග කරනු ලබන මුළු අපේක්ෂක සංඛ්‍යාව 8352කි. 2024.11.14 දින පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන බව අංක 2403/13 හා 22024.09.24 දිනැති ගැසට් පත්‍රයෙන් නිවේදනය කරන ලදී.

**16.6.** කොළඹ, වන්නි හා කෑගල්ල මැතිවරණ දිස්ත්‍රික්කවල නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමට අදාළව අදාල පාර්ශ්ව විසින් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර, ඒ අතරින් වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයට අදාළව ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය පක්ෂය විසින් ඉදිරිපත් කළ නාමයෝජනාව නැවත පිළිගන්නා ලෙස ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝග කළ බැවින්, එම නාමයෝජනාව පිළිගැනීමට සිදුවිය. එබැවින් පිළිගත් සම්පූර්ණ නාමයෝජනා පත්‍ර ගණන 690 හා තරග කරනු ලබන මුළු අපේක්ෂකයන් සංඛ්‍යාව 8361 ක් වේ.

**16.7.** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 අ ව්‍යවස්ථාව අනුව ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූර සඳහා පිළිගත් දේශපාලන පක්ෂ 27කින් අපේක්ෂකයන් 516 ක් හා ස්වාධීන කණ්ඩායම් 2කින් අපේක්ෂකයන් 11ක් ලෙස සම්පූර්ණ අපේක්ෂකයින් 527 දෙනෙකුගේ නම් ලැයිස්තු 2024.10.11 දින මධ්‍යාහ්න 12.00 වනවිට මැතිවරණ කොමිෂන් සභාවට භාර දී ඇති අතර, එම ජාතික ලැයිස්තු නාමයෝජනා පිළිබඳව අංක අංක: 2405/51 හා 2024.10.11 දිනැති ගැසට් පත්‍රය මහින් තොරතුරු පළකර ඇත.

**16.8.** මෙවර බොහෝ මැතිවරණ කොට්ඨාස සඳහා පසුගිය පාර්ලිමේන්තු මැතිවරණවලට සාපේක්ෂව වැඩි නාමයෝජනා පත්‍ර සංඛ්‍යාවක් ලැබී තිබූ අතර, දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාසය සඳහා නාමයෝජනා පත්‍ර 63 ලැබී තිබුනි. ඒ අනුව ඡන්ද පත්‍රිකාව මුද්‍රණය කිරීමේදී ඡන්ද පත්‍රිකාව දිගින් වැඩිවීම නිසා සිදුවන අපහසුතාවන් වැලැක්වීම සඳහා එක් මැතිවරණ කොට්ඨාසයක් සඳහා නාමයෝජනා පත්‍ර 20 ට වැඩි ප්‍රමාණයක් ලැබී ඇති අවස්ථාවලදී දේශපාලන පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල නම් පේලි දෙකක් ලෙස මුද්‍රණය කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී. ඡන්ද පත්‍රිකාව තනි පේලියක් ලෙස මුද්‍රණය කරනු ලැබූයේ පොළොන්නරුව, මොනරාගල හා කෑගල්ල මැතිවරණ කොට්ඨාසවල පමනි. එමෙන්ම පසුගිය 2024 ජනාධිපතිවරණයේ දී කටයුතු කළ ආකාරය අනුව ලබාගත් අත්දැකීම් ද පදනම් කරගෙන පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ද දේශපාලන පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල පිළිගත් නාමයෝජනා පත්‍ර සංඛ්‍යාව අනුව ඡන්ද පත්‍රිකාවේ විශාලත්වය සැලකිල්ලට ගනිමින් මෙවර ද කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි ඡන්ද පොළ වෙත ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

**16.9.** 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127 වගන්තිය අනුව පූර්වයෙන් පවත්වනු ලද පාර්ලමේන්තු මැතිවරණයේ දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට එකට නොඅඩු ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් කවර හෝ පිළිගත් දේශපාලන පක්ෂයක් අදාල මැතිවරණයේදී ඒ මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් නාම යෝජනා පත්‍රයක් භාරදී ඇත්නම්, එම පිළිගත් දේශපාලන පක්ෂයට රජයේ ප්‍රදානයක් වශයෙන් මුදල් ආධාර ලබාගැනීමට හිමිකම ඇත්තේය. එම මුදල එම පක්ෂය විසින් ලබාගන්නා ලද එක් ඡන්දයකට ශත 50 බැගින් ගණන් බලන ලද මුදලකි. ඒ අනුව 2024 පාර්ලිමේන්තු මැතිවරණයේ දී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂයට රජයේ මුදල් ආධාර ලබා ගැනීමට ඉල්ලුම් කළ අතර, එම

පක්ෂය වෙනුවෙන් ගෙවන ලද මුළු මුදල රුපියල් 3,426,846.50 කි. හිමිකම ඇති සෙසු දේශපාලන පක්ෂ ඉල්ලුම් කර නොතිබුනි.

**16.10. තැපැල් ඡන්ද කටයුතු**

**16.10.1.** 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 26(1) වගන්තිය අනුව තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම 2024.10.10 දින දක්වා සිදුකරන ලදී. නියමිත කාලය තුළ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව 759083 ක් වූ අතර එයින් පිළිගනු ලැබූයේ 737902 ක් පමණි. තැපැල් ඡන්ද ලැයිස්තු සහතික කිරීමේ කටයුතු 2024.10.16 දින සිදුකරන ලදී.

**16.10.2.** පිළිගත් තැපැල් ඡන්දහිමියන් වෙත ඡන්ද පත්‍රිකා අඩංගු රක්ෂිත කවර නිකුත් කිරීම/ තැපෑලට භාරදීම 2024.10.23 වන්නි හා කොළඹ මැතිවරණ දිස්ත්‍රික්ක හැර සෙසු දිස්ත්‍රික්කවල සිදුකරන ලදී. නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමට අදාළ අධිකරණයේ නඩු විභාග වෙමින් පැවතීම හේතුවෙන් කොළඹ හා වන්නි මැතිවරණ දිස්ත්‍රික්කවල තැපැල් ඡන්ද නිකුත් කිරීම 2024.10.25 දින සිදුකරන ලදී.

**16.10.3.** තැපැල් ඡන්ද සලකුණු කිරීම 2024.10.30, 2024.11.01 සහ 2024.11.04 දිනවල දී සිදුකළ අතර, සලකුණු නොකරන ලද තැපැල් ඡන්ද සඳහා 2024.11.07 හා 2024.11.08 යන දිනවල දී සිදුකරන ලදී.

**16.11.** 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 27 වගන්තියට අනුව ලියාපදිංචි සියලුම ඡන්දහිමියන් වෙත නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් යැවිය යුතු වේ. ඒ අනුව ඡන්දහිමියන්ගේ ලියාපදිංචි විස්තර හා ඡන්දපොළට අදාළ විස්තර සටහන් කරන ලද නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා ඡන්දදායකයන් වෙත බෙදා හැරීම සඳහා 2024.10.26 දින තැපැල් දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදී. තවද, ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්ද හිමියන්ගේ නම් වලට අදාළව නිල ඡන්ද දැන්වීම් පත්වල මුද්‍රා තබා භාරදෙන ලදී. ඡන්ද පොළ භාර ජොෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත ලබා දී තිබූ ඡන්දහිමි නාමලේඛනවලද තැපැල් ඡන්දහිමියන්ගේ විස්තර සටහන් කර යවන ලද අතර, ඒ තුළින් හොර ඡන්ද දැමීම වැළැක්වීම අපේක්ෂා කරන ලදී. නිල ඡන්ද දැන්වීම් පත සමග අපේක්ෂකයන්ගේ මනාප අංක ඇතුළත් ලේඛනයක්ද බෙදාහරින ලදී. නිල ඡන්ද දැන්වීම් පත් බෙදීමේ විශේෂ දින ලෙස 2024.10.27 හා 2024.11.01 දින වෙන්කළ අතර, 2024.11.07 දින අවසන් බෙදීම සිදුකරන ලදී.

**16.12. 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත ක්‍රියාත්මක කිරීම**

**16.12.1.** 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත පිළිබඳව 2024 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂවල බලයලත් නියෝජිතයන් මගින් හා ස්වාධීන කණ්ඩායම් නායකයන් මගින් අදාල අපේක්ෂකයන් නාමයෝජනා තීරණ දැනුම් දෙන අවස්ථාවේ දී දැනුම්වත් කරන ලදී. පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් සමග මැතිවරණ කොමිෂන් සභාව විසින් සාකච්ඡා කර අවම මුදල විමසන ලද අතර, අදාල තේරීම්භාර නිලධාරීන් විසින් ස්වාධීන කණ්ඩායම් නායකයන් විමසා අදාල තොරතුරු මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කරන ලදී. එම කරුණු ද සැලකිල්ලට ගෙන එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් ලියාපදිංචි එක් ඡන්ද දායකයෙකු වෙනුවෙන් එක් එක් අපේක්ෂකයාට වියදම් කළ හැකි මුදල හා එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් ලියාපදිංචි එක් ඡන්ද දායකයෙකු වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂයකට/ ස්වාධීන කණ්ඩායමකට වියදම් කළ හැකි මුදල මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණ කර අදාළ මුදල 2406/03 අංක හා 2024.10.15 දිනැති ගැසට් පත්‍රයේ පළකරන ලදී.

**16.12.2** මැතිවරණ වියදම් ඇතුළත් වියදම් වාර්තාව පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර දින 21 ඇතුළත නාමයෝජනා ඉදිරිපත් කළ දේශපාලන

පක්ෂයක නම්, පක්ෂයේ ලේකම්රයා හෝ ස්වාධීන කණ්ඩායමක නම්, කණ්ඩායම් නායකයා විසින් හා එක් එක් අපේක්ෂකයා වෙන වෙනම සකස් කොට සහතික කර අදාල තේරීම්භාර නිලධාරීන් වෙත භාරදිය යුතුවේ. මෙම වියදම් වාර්ථා ලැබී දින 10 ඇතුළත, එකී වාර්ථා ලැබී ඇති බවත්, ඒවා අදාල තේරීම්භාර නිලධාරීගේ කාර්යාලයේ දී යම් තැනැත්තෙකුට පරීක්ෂාකර බැලිය හැකි බවත්, එම වාර්තාවල පිටපත් ලබා ගත හැකි ආකාරයත් සඳහන් කරමින් දැන්වීමක් පළකරන ලදී.

**16.12.3.** ඒ අනුව නියමිත කාලය තුළ අපේක්ෂකයන් 8361 අතරින් අපේක්ෂකයන් 7505 දෙනෙකු විසින් හා නාමයෝජනා ඉදිරිපත්කල දේශපාලන පක්ෂ ලේකම්වරුන්/ ස්වාධීන කණ්ඩායම් නායකයන් 690 අතරින් දේශපාලන පක්ෂ ලේකම්වරුන්/ ස්වාධීන කණ්ඩායම් නායකයන් 556 විසින් සහ ජාතික ලැයිස්තු අපේක්ෂකයන් 527 අතරින් අපේක්ෂකයන් 453 දෙනෙකු විසින් සිය වියදම් ප්‍රකාශ මැතිවරණ කොමිෂන් සභාව වෙත භාරදෙන ලදී. මෙම වාර්තා ලැබීමෙන් පසු ඒවා සියල්ල පරිලෝකනය කර මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියට ද ඇතුළත් කර ඇති අතර අවශ්‍ය අයට ඒවා පරිශීලනය කළ හැක.

**16.12.4.** සිය මැතිවරණ වියදම් වාර්තා නිසි පරිදි භාරදී නොමැති අපේක්ෂකයන් 856 ක්, දේශපාලන පක්ෂ ලේකම්වරුන්/ ස්වාධීන කණ්ඩායම් නායකයන් 134 ක් සහ ජාතික ලැයිස්තු අපේක්ෂකයන් 74 ක් පිළිබඳව පොලීසියට පැමිණිලි කිරීමට කටයුතු කර ඇත.

### 16.13. මැතිවරණ නිරීක්‍ෂණ කටයුතු

#### 16.13.1. දේශීය නිරීක්‍ෂණ කණ්ඩායම්

2024.11.14 දින පැවති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීමේ මැතිවරණයේ නිරීක්‍ෂණ කටයුතු සඳහා ද ජනාධිපතිවරණයේදී අවසර ලබාදුන් ආකාරයටමනිරීක්‍ෂණ කටයුතු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් අවසර ලබා දෙන ලදී.

#### 16.13.2. විදේශීය නිරීක්‍ෂණ කණ්ඩායම්

2024.11.14 දින පවත්වන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීමේ මැතිවරණය නිරීක්‍ෂණය කිරීමට මැතිවරණ කොමිෂන් සභාවේ ආරාධනයෙන් රටවල් කිහිපයකින් විදේශීය මැතිවරණ නිරීක්‍ෂකයන් සහභාගී වන ලදී. එයට අමතරව යුරෝපා සංගමය, පොදු රාජ්‍ය මණ්ඩලීය නිරීක්ෂක කණ්ඩායම් සීමිත නිරීක්ෂකයන් පිරිසක් යොදවාගෙන ස්වාධීනව සිය නිරීක්ෂණ කටයුතු පවත්වාගෙන යන ලදී.

### 16.14. 1988 අංක 15 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධි විධාන ප්‍රකාරව වෙනත් ඡන්ද පොළක දී ඡන්ද දීමේ පහසුකම් සැපයීම.

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127 ආ(1) වගන්තිය ප්‍රකාරව තමාගේ ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතු කොට ගෙන එම ඡන්ද පොළේ දී තමාගේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති යම් ලියාපදිංචි ඡන්දහිමියෙකුට තමාගේ ඡන්දය මැතිවරණ කොමිෂන් සභාව තම අභිමතය පරිදි තීරණය කරනු ලබන්නා වූ වෙනත් ඡන්ද පොළක දී ලබා දීමට අවසර දෙන ලෙස ඉල්ලමින් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉල්ලුම් පත්‍රයක්, නාමයෝජනා දැන්වීමෙන් එක් සතියක් ඇතුළත දී ඉදිරිපත් කළ හැකි බව අංක: 2403/23 හා 2024.09.25 දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරන ලදී. ඒ අනුව 2024 ඔක්තෝබර් මස 01 දින හෝ ඊට පෙර මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය වෙත අයදුම්පත්‍ර 02 ක් ලැබී තිබූ අතර, ඒවා සියල්ල නිසිපරිදි ඉදිරිපත් කර නොතිබූ බැවින් ප්‍රතික්ෂේප කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

## 16.15. නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීම

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73 වගන්තිය යටතේ, අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරීට හෝ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ට හා කාර්යාලය පිහිටුවනු ලබන පොලිස් බල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිට දැනුම්දී ඡන්ද කාර්යාල පිහිටුවීම සඳහා නියම කරනු ලබන කොන්දේසිවලට එකඟව පිහිටුවනු ලබන කාර්යාල, අවසරලත් නිවේදිත කාර්යාල ලෙස හඳුන්වනු ලැබේ. ඒ අනුව පවත්වාගෙන යා හැකි ඡන්ද කාර්යාල සම්බන්ධයෙන් වූ විධිවිධාන අනුව පවත්වාගෙන යා හැකියාව අත්තේ මැතිවරණ ප්‍රචාරක කාර්යාල වර්ග හතරක් (4) සඳහා පමණක් වන අතර, එවැනි කාර්යාල පිහිටුවීමට බලය ඇති අය, කාර්යාල පවත්වාගෙන යා හැකි කාලය, කාර්යාල පිහිටුවිය හැකි බල ප්‍රදේශය, පිහිටුවිය හැකි කාර්යාල ගණන ඇතුළත් ලේඛනයක් සකස් කර තරඟකරන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් අතර බෙදා හරින ලදී. ඉහත සඳහන් කොන්දේසි හා නියම පැනවීමට සිදුව ඇත්තේ ඡන්ද විමසීම් කාලසීමාව තුළ ඡන්ද විමසීම් හා බැඳි ගැටුම්, පහරදීම්, තුවාල කිරීම්, මනුෂ්‍ය ඝාතන හා දේශපාලන පළිගැනීම් වැනි නොමනා ක්‍රියා වැළැක්වීම හා මහජනතාවට ඇති විය හැකි අවහිරතා වැළැක්වීම සඳහා මෙන්ම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය වාතාවරණය ඇති කිරීම සඳහාත්ය.

## 16.16. ආරක්ෂක කටයුතු

ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත්කළ අවස්ථාවේ සිට ඡන්ද විමසීම අවසන්ව ප්‍රතිඵල ප්‍රකාශ කොට, සතියක කාලයක් ගතවන තෙක්ම ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීමේ වගකීම මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත පොලිස්පතිවරයා වෙත පැවරේ. ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම සඳහා මැතිවරණය ප්‍රකාශයට පත්කිරීමත් සමඟම, මැතිරණ කොමිෂන් සභා කාර්යාලයේ මෙන්ම, දිස්ත්‍රික් මට්ටමින් ද, පැමිණිලි විමර්ශන ඒකක පිහිටුවීම සිදු කරන ලදී. මීට අමතරව දිස්ත්‍රික්කයේ විශාලත්වය සහ විශේෂ ආරක්ෂාවක් ලබාදිය යුතුව ඇතැයි තීරණය කරනු ලබන ප්‍රදේශ කේන්ද්‍ර කොට ගෙන අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හෝ වෙනත් රාජ්‍ය අයතනවල විශේෂ සම්බන්ධීකරණ ඒකක පිහිටුවීමට ද පියවර ගන්නා ලදී.

**16.17.** 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර වශයෙන්, සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත මාධ්‍ය උපමාන නිකුත් කිරීම. රාජ්‍ය සම්පත් අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සඳහා සියලුම රාජ්‍ය ආයතන වෙත ලිඛිත දැන්වීම් කිරීම. මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ සහ සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි කාර්යාලවල පැමිණිලි මධ්‍යස්ථාන විවෘත කර, වගකිව යුතු නිලධාරීන් පත්කර, පැමිණිලි භාරගැනීම හා ඒ සඳහා ක්ෂණික විසඳුම් ලබාදීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම. අපේක්ෂක ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීම. මැතිවරණ රාජකාරී සඳහා පත් කරනු ලබන පොලිස් නිලධාරීන්ගේ මඟ පෙන්වීමේ උපදෙස් මාලාවක් පොලිස්පතිවරයා මාර්ගයෙන් ලබාදීම වැනි ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**16.18.** එමෙන්ම, ඡන්ද පොළ හා ඡන්ද ගණන් කිරීමේ කටයුතුවල ආරක්ෂාව සඳහා පොලිස් නිලධරයන් යොදාගන්නා ලද අතර, සාපේක්ෂව පූර්ව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අවම මැතිවරණයක් ලෙස 2024 පාර්ලිමේන්තු මැතිවරණය ඉතිහාසයට එක්වේ. මැතිවරණ දිනය දක්වා ජාතික මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානයට පැමිණිලි 1206 හා දිස්ත්‍රික් මැතිවරණ පැමිණිලි කලමනාකරණ

මධ්‍යස්ථානවෙත පැමිණිලි 2616 ලෙස සමස්ත පැමිණිලි 3822 ලැබී තිබුනි.

**16.19.** එමෙන්ම, 2024 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව සිදු කළයුතු ඉදිරි කටයුතු පිළිබඳව උපදෙස්/ චක්‍රලේඛ සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් හා නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත යැවීමට කටයුතු කරන ලද අතර, මෙම මූලික කටයුතුවලට සහායවීම සඳහා මැතිවරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලය ඇතුළු සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට අවශ්‍ය වන ප්‍රමාණයට විශ්‍රාමික නිලධරයන්/ අනියම් සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරන ලදී. එසේම, මැතිවරණය පැවැත්වීමේ කටයුතු සඳහා අවශ්‍ය වන සියලුම ලිපි ලේඛන/ ආකෘති ද මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී. එසේම ඡන්ද විමසීම්, ඡන්ද ගණන් කිරීම් හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීම් සම්බන්ධ සියලුම ලිපි ලේඛන/ ඡන්ද පත්‍රිකා/ කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි/ ඡන්ද කුටි ඒ ඒ අංශය මඟින් නියමිත දින වකවානුව තුළ සියලුම දිස්ත්‍රික් කාර්යාලවලට ලබාදීමට කටයුතු කරන ලද අතර, 2024 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව දිවයිනේ ඡන්ද පොළවල් 13421 ක ඡන්ද විමසීම් 2024.11.14 දින සාර්ථකව පැවැත්වීමට කටයුතු කරන ලදී. දිවයිනේ සාමාන්‍ය ඡන්ද ගණන් කිරීමේ ශාලා 1582 ක් හා තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලා 452 ක් යනාදී වශයෙන් එකතුව 2034 ක ඡන්ද ගණන් කිරීමේ කටයුතු සාර්ථකව සිදු කරන ලදී.

**16.20.** 2024 ප්‍රධාන නාමලේඛනය හා 2024 (1) ඡන්ද හිමි නාමලේඛනය අනුව ලියාපදිංචි මුළු ඡන්ද සංඛ්‍යාව 17,140,354 ක් වන අතර, එම ලේඛනය පදනම් කරගෙන, 2024.11.14 දින පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණයේ දී මුළු ප්‍රකාශිත ඡන්ද ප්‍රමාණය 11,815,246 (68.93%)කි. එම ප්‍රකාශිත ඡන්ද අතරින් 11,148,006 (94.65%) වලංගු ඡන්ද වූ අතර, 667,240 (5.65%) ප්‍රතික්ෂේපිත ඡන්ද විය. තරඟ කළ පිළිගත් දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් අතරින් ඡන්ද 6,863,186 (61.56%) ලබාගත් ජාතික ජන බලවේගය පක්ෂය ආසන 141ක් හා ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර 18 ලෙස සමස්ත මනිත්‍රීධුර 159 ලබාගෙන ජයග්‍රහණය කර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දසවැනි පාර්ලිමේන්තුවේ ආණ්ඩුවක් පිහිටුවන ලදී.

ඒ ඒ පක්ෂවලට ලැබුණු ඡන්ද සංඛ්‍යාව පිළිබඳ විස්තර

| පක්ෂය | ලබාගත් ඡන්ද සංඛ්‍යාව | ඡන්ද ප්‍රතිශතය | දිස්ත්‍රික් මට්ටමින් ලබාගත් මන්ත්‍රීධුර සංඛ්‍යාව | ජාතික ලැයිස්තුවෙන් හිමිවූ මන්ත්‍රීධුර සංඛ්‍යාව | ලබාගත් මුළු මන්ත්‍රීධුර සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ජාතික ජන බලවේගය | 6,863,186 | 61.56% | 141 | 18 | 159 |
| සමගි ජන බලවේගය | 1,968,716 | 17.66% | 35 | 5 | 40 |
| ඉලංකෙයි තමිල් අරසු කච්චි | 257,813 | 2.31% | 7 | 1 | 8 |
| නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ | 500,835 | 4.49% | 3 | 2 | 5 |
| ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ | 350,429 | 3.14% | 2 | 1 | 3 |
| ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය | 87,038 | 0.78% | 2 | 1 | 3 |
| සර්වජන බලය | 178,006 | 1.60% | 0 | 1 | 1 |
| එක්සත් ජාතික පක්ෂය | 66,234 | 0.59% | 1 | 0 | 1 |
| ජනනායක තමිල් තේසිය කුට්ටනි | 65,382 | 0.59% | 1 | 0 | 1 |
| අකිල ඉලංකෙයි තමිල් කොන්ග්‍රස් | 39,894 | 0.36% | 1 | 0 | 1 |
| අඛිල ඉලංගෙයි මහජන කොංග්‍රසය | 33,911 | 0.36% | 1 | 0 | 1 |
| යාපනය දිස්ත්‍රික් ස්වාධීන කණ්ඩායම 17 | 27,855 | 0.25% | 1 | 0 | 1 |
| ශ්‍රී ලංකා කම්කරු පක්ෂය | 17,710 | 0.16% | 1 | 0 | 1 |
| එකතුව | **11,148,006** | **94.35%** | **196** | **29** | **225** |

## 17. මැතිවරණ ආරවුල් නිරාකරණය

### 17.1 ප්‍රකාශයට පත්කරන ලද ගැසට් නිවේදන

**2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සම්බන්ධව,**

- ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හෝ අයත් යම් නිශ්වල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි සෘජුව හා වක්‍ර ලෙස හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන ගැසට් නිවේදන
- 2024.01.08 දිනැති අංක 2366/02 දරණ විධාන ගැසට් පත්‍රය මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය
- 2024.04.09 දිනැති අංක.2379/15 දරන ගැසට් අංක මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ විධාන ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය
- 2024.07.10 දිනැති අංක 2392/28 දරන ගැසට් අංක මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ විධාන ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය
- 2024.10.11 දිනැති අංක 2405/44 දරන ගැසට් අංක මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ විධාන ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය 104ආ.(5)(අ) අනුව්‍යවස්ථාව යටතේ වන මාධ්‍ය උපමාන ගැසට් නිවේදන
- 2024.01.08 දිනැති අංක 2366/03 දරණ මාධ්‍ය උපමාන ගැසට් පත්‍රය මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය
- 2024.04.09 දිනැති අංක 2379/14 දරන ගැසට් අංක මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ මාධ්‍ය උපමාන ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය
- 2024.07.10 දිනැති අංක 2392/27 දරන ගැසට් අංක මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ මාධ්‍ය උපමාන ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය
- 2024.10.11 දිනැති අංක 2405/45 දරන ගැසට් අංක මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ මාධ්‍ය උපමාන ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය

**2024 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සම්බන්ධව**

- ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හෝ අයත් යම් නිශ්වල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි සෘජුව හා වක්‍ර ලෙස හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන ඇතුළත් 2024.07.26 දිනැති අංක 2394/56 දරන ගැසට් නිවේදනය
- 2024.07.26 දිනැති අංක 2394/57 දරන මාධ්‍ය උපමාන ගැසට් නිවේදනය
- ඡන්ද විමසීම්වල දී තරග කරනු ලබන දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන් විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම පද්ධතිය ඇතුළත් 2024.07.26 දිනැති අංක 2394/58 දරන ගැසට් නිවේදනය නිකුත් කිරීම.

**2024 පාර්ලිමේන්තු මැතිවරණය සම්බන්ධව**

- ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි ඍජුව හා වක්‍ර ලෙස හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන ඇතුළත් 2024.09.25 දිනැති අංක 2403/19 සහ 2025.09.25 අංක 2403/21 දරන ගැසට් නිවේදන.
- 2024.09.25 දිනැති අංක 2403/20 දරන මාධ්‍ය උපමාන ගැසට් නිවේදනය නිකුත් කිරීම

## 17.2. 2024 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සහ 2024 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ කාර්යයන් සිදු කිරීම

ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම සඳහා සහ මැතිවරණ නීති උල්ලංඝණය වීම්, වැරදි, නීති විරෝධී හා දූෂණ ක්‍රියා සම්බන්ධව ලැබෙන පැමිණිලි භාර ගැනීම හා ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා නාමයෝජනා කැඳවීමේ දැන්වීම නිකුත් කළ දින සිට ඡන්ද විමසීම අවසන් කොට ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ දින දක්වා මැතිවරණ මහලේකම් කාර්යාලයේ හා සියලුම තේරීම්භාර නිලධාරී කාර්යාලවල මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකක ස්ථාපිත කොට තිබුණි. මෙම ඒකකවල රාජකාරී කටයුතු සඳහා සහකාර තේරීම්භාර නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් යුත් සිවිල් නිලධාරීන් ද පොලිස් පරීක්ෂකවරයකුගේ ප්‍රධානත්වයෙන් යුත් පොලිස් නිලධාරී කණ්ඩායමක් ද අනුයුක්ත කොට තිබුණි.

මැතිවරණ වැරදි, දූෂණ හා නීති විරෝධී ක්‍රියා මෙන්ම මාධ්‍ය හා සමාජ මාධ්‍ය හරහා ද වන නීති උල්ලංඝණය වීම් පිළිබඳව ලැබෙන පැමිණිලි අප්‍රමාදව සොයා බලා ක්ෂණිකව ක්‍රියාත්මක වීම හා අවස්ථාවෝචිත පරිදි අදාළ පාර්ශ්ව කොමිෂන් සභාවට කැඳවා උපදෙස් දී එවැනි කටයුතු අත්හිටුවීමට ද ක්‍රියා කොට තිබුණි. සමාජ මාධ්‍ය හරහා සිදුවන නීති විරෝධී ප්‍රචාරක කටයුතු සම්බන්ධව සොයා බැලීම හා පැමිණිලිවලට ක්‍රියාත්මක වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ විශේෂිත ඒකකයක් ස්ථාපිත කොට තිබුණි. මෙම සියලුම මැතිවරණ පැමිණිලි විමර්ශන ඒකකවලට දුරකථන, ෆැක්ස්, ඉ තැපැල, වට්ස්ඇප් මගින් මැතිවරණ පැමිණිලි ඉදිරිපත් කළ හැකි වන පරිදි පහසුකම් සලසා තිබූ අතර, ඒ පිළිබඳව පොදු මහජනතාව දැනුම්වත් කිරීම සඳහා ද පියවර ගෙන තිබුණි.

මෙම ඡන්ද විමසීමේ දී මැතිවරණ කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා පොලිසිය ඒකාබද්ධව මැතිවරණය නීති බලාත්මක කිරීම සඳහා අදාළ පාර්ශ්ව දැනුම්වත් කිරීම්, උපදෙස් ලබාදීම් රාශියක් සිදුකරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් මැතිවරණ ප්‍රචාරක කටයුතු ද නීත්‍යානුකූලව සිදු විය. ඒ හේතුකොට ගෙන ඡන්ද විමසීම තරග කරන සියලුම පාර්ශ්ව අතර ආරවුල් ඇතිවීම අවම වූ අතර ව්‍යවස්ථාපිත කාර්යයන් ද මැනවින් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්, නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් ක්‍රියා කිරීම හේතුවෙන් ඡන්ද විමසීම නිදහස් හා සාධාරණ අයුරින් සිදු වූ බවට සියලු පාර්ශ්වවල පිළිගැනීම විය.

# 18. පළාත් සභා ඡන්ද විමසීම

1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සහ 2017 අංක 17 දරන සංශෝධන පනත සම්මත වුවද, පළාත් සභා කොට්ඨාස ක්‍රමය යටතේ පැවැත්වීම සඳහා පළාත් සභා සීමා නිර්ණය කරමින් සකස් කර ඇති සීමා නිර්ණ වාර්තාව පාර්ලිමේන්තුවේ සම්මත නොවීම යන කරුණු හේතුවෙන්, සියලුම පළාත් සභාවල නිල කාලය අවසන්ව පැවතිය ද මෙම වසරේ ද දෙසැම්බර් 31 තෙක් ම පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීමේ හැකියාව නොමැති වූ අතර නිල කාලය අවසන් ව ඇති සියලුම පළාත් සභා තවදුරටත් ආණ්ඩුකාරවරුන්ගේ පාලනය යටතේ පවතී.

## 19. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම

2023 වර්ෂයේ පැවැත්වීමට කටයුතු සූදානම් කරන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව ගොනු කොට තිබූ මූලික අයිතිවාසිකම් අයදුම්පත් සම්බන්ධයෙන් 2024.08.22 දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම හැකි ඉක්මනින් පවත්වන ලෙස දන්වමින් ලබාදුන් තීන්දුව අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම හැකි ඉක්මනින් පැවැත්වීමට කටයුතු කළ යුතුව තිබුන ද, එම නඩු තීන්දුව ලබාදීමට පෙර 2024 ජනාධිපතිවරණ ඡන්ද විමසීමේ කටයුතු ආරම්භ කර තිබූ බැවින් එකී කටයුතු අවසන් වූ වහාම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවත්වීමට කොමිෂන් සභාව අවශ්‍ය කටයුතු සම්පාදනය කරන බව 2024.08.28 දිනැති අංක LAE/2023/57 මාධ්‍ය නිවේදනයෙන් ප්‍රකාශයට පත් කර තිබුණි. එසේ වුව ද, 2024.09.21 දින පැවති ජනාධිපතිවරණයෙන් තේරී පත් වූ ජනාධිපතිවරයා විසින් 2024.09.24 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හැර පාර්ලිමේන්තු මැතිවරණය සඳහා දින නියම කර ගැසට් නිවේදනය නිකුත් කරන ලද අතර පාර්ලිමේන්තු මැතිවරණය අතරතුර ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ නිල කාලය අවසන් වීම හේතුවෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 25 වගන්තිය අනුව මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එම ඡන්ද විමසීම ද පැවත්වීමට සිදු වූ බැවින් පාර්ලිමේන්තු මැතිවරණ කටයුතු අවසන් වූ වහාම හැකි ඉක්මනින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවත්වීමට දින නියම කිරීමට කටයුතු කරනු ලබන බව LAE/2023/58 මාධ්‍ය නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

2023 වර්ෂයේ පැවැත්වීමට කටයුතු කරන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා බලාත්මක වූයේ 2022 වර්ෂයේ සහතික කරන ලද ඡන්ද හිමි නාමලේඛනය වන අතර, එම නාමලේඛනයේ සිටින ඡන්ද දායකයන්ට අමතරව මේ වන විට විශාල පිරිසකගේ නම් ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් වී ඇති බැවින් ඔවුන්හට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය මෙන්ම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම වෙනුවෙන් ඉදිරිපත් වීමේ අයිතිය ද අහිමි වන බැවින් ද, ඡන්ද විමසීම සඳහා නාමයෝජනා ලබා දී ඇති අපේක්ෂකයන් බොහෝ දෙනෙක් මේ වන විට විදේශ ගතවීම, මිය යාම වැනි හේතූන් මත නාමයෝජනා පත්‍රවලට ඇතුළත් වී ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව අඩුවීම සහ 2023 වර්ෂයේ පැවති දේශපාලන පක්ෂ බොහෝමයක් මේ වන විට වෙනස් වී තිබීම ද, දේශපාලන පක්ෂවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයන් මේ වන විට වෙනත් දේශපාලන පක්ෂ හා සම්බන්ධවී කටයුතු කිරීම වැනි ගැටළු රාශියක් ඇතිවීම හේතුවෙන් 2023 වර්ෂයේ කැඳවා ඇති නාමයෝජනා අවලංගු කර අලුතෙන් නාමයෝජනා ලබාගන්නා ලෙස නොයෙකුත් පාර්ශ්ව සහ දේශපාලන පක්ෂ වෙතින් මැතිවරණ කොමිෂන් සභාව වෙත සහ අමාත්‍ය මණ්ඩලය වෙත ඉල්ලීම් ඉදිරිපත් විය.

2023 අංක 30 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් හඳුන්වා දුන් තරුණයින් සඳහා හඳුන්වා දුන් 25% ක කෝටාව අහිමි වීම ද මෙහිදී විශේෂයෙන් සැලකිල්ලට ගන්නා ලදී.

ඒ අනුව, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/2093/816/004 දරන " 2023 වර්ෂයේ පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා කැඳවන ලද නාමයෝජනා ආපසු කැඳවීම සහ නව නාමයෝජනා කැඳවීම සඳහා විධිවිධාන සැලසීම" යන මැයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමන් විසින් ඉදිරිපත් කරන ලද 2024.12.01 දරන සංදේශය අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී සභාගත කිරීමෙන් පසු අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලා පහත තීරණයන්ට එළැඹ තිබුණි.

- 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා කැඳවා ඇති නාමයෝජනා ආපසු කැඳවීමටත්,

- එකී නාමයෝජනා ඉදිරිපත් කළ අපේක්ෂකයන් විසින් තැන්පත් කර ඇති ඇප මුදල ආපසු ගෙවීමටත්,
- අනතුරුව, 2024 ඡන්ද හිමි නාමලේඛනය පදනම් කර ගනිමින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීම සඳහා නැවත නාමයෝජනා කැඳවීමටත්,

මැතිවරණ කොමිෂන් සභාවට බලය ලැබෙන සේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබාදීමටත් යෝජනා කර තිබුනි.

ඒ අනුව, මේ වන විට නීති කෙටුම්පත් සම්පාදක විසින් එම විශේෂ විධිවිධාන පනත් කෙටුම්පත සකස් කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

### 19.1. ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීමේ කටයුතු

2019 වර්ෂයේ පවත්වන ලද ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ නිල කාලය 2023 නොවැම්බර් මස 04 දිනයෙන් අවසන් වූ අතර රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් අංක 2341/29 හා 2023.07.19 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයෙන් ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභිකයන්ගේ ධුර කාලය දීර්ඝ කිරීම හේතුවෙන් එම ධුර කාලයන් 2024 නොවැම්බර් මස 04 වන දිනයෙන් අවසන් වීමට නියමිතව තිබූ බැවින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 25 වන වගන්තියෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමින් මැතිවරණ කොමිෂන් සභාව විසින් ඇල්පිටිය ප්‍රාදේශිය සභාව සඳහා ඡන්ද විමසීම පැවැත්වීමට අවශ්‍ය කටයුතු කරන ලදි.

ඒ අනුව, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 12ආ වගන්තිය අනුව සහතික කර ඇති ඡන්ද හිමි නාමලේඛනය ප්‍රදර්ශනය කර ඇති බව නිවේදනය කරමින් අංක 2398/32 හා 2024.08.22 දිනැති ගැසට් නිවේදනය නිකුත් කිරීමෙන් අනතුරුව නාම යෝජනා කැඳවීමේ දැන්වීම ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී විසින් 2024.08.26 දින දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කරන ලද අතර, නාම යෝජනා කාල සීමාව 2024 සැප්තැම්බර් 09 දින සිට 2024 සැප්තැම්බර් 12 දින මධ්‍යාහ්න 12 දක්වා විය.

ඒ අනුව, පිළිගත් දේශපාලන පක්ෂ 9 ක් සහ ස්වාධීන කණ්ඩායම් 2 ක් විසින් නාම යෝජනා පත්‍ර 11 ක් ලබා දෙන ලද අතර ඉන් දේශපාලන පක්ෂයක සහ ස්වාධීන කණ්ඩායමක නාම යෝජනා ප්‍රතික්ෂේප විය.

2024.10.26 දින පැවති ඡන්ද විමසීම සඳහා ලියාපදිංචි ඡන්ද දායකයන් 55643 ක් ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ලැබූ අතර, ඉන් 36825 ක් ඡන්දය ප්‍රකාශ කර තිබුනි. ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් 520 ක් ප්‍රතික්ෂේපිත ඡන්ද වූ අතර, වලංගු ඡන්ද සංඛ්‍යාව 36,305 ක් විය.

ඇල්පිටිය ප්‍රාදේශිය සභාව සඳහා ජාතික ජන බලවේගය විසින් ඇල්පිටිය ප්‍රාදේශිය සභාවේ කොට්ඨාස 17 න් කොට්ඨාස 15ක් ජයග්‍රහණය කරන ලද අතර, සමගි ජන බලවේගය විසින් කොට්ඨාස 2ක් ජයග්‍රහණය කරන ලදී.

අවසන් ප්‍රතිඵලය අනුව ඇල්පිටිය ප්‍රාදේශිය සභාව සඳහා පහත පරිදි සභිකයන් තේරී පත් විය.

| | |
|---|---|
| ජාතික ජන බලවේගය | -15 |
| සමගි ජන බලවේගය | -06 |
| ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ | -03 |
| පොදුජන එක්සත් පෙරමුණ | -02 |
| ස්වාධීන කණ්ඩායම | -02 |
| පොදුජන එක්සත් නිදහස් සන්ධානය | -01 |
| ජාතික ජනතා පක්ෂය | -01 |
| **එකතුව** | **-30** |

ඇල්පිටිය ප්‍රාදේශිය සභාව සඳහා සභික සංඛ්‍යාව 28ක් වුව ද, ජාතික ජන බලවේගය විසින් කොට්ඨාස 15ක් ජයග්‍රහණය කිරීම හේතුවෙන් එම සභාවේ සභික සංඛ්‍යාව 30 ක් විය. එල්ලන ලද ආසන (Over Hang) 02 කි.

## 20. පළාත් පාලන ආයතනවල සභික ධූර පුරප්පාඩු පිරවීම

පළාත් පාලන ආයතනවල සභිකයන් මියයාම, ඉල්ලා අස්වීම, පක්ෂ සාමාජිකත්වය අහිමි වීම, අවසර නොලබා සභා රැස්වීම්වලට සහභාගී නොවීම, සභාපතිවරයා ලෙස පත්වීම, අයවැය පරාජය වීම සහ ආණ්ඩුකාරවරයා විසින් ඉවත් කිරීම යන හේතූන් මත සභික ධූර පුරප්පාඩු සිදු වන අතර එම සභික ධූර පුරප්පාඩු පිරවීමේ නෛතික ක්‍රියාවලිය පළාත් පාලන අංශය විසින් සිදු කරනු ලබයි.

ඒ අනුව, 2024 ඔක්තෝබර් 26 දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වන කාල සීමාව තුළදී පාර්ලිමේන්තුවට පත්වීම හේතුවෙන් එහි සභාපතිවරයා ඉල්ලා අස්වීම නිසා ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය හා සභික ධූරයක් හිස් වූ අතර එම පුරප්පාඩු පිරවීම සඳහා වන නෛතික ක්‍රියාවලීන් සම්පූර්ණ කර ඇත.

## 21. විශේෂ ව්‍යාපෘති

2022-2025 දක්වා වූ සිවු අවුරුදු උපාය මාර්ගික සැලැස්ම අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් අංශය වෙත පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම පවරා තිබුණි. ඒ අනුව එම වැඩසටහන්වල ප්‍රගතිය පහත පරිදි දැක්වේ.

### 21.1. වතු අංශයේ සහ ආන්තික ජන කොටස් සඳහා විශේෂිත පුහුණු වැඩසටහන් පැවැත්වීම.

මෙ යටතේ දිස්ත්‍රික් කාර්යාල මඟින් පවත්වා ඇති වැඩ සටහන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | වැඩසටහන/ ව්‍යාපෘතිය | පවත්වන ලද ස්ථානය | දිනය |
|---|---|---|---|
| කොළඹ | වතු අංශයේ ජනතාව දැනුම්වත් කිරීම | කිරිවන්දල උතුර, පෙන්රිච්වත්ත ප්‍රජා ශාලාව | 2024.03.02 |
| කළුතර | වතු අංශය හා ආන්තික ජන කොටස් | නිව් වැලිල් වත්ත, මිල්ලනිය | 2024.02.20 |
| | වතු අංශය හා ආන්තික ජන කොටස් | ගීකියන තන්ද වත්ත දෙමළ විද්‍යාලය | 2024.03.04 |
| නුවරඑළිය | වතු අංශය හා ආන්තික ජන කොටස් | KTS ශාලාව, උඩුපුස්සැල්ලාව | 2024.03.13 |
| මුලතිව් | ධීවර ප්‍රජාව දැනුවත් කිරීම | තුනුක්කායි ගම්මානය | 2024.04.17 |
| මඩකලපුව | අභිකුණ්ඨික ගෝත්‍රික ප්‍රජාව දැනුවත් කිරීම | වාකරේ. ප්‍රා.ලේ. | 2024.05.28 |
| කුරුණෑගල | වතු ආන්තික ජන කොටස් දැනුවත් කිරීම | ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ල, රිදීගම | 2024.06.08 |
| අනුරාධපුරය | ආන්තික ජන කණ්ඩායම් (අභිකුණ්ඨික) | මිහින්තලේ පොතාන වසම | 2024.04.01 |
| බදුල්ල | වතු අංශ හා ආන්තික ජනකොටස් දැනුම්වත් කිරිම | කන්දෙගෙදර සංස්කෘතික මධ්‍යස්ථානය | 2024.05.09 |
| | වතු අංශ හා ආන්තික ජනකොටස් දැනුම්වත් කිරිම | දික්වැල්ල වත්ත ඉහ කොටස - හාලිඇල | 2024.05.11 |
| | වතු අංශ හා ආන්තික ජනකොටස් දැනුම්වත් කිරිම | ඇටම්පිටිය - හාලිඇල | 2024.05.11 |
| | වතු අංශ හා ආන්තික ජනකොටස් දැනුම්වත් කිරිම | ඩැමේරියා වත්ත - පස්සර | 2024.06.20 |
| මොණරාගල | ආන්තික ජන කොටස් දැනුම්වත් කිරිම | මුප්පනේවැලි වත්ත - මොණරාගල | 2024.05.13 |





## 21.2. ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහනට අදාළ ක්‍රියාකාරකම්.

මේ යටතේ දිස්ත්‍රික් කාර්යාල පවත්වා ඇති වැඩ සටහන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | දිනය | වැඩසටහන් පවත්වන ලද ස්ථානය |
|---|---|---|
| කොළඹ | 2024.07.17 | කොළඹ 10 ආනන්ද විද්‍යාලය - සිසුන් |
| ගම්පහ | 2024.04.09 | වේයන්ගොඩ බණ්ඩාරනායක විද්‍යාලය - සිසුන් |
| | 2024.06.19 | නිට්ටඹුව සංඝබෝධි මධ්‍ය මහා විද්‍යාලය - සිසුන් |
| මහනුවර | 2024.03.28 | ගම්පොළ වික්‍රමබාහු ජාතික පාසල - ගුරුවරුන් හා කලාප අධ්‍යාපන කාර්යාලීය නිලධාරීන් |
| | 2024.04.01 | දෙනුවර කලාප අධ්‍යාපන කාර්යාලය - ගුරුවරුන් හා කලාප අධ්‍යාපන කාර්යාලීය නිලධාරීන් |
| මාතලේ | 2024.03.22 | කන්දේනුවර දෙමළ මහා විද්‍යාලය - සිසුන් |
| නුවරඑළිය | 2024.03.18 | පදියපලැල්ල මහා විද්‍යාලය - සිසුන් |
| ගාල්ල | 2024.03.27 | ගාල්ල, අම්බලන්ගොඩ කලාපයේ තෝරාගත් පාසැල් 04 ක 10 ශ්‍රේණියෙන් ඉහළට ඉගෙනුම ලබන සිසුන් 800 |
| | 2024.03.28 | ගාල්ල, අම්බලන්ගොඩ කලාපයේ තෝරාගත් පාසැල් 03 ක 10 ශ්‍රේණියෙන් ඉහළට ඉගෙනුම ලබන සිසුන් 1000 |
| මන්නාරම | 2024.03.23 | කලාප අධ්‍යාපන කාර්යාලය - ප්‍රජා අධ්‍යාපන ගුරු පුහුණු වැඩමුළුව |
| මඩකලපුව | 2024.06.04 | තාලංකුඩා උසස් තාක්ෂණ විද්‍යාලය - සිසුන් |
| අම්පාර | 2024.03.12 | අම්පාර කලාප අධ්‍යාපන කාර්යාලය - ප්‍රජා අධ්‍යාපන විෂය භාර ගුරුවරුන් |
| අම්පාර | 2024.03.13 | මහඔය කලාප අධ්‍යාපන කාර්යාලය- ප්‍රජා අධ්‍යාපන විෂය භාර ගුරුවරුන් |
| | 2024.03.14 | දෙහිඅත්තකණ්ඩිය කලාප අධ්‍යාපන කාර්යාලය - ප්‍රජා අධ්‍යාපන විෂය භාර ගුරුවරුන් |
| පොළොන්නරුව | 2024.06.05 | මැදිරිගිරිය ජාතික පාසල - සිසුන් |
| බදුල්ල | 2024.03.07 | මඩොල්සිම, බටවත්ත දෙමළ විද්‍යාලය - සිසුන් හා ගුරුවරුන් |
| මොණරාගල | 2024.04.02 | බිබිල, මො/ යශෝධරා බාලිකා විද්‍යාලය - සිසුන් |
| | 2024.07.24 | මො/බකිනිගහවෙල මුස්ලිම් විද්‍යාලය - සිසුන් |











මීට අමතරව ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තු නිලවරණය - 2023 අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධරයන්ගේ ආරාධනාව මත මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තු නිලවරණය 2024.03.25 දින මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ දී පැවත් වූ අතර මෙහි දී කථානායක, අග්‍රාමාත්‍ය, සභා නායක, නියෝජ්‍ය කථානායක, නියෝජ්‍ය කාරක සභා සභාපති යන තනතුරු සහ අමාත්‍යාංශ 10 ක සඳහා අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍ය ධුර සඳහා නිලවරණය පවත්වන ලදී. දිවයිනේ අධ්‍යාපන කලාප ආවරණය වන සේ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් තෝරාගත් අපේක්ෂකයන් 137ක් ඉහත තනතුරු සඳහා නාමයෝජනා ලබා දුන් අතර ජාතික මැතිවරණයක්, ඡන්ද විමසීමක් අවස්ථාවේ දී සිදුකරන ක්‍රියාවලිය පිළිබඳ සිසුන් සඳහා ප්‍රායෝගික අත්දැකීමක් ලබා දෙමින් ඒ හා සමාන ආකාරයටම මෙහිදී නිලවරණය පවත්වා ප්‍රතිඵල ලබා දීමට කටයුතු කෙරුණි. මෙය පළමුවරට පැවත් වූ ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තු නිලවරණය වීම විශේෂ කරුණකි.

**21.3.** සංක්‍රාන්ති ලිංගික කණ්ඩායම් සමග ඔවුන් සම්බන්ධයෙන් මැතිවරණ ක්‍රියාවලියට අදාළව පවතින ගැටළු පිළිබඳව මැතිවරණ කොමිෂන් සභා නිලධාරීන් සමග 2024.03.15 සහ 2024.08.02 දිනවලදී සාකච්ඡා කිරීම.

**21.4. 2025 වර්ෂයේ දී ප්‍රජාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික මට්ටමේ පර්යේෂණ සම්මන්ත්‍රණය.**

මැතිවරණ කොමිෂන් සභාව විසින් දෙවන වරට සංවිධානය කරනු ලබන වාර්ෂික පර්යේෂණ සැසියට අදාළව ඡන්ද බලය ආරක්ෂා කිරීම හා ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම සහ ඒ ආශ්‍රිත තේමාවන් ඔස්සේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම සඳහා 2024 අප්‍රේල් මස මැතිවරණ කොමිෂන් සභා නිල වෙබ් අඩවිය ඔස්සේ විවෘත ආරාධනයක් සිදු කරන ලද අතර, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මගින් හා දිවයින පුරා පිහිටි විශ්ව විද්‍යාල පද්ධතිය ආවරණය කරමින් ද මේ සඳහා දැනුම්වත් කිරීම් සිදු කරන ලදි. එම කාල සීමාව තුළ විශ්ව විද්‍යාල පද්ධතිය තුළ පැවති වාතාවරණය හේතුවෙන් හා තවදුරටත් මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සියලුම පිරිස් සඳහා පහසුවක් වන පරිදි නැවත 2024 ජූනි මස පුවත්පත් දැන්වීමක් මගින් දැනුවත් කිරීම සිදු කරන ලදි.

විද්‍යුත් තැපැල ඔස්සේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දුන් අතර, ඒ අනුව ඒ සඳහා සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍ය 3 ම නියෝජනය කරමින් පර්යේෂණ පත්‍රිකා 34 ක් ලැබුණි.

2024 ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට කටයුතු කිරීම හේතුවෙන් මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම තාවකාලිකව අත්හිටවීමට සිදු වූ නමුත්, නැවත එය ආරම්භ කරමින් විද්වත් මඩුල්ලක් හමුවේ පර්යේෂණ පත්‍රිකා ඇගයීමට කටයුතු කර සම්මන්ත්‍රණය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

## 22. ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් ඇති වගකීම

මැතිවරණ කොමිෂන් සභාවේ සහභාගීත්ව උපායමාර්ගික සැලැස්ම 2022- 2025ට අනුව පරමාර්ථ, අරමුණු සහ ඉලක්ක තුළ 01 වන අවධාරිත ක්ෂේත්‍රය : දැනුම්වත් කිරීම් හා සජීවිකරණය යටතේ පුරවැසියන් සහ ඡන්ද හිමියන් යන දෙපාර්ශ්වය ඡන්දයේ බලය හා ප්‍රජාතන්ත්‍රීය අයිතිය පිළිබඳ ව ප්‍රමාණවත් ලෙස දැනුම්වත් ව සිටිති යන්න පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා කාන්තාවන් සහ තරුණයින් බලමුලු ගැන්වීමේ ඉල්ලක යටතේ ආබාධ සහිත ඡන්දදායකයින් දැනුම්වත් කළ වැඩසටහන් 85 ක් පවත්වන ලදී. එම වැඩසටහන් මාර්ගගත ක්‍රමය ඔස්සේ, විද්‍යුත්








වර්ෂ 2025 දී ආබාධ සහිත හා ආන්තික ජන කොටස් මැතිවරණ ක්‍රියාවලියට ක්‍රියාකාරීව සහභාගීවීම වළකාලන සියලු ප්‍රධාන බාධක විසදාලීම යටතේ;

- මැතිවරණයට අදාළ වචන ඇතුළත් කර සංඥා භාෂා කෝෂය නිර්මාණය කිරීම
- පූර්ණ ආබාධ සහිත තැනැත්තන් සඳහා තාවකාලික හැඳුනුම්පතක් නිකුත් කිරීම (4358) සහ ඡන්ද මධ්‍යස්ථානය තුළ අනන්‍යතාව තහවුරු කරන සහතිකයක් ලෙස පිළිගැනීම.
- ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය දී ඡන්ද මධ්‍යස්ථාන 441ක ප්‍රවේශ පහසුකම් සකස් කිරීම
- ශ්‍රවණාබාධ සහිත ඡන්දදායකයින්ට ඡන්ද පොළ තුළ දී ඇතිවිය හැකි සන්නිවේදන බාධකය අවම කරලීම සඳහා ඡන්ද ස්ථානාධිපතිවරුන්ට සංඥා භාෂා පිළිබඳ මූලික පුහුණුවක් ලබාදීම
- ඡන්ද පොළ දැන්වීම් සංඥා භාෂාවෙන් ප්‍රදර්ශනය කිරීම
- ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය දී ඡන්ද පත්‍රිකාව මඟපෙන්වන ස්පර්ශක රාමුව භාවිතයට අවස්ථාව ලබාදීම
- සහායකයකු කැටුව යාම අවස්ථාව ලබාදීම
- පෞද්ගලික ප්‍රවාහන පහසුකම් සලසදීමට අවස්ථාව ලබාදීම
- ඡන්ද මධ්‍යස්ථානය තුළ රෝද පුටු මඟින් නොමිලේ ප්‍රවාහන පහසුකම සැලසීම
- සංඥා භාෂා පරිවර්තන සහිතව ඡන්ද ප්‍රතිඵල විකාශනය කිරීම
- මැතිවරණයට අදාළ පනත් හඬපට ආකෘතියෙන් සකස් කිරීම යනාදිය සිදු කරන ලදී.

## 23. මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත හා මැතිවරණ නීති බලාත්මක කිරීමට අදාළ දැනුම්වත් කිරීමේ වැඩසටහන්

**23.1** දේශපාලන පක්ෂ/ අපේක්ෂකයන්ගේ මැතිවරණ ප්‍රචාරක වියදම් නියාමනය කිරීම

පිණිස සම්මත කරන ලද 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමන පනත පූර්ණ වශයෙන් ක්‍රියාවට නංවන ලද්දේ ජනාධිපතිවරණ ඡන්ද විමසීමේ දී ය.

එහිදි මැතිවරණ මූල්‍යකරණයේ විනිවිදභාවය සහ සාධාරණත්වය සහතික කිරීම සඳහා සුවිශේෂී පියවරක් ලෙස, ජනාධිපතිවරණ සහ පාර්ලිමේන්තු මැතිවරණ ප්‍රචාරණ වියදම් සීමාව තීරණය කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව නව ක්‍රමවේද දෙකක් හඳුන්වා දී ඇත. ප්‍රායෝගික සාක්ෂි සහ මැතිවරණ ගතිකතාවන් මත පදනම්ව ප්‍රචාරණ වියදම් සීමා තීරණය කිරීම සඳහා දත්ත මත පදනම් වූ සහ විද්‍යාත්මකව ශක්තිමත් ප්‍රවේශයක් භාවිතා කරමින් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා විසින් මෙම ක්‍රමවේදය සකස් කරන ලදී.

මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම තුළින් මැතිවරණ වියදම් නියාමනය කිරීම, ප්‍රචාරණ කටයුතු සඳහා අධික වියදම් වැළැක්වීම සහ අපේක්ෂකයින් සඳහා සම තරගබිමක් ස්ථාපිත කිරීම සඳහා සැලකිය යුතු ඉදිරි පියවරක් සනිටුහන් කරනු ලැබීය. මැතිවරණ ක්‍රියාවලීන්හි ව්‍යුහගත සහ සාධාරණ මූල්‍ය රාමුවක අවශ්‍යතාව පිළිබඳ පුළුල් එකඟතාවක් පිළිබිඹු කරමින්, මැතිවරණවලට තරග කරන දේශපාලන පක්ෂවලින් යෝජිත ක්‍රමවේදයට පුළුල් සහයෝගයක් ලැබුණි. මෙම මුලපිරීම ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ වගවීම සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා කොමිෂන් සභාවේ කැපවීම ශක්තිමත් කරයි.

**23.2** 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමන පනත ප්‍රකාරව මැතිවරණ ප්‍රචාරක වියදම් ඇතුළත් වියදම් වාර්තාව මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර දින විසි එකක් ඇතුළත පක්ෂ ලේකම්ගේ, ස්වාධීන කණ්ඩායම් නායකයාගේ සහ අපේක්ෂකයාගේ අත්සන, දිවුරුම් කොමසාරිස්වරයා හෝ සාමදාන විනිශ්චයකාරවරයා විසින් සහතික කොට මැතිවරණ කොමිෂන් සභාව වෙත භාර දිය යුතුවේ. තවද අපේක්ෂකයා වෙනුවෙන් පිළිගනු ලැබූ හෝ භාරගනු ලැබූ පරිත්‍යාග හෝ දායකත්ව වේ නම් හා එම පරිත්‍යාග හෝ දායකත්ව ද්‍රව්‍යමය වශයෙන් ලැබුණේ නම් ඒවායේ ඇස්තමේන්තු වටිනාකම, එකී දායකත්ව පරිත්‍යාග කරනු ලැබුවේ ත්‍යාග, ණය මුදල්, අත්තිකාරම් හෝ තැන්පතු වශයෙන් ද යන වග මැතිවරණ ප්‍රචාරක වියදම් ඇතුළත් වියදම් වාර්තාවේ පැහැදිලිව සඳහන් කළ යුතු බවද මෙහි දී අවධාරණය කර තිබුණි.

**23.3.** මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන්, නිරීක්ෂණ සංවිධාන, පිළිගත් දේශපාලන පක්ෂවල ලේකම්වරුන් සහ නියෝජිතයන් සහ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ආයතන ප්‍රධානීන් සමඟ සාකච්ඡා පවත්වා ඊට අදාළ මෙහෙයුම් කාර්ය පරිපාටියක් සකස් කරන ලදී.

**23.4.** 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ විධිවිධාන හා ඉහත කාර්ය පරිපාටිය පිළිබඳව දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් ලේකම්වරු, රාජ්‍ය නිලධාරීන්, නිරීක්ෂණ සංවිධාන, සිවිල් සංවිධාන දැනුවත් කිරීමේ වැඩසටහන් Westminster Foundation for Democracy ආයතනයේ දායකත්වයෙන් සියලුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි පවත්වන ලදී.

**23.5.** ඡන්ද විමසීම අවසානයේ දී වියදම් නියාමන පනතේ සඳහන් පරිදි අපේක්ෂකයන් තිදෙනෙකු හැර තිස්පස් දෙනෙකු ස්වකීය ආදායම් වියදම් වාර්තා මැතිවරණ කොමිෂන් සභාව වෙත භාර දී තිබූ අතර ආදායම් වියදම්

වාර්තා භාර නොදුන් අපේක්ෂකයන්/ පක්ෂ සම්බන්ධව පනතේ සඳහන් පරිදි නීති මගින් ක්‍රියා කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය වෙත වාර්තා කොට තිබුණි.

## 24. තොරතුරු තාක්ෂණ භාවිතාව

### 24.1 තොරතුරු තාක්ෂණ අවශ්‍යතා අධ්‍යයනය, මෘදුකාංග නිර්මාණය, සංවර්ධනය හා නඩත්තු කිරීම

2024 සැප්තැම්බර් 21 දින පැවති ජනාධිපතිවරණයේ ප්‍රතිඵල වගුගත කිරීම සහ මාධ්‍ය වෙත නිකුත් කිරීම සඳහා නවමු ඉ ප්‍රතිඵල සැකසුම් පද්ධතියක් සකස් කරන ලදි. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාව මගින්ම සංවර්ධනය කරන ලද ප්‍රතිඵල පද්ධතියක් හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හැකියාව ලැබුණු අතර මෙම ඉ ප්‍රතිඵල පද්ධතිය දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වන ප්‍රතිඵල වගුගත කිරීමේ පද්ධතිය, ප්‍රතිඵල එසැනින් මාධ්‍ය වෙත නිකුත් කිරීමේ පද්ධතිය, උපස්ථ ප්‍රතිඵල පද්ධතියකින් සමන්විත වූ අතර නිකුත් කරන ප්‍රතිඵල ජනතාවට පහසුවෙන් ලබා ගත හැකි සහ අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යා හැකි ප්‍රතිඵල වෙබ් අඩවියකින්ද සමන්විත විය.

මෙම ප්‍රතිඵල පද්ධතිය පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා යොදා ගත හැකි වන ලෙස වැඩි දියුණු කර 2024 ඔක්තෝබර් 26 දින පැවති ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීමේ ප්‍රතිඵල නිකුත් කිරීම සිදුකරන ලදි.

මැතිවරණ කොමිෂන් සභාව මගින්ම සංවර්ධිත මෙම නවමු ප්‍රතිඵල පද්ධතිය තවදුරටත් වැඩි දියුණු කොට 2024 නොවැම්බර් මස 14 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා යොදා ගැනීම සිදුකරන ලද අතර ඒ මගින් ඉතා අඩු කාලයක් තුළ ප්‍රතිඵල නිකුත් කිරීමට හැකි විය. මනාප ප්‍රතිඵල නිකුත් කිරීමට හැකිවන පරිදි මෙම ප්‍රතිඵල පද්ධතිය වැඩි දියුණු කිරීම මගින් ඩිජිටල් ආකාරයෙන් මනාප ප්‍රතිඵල සකසා මාධ්‍ය වෙත නිකුත් කිරීම සිදුකරන ලදි.

ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයන්ගේ නාමයෝජනා කළමනාකරණය කිරීම සඳහා නාමයෝජනා කළමණාකරණ පද්ධතිය වැඩි දියුණු කරන ලද අතර ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ අපේක්ෂකයන්ගේ තොරතුරු ඉ සේවාව හරහා පරිශීලනයට හැකිවන පරිදි ලබා දීම සිදුකරන ලදි.

නාමයෝජනා කළමණාකරන පද්ධතිය වැඩි දියුණු කොට පාර්ලිමේන්තු මැතිවරණයේ නාමයෝජනා කළමනාකරණය සඳහා යොදා ගන්නා ලද අතර පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වූ අපේක්ෂකයන්ගේ තොරතුරු ඉ සේවාව හරහා පරිශීලනයට හැකිවන පරිදි ලබා දීම සිදු කරන ලදි. මැතිවරණයේ ඉදිරි කටයුතු සඳහා මුද්‍රණ කටයුතු, වාර්තා ලබා ගැනීම, සංඛ්‍යා දත්ත ලබා ගැනීම, නාමයෝජනා පරීක්ෂා කිරීම ඇතුලු නාමයෝජනා මගින් සිදුකරනු ලබන ඉදිරි කටයුතු සිදු කළ හැකි වන පරිදි වැඩි දියුණු කොට අදාළ කාර්යන් සිදු කරන ලදි.

මධ්‍යගත ඡන්ද මධ්‍යස්ථාන පද්ධතියේ ධාරිතා පරීක්ෂාවක් සිදු කර එහි යාවත්කාලීන කිරීම් සිදුකොට 2024 වර්ෂයේ පැවති මැතිවරණ සඳහා යොදා ගැනීම සිදුකරන ලදි.

නිලධාරි සංගණනය සඳහා මුද්‍රිත දත්ත පත්‍රිකා වෙනුවට සම්පූර්ණයෙන්ම ඉ සේවාව භාවිතා කිරීම සිදුකළ හැකි වන පරිදි මාර්ගගත නිලධාරි සංගණනය සඳහා වන ඉ සේවාව වැඩි දියුණු කරන ලදි. ඒ අනුව එහි නියමු ව්‍යාපෘතියක් ලෙස 2024 ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය මහනුවර, වව්නියාව සහ මුලතිව් දිස්ත්‍රික්කයන්හි කඩදාසි භාවිතයකින් තොරව ඉ සේවා හරහා සම්පූර්ණයෙන්ම නිලධාරි සංගණනය සිදුකරන ලදි.

ඉ-සේවාව භාවිතයෙන් ලබා ගන්නා දත්ත මගින් නිලධාරි සංගණනයට අදාළ ඉදිරි කටයුතු සිදුකළ හැකිවන නිලධාරි සංගණන

අභ්‍යන්තර තොරතුරු පද්ධතිය වැඩි දියුණු කරන ලදී.

මාර්ගගත ක්‍රමයට තැපැල් ඡන්ද අයදුම් කිරීමේ වැඩසටහන වැඩි දියුණු කරන ලද අතර ස්වයං මාර්ගගත අයදුම් කිරීම (Self-Online Applying), ආයතනික මාර්ගගත අයදුම් කිරීම (Certifying Officer Online Applying) සහ දත්ත මුද්‍රණය කර ගැනීමේ ක්‍රමය (අර්ධ මාර්ගගත ක්‍රමය) ( Semi Online Data Printing Applying) යන ක්‍රම 03 මගින් මාර්ගගත තැපැල් ඡන්ද අයදුම් කිරීමේ පහසුකම් ලබා දෙන ලදී.
තැපැල් ඡන්ද කළමණාකරන පද්ධතිය වැඩි දියුණු කිරීම මගින් තැපැල් ඡන්ද ක්‍රියාවලිය වඩාත් පහසු කිරීම සිදුකරන ලදී.

මැතිවරණ ආරවුල් නිරාකරණ කළමනාකරණ පද්ධතිය (Electoral Dispute Resolution Management System) වැඩිදියුණු කරමින් භාවිතා කිරීම හා එය භාවිතය පිළිබඳ සියළුම තාක්ෂණික උපදෙස් අදාළ පාර්ශව වෙත ලබා දීම.

පසුගිය වර්ෂවල දී ඉටු කළ ආකාරයට ම 2024 වර්ෂයේ සාමාන්‍ය ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට හා පරිපූරක නාමලේඛන වලට අදාළව වැඩසටහන් හඳුන්වා දීම හා යාවත්කාලීන කිරීම සිදු කරන ලද අතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ඡන්ද ප්‍රදේශ භාර නිලධාරීන්ගේ කටයුතු පහසු කිරීම සඳහා පරිගණක වැඩසටහන් සකස් කොට/ වැඩිදියුණු කරන ලදී.

ප්‍රධාන ඡන්ද හිමි නාමලේඛනය සහ සහතික කළ පරිපූරක නාම ලේඛන භාවිතා කරමින් ඉදිරි ප්‍රතිශෝධන කටයුතු සහ මැතිවරණවලදී ඒකාබද්ධ ඡන්ද හිමි නාමලේඛන සකස් කර ගැනීමට සකස් කළ පරිගණක වැඩසටහන යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම සිදු කරන ලදී.

ප්‍රතිශෝධන කටයුතු සඳහා ඒකාබද්ධ නාම ලේඛන භාවිතයෙන් නව දත්ත මුද්‍රිත ගණන් ගැනීමේ ආකෘති පත්‍ර, බහු ලියා පදිංචි ලැයිස්තු ආදිය මුද්‍රණය සඳහා සකස් කළ පරිගණක වැඩසටහන යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම සිදු කරන ලදී.

දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල නිලධාරීන්ට පරිගණක වැඩසටහන මගින් ඡන්ද හිමි නාම ලේඛන ප්‍රතිශෝධනයේ කටයුතු සිදු කිරීමේදී අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා මග පෙන්වීම් ලබා දීමත්, ඡන්ද හිමි නාමලේඛන උපුටන ලබා ගැනීමේදී අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීමත් වර්ෂය පුරා අදාළ කාලවලදී අඛණ්ඩව සිදු කරන ලදී.
මීට අමතරව මැතිවරණ කොමිෂන් සභාවේ අභ්‍යන්තර පරිපාලන කටයුතු පහසු කිරීම සඳහා පරිගණක වැඩසටහන් නිර්මාණය කරන ලද අතර ඒවා 2024 වසර තුළ දී වැඩිදියුණු කරමින් පවත්වාගෙන යන ලදී.

1. ප්‍රධාන කාර්යාලයේ සියළුම නිලධාරීන්ට මාර්ගගතව නිවාඩු අයදුම් කිරීම සඳහා නිවාඩු කළමනාකරණ පද්ධතියක් (Leave Management System) පවත්වා ගෙන යාම.
2. මැතිවරණ කොමිෂන් සභාවේ රථවාහන කළමනාකරණ පද්ධතිය (Vehicle Management System) සංවර්ධනය කරමින් පවත්වා ගෙන යාම.
3. ගිණුම් කටයුතු සිදු කිරීම සඳහා වියදම් කළමනාකරණ පද්ධතිය (Expenditure Management System) සංවර්ධනය කරමින් පවත්වා ගෙන යාම.
4. උපාය මාර්ග අධීක්ෂණ පද්ධතිය (Strategic Plan Monitoring System) සංවර්ධනය කරමින් පවත්වාගෙන යාම.
5. ප්‍රසම්පාදන සැලැස්ම අධීක්ෂණ පද්ධතිය (Procurement Plan Monitoring System) සංවර්ධනය කිරීම.
6. පෞද්ගලික දත්ත ගබඩා කිරීමේ වැඩසටහන (HRIM)

දේශපාලන පක්ෂ තොරතුරු කළමනාකරණය සඳහා වන නව පරිගණක වැඩසටහනක් හඳුන්වා දෙන ලදී. මේ මගින් පක්ෂ තොරතුරු පරිගණක වැඩසටහනක් හරහා

කළමණාකරනය කර ගැනීමේ පහසුකම් ලබා දෙන ලදි.

### 24.2 මැතිවරණ ක්‍රියාවලියට අදාළ පාර්ශ්වකරුවන් හට ඉ සේවා සැපයීම

- මෙරට ප්‍රමුඛතම තොරතුරු තාක්ෂණ සම්මාන උළෙල වන බ්‍රිතාන්‍ය පරිගණක සංගමයෙහි (BCS) ශ්‍රී ලංකා අංශය මගින් 26 වන වරට සංවිධානය කරන ලද ජාතික තොරතුරු තාක්ෂණ සම්මාන - 2024 (National ICT Awards – NBQSA 2024) සම්මාන උළෙලේ දී රාජ්‍ය අංශයේ සංවිධානයක් වෙත එම රාජ්‍ය ආයතනය මගින් එහි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පරිසරය සකස් කිරීම, පෝෂණය කිරීම සහ සංවර්ධනය කිරීම වෙනුවෙන් සිදු කරන ලද අසමසම සේවාවන් වෙනුවෙන් පිරිනැමෙන Public Sector Most Outstanding ICT Achievement Award යටතේ වන ඉහලම සම්මානය සහ මහජනතාව සඳහා වැඩිදියුණු කළ රාජ්‍ය සේවාවන් සැපයීම හෝ මහජන සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා වන ඩිජිටල් මුලපිරීම් සඳහා කැප වූ අසමසම තොරතුරු තාක්ෂණ නවෝත්පාදනයන් සඳහා වන Digital Government in Public Sector and Government අංශය යටතේ පිරිනමන ලද ඉහලම සම්මානය ලෙස රිදී සම්මානය මැතිවරණ කොමිෂන් සභාව මගින් හඳුන්වා දෙන ලද මැතිවරණ ඉ සේවාව සඳහා පිරිනමන ලදි.
- බෲනායි රාජ්‍යයේ පැවති Asia Pacific ICT Alliance Awards (APICTA) ජාත්‍යන්තර සම්මාන උළෙල නියෝජනය කිරීමේ අවස්ථාව මැතිවරණ ඉ සේවාවට හිමිවිය.
- තව ද ඉදිරියේ පැවැත්වීමට නියමිත World Summit Award 2024 තරගාවලිය සඳහා මැතිවරණ ඉ සේවාව මේ වන විට තේරී පත්වී ඇත.

දේශපාලන පක්ෂ අපේක්ෂකයින්, රාජ්‍ය ආයතන, රාජ්‍ය නිලධාරීන්, ඡන්ද දායකයින් ඇතුළු සියළු පාර්ශවකරුවන් වෙත ඉ සේවා සැපයීම වසර පුරා අඛණ්ඩව සිදු කරන ලදී. මෙහිදී ප්‍රධාන අංශ 5 යටතේ සේවාවන් ලබා දීම සිදු කරන ලදී. මේ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදු කරන ලදී.

1. යොවුන් පුරවැසියන් ලියාපදිංචි කිරීම (අවුරුදු 18 සම්පූර්ණ කළ විගස හෝ 18 සම්පූර්ණ වීමට ආසන්න)
2. මුල්වරට ලියාපදිංචි කිරීම
3. පදිංචි ස්ථානය වෙනස් කිරීම සඳහා ඉල්ලුම් කිරීම
4. දත්ත දෝෂ නිවැරදි කරවා ගැනීමට ඉල්ලුම් කිරීම
5. හිමිකම් අයදුම් කිරීම
6. පදිංචි තොරතුරුවල වෙනසක් නොමැති නම් තහවුරු කිරීමේ සේවාව

විදේශගත පුරවැසියන් සඳහා මාර්ගගතව ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට නව ඉ සේවාවක් අත්හදා බැලීමේ මට්ටමෙන් හඳුන්වා දීම සිදුකරන ලදි.

ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි පුරවැසියන් හට තමාගේ පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කිරීමට 2015 වසරේ සිට මේ දක්වා සහතික කළ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි තොරතුරු ඇතුළත් ඡන්දහිමි ලියාපදිංචි ප්‍රකාශය දවසේ ඕනෑම අවස්ථාවක අන්තර්ජාල පහසුකම් සහිත සුහුරු ජංගම දුරකතනයක්, පරිගණකයක් හෝ වෙනත් එවැනි උපකරණයන් හරහා මෙම සේවාව මුදල් ගෙවීමකින් තොරවම ලබා ගැනීමට සේවා සැපයීම.

ග්‍රාම නිලධාරි ඉ-සේවාව වැඩි දියුණු කිරීම මගින් ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ ග්‍රාම නිලධාරීන්ගේ කටයුතු මැතිවරණ ඉ-සේවාව හරහා වඩාත් පහසුවෙන් සිදුකර ගැනීමට අවස්ථාව ලබා දීම සිදුකරන ලදි.

මැතිවරණයක දී ආබාධ සහිත පුද්ගලයින්ට අවශ්‍ය පහසුකම් ලබා ගැනීමට ඉල්ලීම් කිරීම සඳහා සකස් කළ **ආබාධ සහිත පුද්ගලයින්ගේ ද්වාරය** යන සේවාව සාර්ථක ලෙස

පවත්වාගෙන යාම, මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය භාෂා ත්‍රිත්වයෙන්ම යාවත්කාලීන කර අඛණ්ඩව පවත්වාගෙන යෑම, සහ විශේෂයෙන්ම දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම සම්බන්ධ තොරතුරු, දේශපාලන පක්ෂ ලැයිස්තුව, මාධ්‍ය නිවේදන, මාධ්‍ය උපමාන, ගැසට් හා චක්‍රලේඛ ආදී තොරතුරු භාෂා ත්‍රිත්වයෙන් මැතිවරණ නිල වෙබ් අඩවියේ යාවත්කාලීන කිරීම.

එසේම පුළුල් ලෙස සමාජය තුළ ව්‍යාප්ත වූ සමාජ මාධ්‍ය ජාල භාවිතා කරමින් මහජනතාව වෙත යාවත්කාලීන තොරතුරු කඩිනමින් ලබා දීම මඟින් මැතිවරණ ක්‍රියාවලිය කාර්යක්ෂමව කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ භාවිතය ඉවහල් කර ගැනීම.

මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හා නිල සමාජ මාධ්‍යජාල ආබාධිත පුද්ගල හිතකාමී ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා කටයුතු සිදු කිරීම.

රජයේ පාසල් සඳහා පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමේ දී අවශ්‍ය ඡන්දහිමි නාමලේඛන විස්තර මැතිවරණ කොමිෂන් සභාව අනුමත කළ මිල ගණන් යටතේ මාර්ගගත ක්‍රමයට ආරක්ෂාකාරී ලෙස පාසල් වෙත ලබා දීම සිදු කරන ලදී. එසේම මෙම පහසුකම කොට්ඨාස අධ්‍යාපන කාර්යාල හා කලාප අධ්‍යාපන කාර්යාල වෙත නොමිලේ ලබා දීම සිදු කරන ලදී.

එයට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව, දේශිය ආදායම් දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යනාදියට මෙන්ම සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අස්වැසුම වැඩසටහන සඳහා ඡන්දහිමි නාමලේඛන ලියාපදිංචි තොරතුරු මාර්ගගත ක්‍රමයට ලබා දීමට අදාළ තාක්ෂණික සහය ලබා දීම සිදු කරන ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ සියළු පාර්ශවකරුවන් මැතිවරණ ක්‍රියාවලිය හා සම්බන්ධිත කරුණු පිළිබඳව දැනුම හා අධ්‍යාපනය ලබා දීම සඳහා අධ්‍යාපනය සහ මැතිවරණ දායකත්වය සඳහා වන පද්ධතිය (VEEE) පවත්වාගෙන යාම හා සංවර්ධනය කිරීම සිදු කරන ලදී.

මාර්ගගත ලියා පදිංචිය ඇතුළු මැතිවරණ ඉ-සේවා භාවිතයේදී ජනතාවට මතුවන ගැටළු විසඳා ගැනීමට අදාළ නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සඳහා වට්ස් ඇප් හා ඉ-තැපැල් ගිණුමක් සකස් කර පවත්වා ගෙන යාම 2024 වර්ෂයේ දී ද සිදු කරන ලදී.

වෙබ් අඩවිය හා සමාජ මාධ්‍ය ජාලා හරහා ලැබෙන මහජන පැමිණිලි නියමිත පාර්ශව වෙත යොමු කර ඒ සඳහා පිළිතුරු ලබා දීම වැනි කටයුතු ද වර්ෂය පුරා අඛණ්ඩව සිදු කරන ලදී.

ඉ-සේවා භාවිතාකරුවන් හට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම සන්නිවේදන මෘදුකාංග භාවිතයෙන් වඩාත් කාර්යක්ෂම ලෙස සිදුකරන ලදී.

මීට අමතරව ප්‍රධාන කාර්යාලයේ හා සියළුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල කාර්යාලයීය ඉ-තැපැල් සේවාව ආරක්ෂිත ක්‍රමවේදයන්ට යටත්ව පවත්වාගෙන යාම සිදු කරන ලදී.

### 24.3 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා නඩත්තු කටයුතු

ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල පවතින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම වර්ෂය පුරා අඛණ්ඩව සිදු කරන ලදී. එහිදී ප්‍රධාන කාර්යලයේ පිහිටුවා ඇති දත්ත මධ්‍යස්ථානයේ සේවා පවත්වා ගැනීම, උපස්ථ ලබා ගැනීම ආදී

කටයුතු ඉටුකිරීම සහ නඩත්තු කටයුතු අදාළ ආයතන මඟින් ඉටු කරවා ගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ අංශ ඇතුළු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල පරිගණක, පරිගණක උපාංග, පරිගණක ජාල, වී.පී.එන්. ජාලය, ෆයර්වෝල් සහ ADSL අන්තර්ජාල පද්ධති ආරක්ෂාකාරී ලෙස පවත්වා ගෙන යාම හා නියමිත පරිදි නඩත්තු කටයුතු සිදු කිරීම වසර පුරා අඛණ්ඩව ඉටු කිරීම.

මැතිවරණ කොමිෂන් සභාව සඳහා තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තිය, අඛණ්ඩ ව්‍යාපාර සැලැස්ම සහ ආපදා කළමණාකරන සැලැස්ම සකස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

මාර්ගගත ක්‍රමවේදයන් භාවිතා කරමින් ප්‍රධාන කාර්යාලය, සියළුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල හා බාහිර පාර්ශවයන් සඳහා රැස්වීම් පැවැත්වීම සඳහා වූ Video Conferencing තාක්ෂණික සහය ලබා දීම සිදු කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂක කැමරා පද්ධතිය (CCTV) පුළුල් කිරීම හා ඒ සම්බන්ධ කටයුතු වර්ෂය තුළ අඛණ්ඩව සිදු කරන ලදී.

## 25.නීති කටයුතු

2024 වර්ෂයේ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා සහ සාමාජික මහතුන් ද මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් ද වගඋත්තරකරුවන් ලෙස නම් කරමින් අලුතින් ගොනු කරන ලද නඩු කටයුතු 27 ක් මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා වී ඇත.

### 25.1 ශ්‍රේෂ්ඨාධිකරණය

මැතිවරණ කොමිෂන් සභාවට එරෙහිව මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් පෙත්සම් 13 ද, රිට් පෙත්සම් 10 ක් ද වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද නඩු කටයුතු සංඛ්‍යාව 23 ක් වේ.

ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද නඩු අතරින්, 2024 ජනාධිපතිවරණය පැවැත්වීම තුළින් සිය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන බව සඳහන් කරමින් SC/FRA/177/2024 හා SC/FRA/191/2024 අංක දරන නඩු ද, 2024 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා 2024.11.14 වන දින නම් කිරීමට එරෙහිව SC/FRA/292/2024 හා SC/FRA/295/2024 අංක දරන නඩු ද, 2024 පාර්ලිමේන්තු මැතිවරණයේ නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් SC/Writ/11/2024, SC/Writ/12/2024, SC/Writ/13/2024, SC/Writ/14/2024 හා SC/Writ/15/2024 අංක දරන නඩු ද ගොනුකර ඇත.
එසේම පාර්ලිමේන්තු මැතිවරණයේ රංජන් රාමනායක මහතාගේ නාමයෝජනා පත්‍රය භාරගැනීම හා මැතිවරණයට ඉදිරිපත් වීම සඳහා අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් නඩු 1 ක් ද, (නඩු අංක SC/FRA/296/2024) මුජිබර් රහුමාන් මහතා ජාතික ලැයිස්තු අපේක්ෂකයකු වශයෙන් පත් කිරීම සම්බන්ධයෙන් නඩු 1 ක් ද, (නඩු අංක SC/FRA/160/2024) 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ නාමයෝජනා අවලංගු කිරීමකින් තොරව ඡන්දය පැවැත්වීම සම්බන්ධයෙන් නඩු කටයුතු 3 ක් ද, (නඩු අංක SC/FRA/309/2024, SC/FRA/328/2024, SC/FRA/335 /2024) ගොනුකර ඇත.

තවද ඡන්ද හිමි නාමලේඛනයෙන් නම ඉවත් කිරීම සම්බන්ධ SC/Writ/02/2024, SC/Writ/03/2024) අංක දරන නඩු ද, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ වාර්ෂික සම්මේලන වාර්තාව පිළිගැනීම සම්බන්ධයෙන් SC/Writ/04/2024 අංක දරන නඩුවද, සිරදඬුවම් විඳිනු ලබන පුද්ගලයින් හට ඡන්ද අයිතිය ලබා දීම සම්බන්ධයෙන් SC/Writ/08/2024 අංක දරන නඩුවද, ලංකා ජනතා පක්ෂය අක්‍රිය කිරීමට එරෙහිව ගොනුකරන ලද SC/Writ/09/2024 අංක දරන නඩුවද , 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් කාල සීමාව තුළ ප්‍රජා උපදේශන කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් SC/FRA/139/2024,

SC/FRA/143/2024 අංක දරන නඩු ද, වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂවරයා සේවයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් SC/FRA/299/2024 අංක දරන නඩුවද හා 2024 ජනාධිපතිවරණ කාලසීමාව තුළ නීතිවිරෝධී ලෙස විනිවිදභාවයකින් තොරව මත්පැන් බලපත්‍ර අලුතින් නිකුත් කිරීම තුළින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට සඳහන් කරමින් SC/FRA/318/2024 අංක දරන නඩුවද වශයෙන් 2024 වර්ෂයේදී නඩු කටයුතු ගොනුකර ඇත.

**25.2 අභියාචනාධිකරණය**

අභියාචනාධිකරණයේ ගොනු කරන ලද නඩු කටයුතු 03 ක් ලැබී ඇති අතර, එම නඩු අතරින් 2024 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව නාමයෝජනා ප්‍රතික්ෂේපවීම සම්බන්ධව නඩු කටයුතු 02ක් ද, (නඩු අංකය CA/WRIT/664/2024, A/WRIT/666/2024) වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්‍ෂවරයා සේවයෙන් ඉවත් කිරීම සම්බන්ධව නඩු කටයුතු 1 ද (නඩු අංකය CA/WRIT/637/2024) වශයෙන් ගොනුකර ඇත.

**25.3 මහාධිකරණය**

2024 වසරේ මැතිවරණ කොමිෂන් සභාව පාර්ශ්වකරුවකු ලෙස නම් කරමින් මහාධිකරණයේ කිසිඳු නඩුකරයක් ගොනු කර නොමැත.

**25.4 දිසා අධිකරණය**

දිසා අධිකරණයේ ගොනු කරන ලද නඩු සංඛ්‍යාව 01 ක් වන අතර, එම නඩුව 2024 ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් නොකිරීම සම්බන්ධයෙන් ගොනුකර ඇත. (වලස්මුල්ල දිසා අධිකරණ නඩු අංක SPL-01)

**25.5 මහේස්ත්‍රාත් අධිකරණය**

2024 වසරේ මැතිවරණ කොමිෂන් සභාව පාර්ශ්වකරුවන් ලෙස නම් කරමින් මහේස්ත්‍රාත් අධිකරණයේ කිසිඳු නඩුකරයක් ගොනු කර නොමැත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරනු ලැබූ ඉහත කී නඩු අතුරින් නඩු 14 ක් ගරු අධිකරණය විසින් අවසන් තීන්දු ලබාදීමෙන් සහ පෙත්සම්කරුවන් විසින් ඉල්ලා අස්කර ගැනීම හේතුවෙන් අවසන්ව ඇති අතර නඩු 9 ක් මේ වන විටත් ගරු අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී. අභියාචනාධිකරණයේ ගොනුකර ඇති නඩු 3 අතුරින් නඩු 2 ක් මේ වන විට අවසන්ව ඇති අතර එක් නඩුවක් පමණක් විභාග වෙමින් පවතී. දිසා අධිකරණයේ පවරා ඇති නඩුව තවදුරටත් ගරු අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

නෛතික තත්ත්ව පිළිබඳ නීතිපති උපදෙස් විමසීම් 06 ක් යොමු කර ඇති අතර, ඒ සඳහා ගරු නීතිපතිතුමා විසින් ලබාදුන් උපදෙස් පිළිබඳව අදාළ පාර්ශ්ව දැනුම්වත් කර ඇත.

මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් ලැබුණු පැමිණිලි 05 ක් සඳහා අදාළ පාර්ශ්ව වෙතින් තොරතුරු විමසීම් සහ අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට සිදු කර ඇත. එමෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ විමර්ශන 04 ක් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම ද සිදු කර ඇත.

ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන 2024 ට අදාළව සිරදඬුවම් විඳින තැනැත්තන් 92 දෙනෙකු අසාධු ලේඛන ගත කිරීමට උපදෙස් ලබා දී ඇත. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන 2024 ට අදාළව ඉදිරිපත් කරන ලද හිමිකම් ඉල්ලීම් සහ විරෝධතා දැක්වීම්වලට අදාළව උපදෙස් ලබාදීම් 30 ක් සිදු කර ඇත.

## 26. ඉදිකිරීම් හා අලුත්වැඩියා (වැය විෂය 2001)

මැතිවරණ මහලේකම් කාර්යාලයේ ජාතික මැතිවරණ ශාඛාවේ බිත්ති අල්මාරිය සඳහා පියන් සකසා සවිකිරීම, උතුරු පර්යන්ත ගොඩනැගිල්ලේ බිම් මහලේ අලුත්වැඩියා කිරීම, දත්ත මධ්‍යස්ථානයේ නව විදුලි තතැදීම්,

අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) නිල කාමරය ප්‍රතිස්ථාපනය, මැතිවරණ මහලේකම් කාර්යාලයේ දුරකථන රැහැන් ක්‍රමවත්ව ප්‍රතිස්ථාපනය කිරීමට අදාළ හදිසි අලුත්වැඩියා කිරීම් හා උතුරු පර්යන්ත ගොඩනැගිල්ලේ සුරක්ෂිතාගාරයේ යකඩ රාක්ක සවිකිරීම ඇතුළු අලුත්වැඩියාවන් සිදුකර ඇත.

එමෙන්ම ගම්පහ, කළුතර, මහනුවර, නුවරඑළිය, ගාල්ල, වවුනියාව, මන්නාරම, ත්‍රිකුණාමලය, කුරුණෑගල, පොළොන්නරුව, බදුල්ල සහ කෑගල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල අලුත්වැඩියා කිරීම් සහ ගම්පහ සහ මහනුවර දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් නිල නිවාස සහ නුවරඑළිය, හම්බන්තොට, අම්පාර සහ කෑගල්ල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවාස අලුත්වැඩියා කිරීම්, මෙන්ම ත්‍රිකුණාමලය සංචාරක බංගලාවේ හදිසි අලුත්වැඩියා කිරීම් ද සිදුකර ඇත.

## 27. මූල්‍ය පාලනය

2024 වර්ෂය වෙනුවෙන් වියදම් දැරීම පිණිස විසර්ජන පනත මඟින් රුපියල් බිලියන 16.254 ප්‍රතිපාදන වෙන්කර ඇති අතර එම ප්‍රතිපාදන තුළ පුනරාවර්තන වියදම් දැරීම සඳහා රුපියල් මිලියන 1,111.02 ක් ද මූලධන වියදම් දැරීම සඳහා රුපියල් මිලියන 143 ක් හා මැතිවරණ වියදම් දැරීම සඳහා රුපියල් බිලියන 15 ක් ද ඇතුළත්ය.

පුනරාවර්තන වියදම් දැරීම සඳහා වෙන් කළ ප්‍රතිපාදනවලින් 2024.12.31 දින දක්වා රුපියල් මිලියන 1,094ක් වියදම් කර ඇත. මූලධන වියදම් දැරීම සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදනවලින් 2024.12.31 දින දක්වා රුපියල් මිලියන 89ක් හා ඡන්ද විමසීම සඳහා වෙන්කල ප්‍රතිපාදනවලින් රුපියල් බිලියන 13.245ක් වියදම් කර ඇත.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය වෙත ණය පහසුකම් ලබාදීම සඳහා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ මිලියන 18ක් විසර්ජන පනත මඟින් වෙන්කර ඇති අතර එම වෙන්කළ මුදලින් රුපියල් මිලියන 17ක ණය අත්තිකාරම් කාර්ය මණ්ඩලය සඳහා 2024.12.31 දින වනවිට ලබා දී ඇත.

## 28. අභ්‍යන්තර විගණන අංශය

මැතිවරණ කොමිෂන් සභාව සම්බන්ධයෙන් 2024 වර්ෂය සඳහා වාර්ෂික අවදානම් ලේඛනය අභ්‍යන්තර විගණන අංශය විසින් සකස් කරන ලද අතර ඒ ඇසුරින් අවදානම් පාදක වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම නිකුත් කරන ලදි. වර්ෂය මුල දී එකී සැලැස්ම විගණන හා කළමනාකරණ කමිටුවට සභාගත කර අනුමත කර ගන්නා ලදි.

එකී වාර්ෂික විගණන සැලැස්මට අනුකූල ලෙස 2024 වර්ෂය තුළ දී පහත දක්වා ඇති පරිදි විගණන පරීක්ෂා සහ විමර්ශන සිදු කර වාර්තා නිකුත් කර තිබේ. නිකුත් කරන ලද සියලුම අභ්‍යන්තර විගණන වාර්තා සම්බන්ධයෙන් ජාතික විගණන පනතේ 40(4)(3) උප වගන්තිය පරිදි කටයුතු කර ඇත.

මැතිවරණ මහලේකම් කාර්යයේ එක් එක් අංශය සම්බන්ධයෙන් විගණන පරීක්ෂා 3 ක් සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සම්බන්ධයෙන් විගණන පරීක්ෂා 11 ක් සිදු කර වාර්තා 14 ක් නිකුත් කර ඇති අතර වාර්ෂික ඡන්දහිමි නාමලේඛනයට අදාළව විමර්ශන වාර්තා 2 ක් නිකුත් කර තිබේ. මීට අමතරව 2024 වර්ෂයේ පැවති ජාතික මැතිවරණ දෙක සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂණ ඇතුළුව

විමර්ශන 8 ක් සිදු කර වර්ෂාවසානය වන විට වාර්තා 6 ක් නිකුත් කර තිබේ.

2024 වර්ෂය තුළ දී පැවති ජාතික මැතිවරණ දෙක සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත මූලික සංවිධාන කටයුතුවල නිරත වීමට සිදු වූ බැවින් වාර්ෂික විගණන සැලැස්ම එපරිදි බලාත්මක කිරීමට අවස්ථාවක් නොවීය. ඒ අනුව වාර්ෂික විගණන සැලැස්ම සංශෝධනය කරන ලද අතර එකී සංශෝධන විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කොට අනුමත කර ගන්නා ලදි. ඒ අනුව 2024 වර්ෂය තුළ විගණනයට ලක් කිරීමට අවස්ථාව නො ලද දිස්ත්‍රික්ක ද සමග දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි අදාළ ජාතික මැතිවරණ දෙකෙහි මූල්‍ය පාලනය හා මැතිවරණ ක්‍රියාදාමයෙහි කාර්ය සාධනය පිළිබඳ අතුරු විගණන කටයුතු ආරම්භ කරන ලදි. ඒ අනුව වර්ෂාවසානය වන විට දිස්ත්‍රික් 6 ක් සම්බන්ධයෙන් අතුරු විගණන පරීක්ෂා අවසන් කර ඇත.

ඉහත විගණන නිරීක්ෂණ ඇසුරින් ඉදිරි මැතිවරණ හා ඡන්ද විමසීම් සම්බන්ධයෙන් පැන නගින විගණන විමසුම් අවම කිරීම අරමුණු කරගත් නව අභ්‍යන්තර පාලන උපක්‍රම සහ මැතිවරණ ක්‍රියාදාමයේ සාධනීය බව තහවුරු කෙරෙන පූර්වෝපායයන් යෝජනා කරනු ලැබේ.

එසේම ජාතික විගණන පනතේ 41(2) වගන්තියෙහි දක්වා ඇති විධිවිධාන පරිදි 2024 වර්ෂය තුළ කළමනාකරණ විගණන කමිටු 4 ක් සංවිධානය කරන ලද අතර කමිටු වාර්තා 4 ක් නිකුත් කර ඇත.

## 29. විදේශ පුහුණු හා ශිෂ්‍යත්ව

පුත්තලම දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් එස්.එල්.ආර්. ජයනායක මහතා 2024.01.07 දින සිට 2024.01.14 දින දක්වා ඉන්දියාවේ පැවති මැතිවරණ සැලසුම්කරණය පිළිබඳ පුහුණු වැඩමුළුවට සහභාගී විය.

මැතිවරණ මහලේකම් කාර්යාලයේ ගණකාධිකාරී (ගෙවීම්) වයි.ඩී. ගමගේ මහත්මිය 2024.05.12 දින සිට 2024.05.25 දින දක්වා ඉන්දියාවේ පැවති දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන් සඳහා වන ධාරිතා සංවර්ධන පුහුණු වැඩමුළුවට සහභාගී වූ අතර එය ඉතා ඵලදායී පුහුණුවක් බව අදාළ නිලධාරිණිය විසින් වාර්තා කර ඇත.

මැතිවරණ මහලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ නිලධාරී පී.ඩී.ඩී. වික්‍රමසිංහ මහත්මිය 2024.06.22 දින සිට 2024.07.07 දින දක්වා ඔස්ට්‍රේලියාවේ පැවති Australia Awards Regional Short Course – Governing in the Digital Age පුහුණු පාඨමාලාවට සහභාගී විය.

## 30. විදේශ සම්මන්ත්‍රණ හා නිල චාරිකා

මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ආර්.එම්.ඒ.එල්. රත්නායක මහතා සහ අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) බී.එම්.පී.ජී.පී.වී.බණ්ඩාර මහතා 2024.01.23 දින සිට 2024.01.27 දින දක්වා ඉන්දියාවේ පැවති ආසියානු මැතිවරණ බලධාරීන්ගේ සංගමයේ විධායක මණ්ඩල රැස්වීම, 14 වන ජාතික ඡන්ද හිමියන්ගේ දින සැමරුම හා 2024.01.26 දින පැවැත්වූ ජනරජ දින සමරුම සඳහා සහභාගීවීමට විදේශ ගත වූ අතර, විදේශ රටවල මැතිවරණ කළමනාකරණය පිළිබඳ අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා එම සැසි ඉතා වැදගත් විය.

මැතිවරණ කොමිෂන් සභාවේ අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති, විමර්ශන හා සැලසුම්) බී.පී.සී. කුලරත්න මහතා සහ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (කොළඹ නාගරික) එම්.එම්.එස්.කේ. බණ්ඩාර මාපා මහතා 2024.02.11 දින සිට 2024.02.16 දින දක්වා ඉන්දුනීසියාවේ පැවති ඉන්දුනීසියානු

මැතිවරණ නිරීක්ෂණ වැඩසටහන සඳහා සහභාගීවීමට විදේශ ගත විය.

මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ආර්.එම්.ඒ.එල්. රත්නායක මහතා 2024.03.13 දින සිට 2024.03.20 දින දක්වා රුසියානු ජනාධිපතිවරණ මැතිවරණ නිරීක්ෂණයට සහභාගී විය.

මැතිවරණ කොමිෂන් සභාවේ අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන) එස්.අච්චුදන් මහතා සහ අම්පාර දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් ඒ.එම්.කේ.එස්. අත්තනායක මහතා 2024.05.04 දින සිට 2024.05.09 දින දක්වා ඉන්දියාවේ පැවති ඉන්දියානු මැතිවරණ නිරීක්ෂණ වැඩසටහන සඳහා සහභාගී විය.

## 31. 2024 වර්ෂයේ දේශීය පුහුණු

2024 ජූලි 03 සහ 04 දෙදින ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේදී මැතිවරණ ක්‍රමවේද පිළිබඳ පුහුණු වැඩමුළුව සඳහා දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් ඇතුළු නිලධරයන් තිස් දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියාකර ඇත.
දෙවන බස දෙමළ පැය 200 පුහුණු වැඩසටහනක් මැතිවරණ කොමිෂන් සභාවේදී පවත්වා ඇති අතර, ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් සිව් දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියාකර ඇත.

දෙවන බස දෙමළ පැය 100 පුහුණු වැඩසටහන් සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් සිව් දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියාකර ඇත.
දෙවන බස සිංහල පැය 100 පුහුණු වැඩසටහන් සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් තිදෙනෙකු සහභාගී කරවීමට ක්‍රියාකර ඇත.

2024 ජනවාරි 30 සහ 31 දින නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) ආයතනය මඟින් පවත්වන ලද මුදල් රෙගුලාසි 104 අලාභ වාර්තා කිරීම, හානි පූර්ණය හා ගිණුම් තැබීම පිළිබඳ පුහුණු පාඨමාලාව සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කළමනාකරණ සේවා නිලධාරී කේ.ආර්. ඥානේන්ද්‍රම් මහතා සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

2024 පෙබරවාරි 20 සහ 21 දින ජාතික ශ්‍රම අධ්‍යාපන ආයතනයේදී කාර්යාල සේවක සේවයේ නිලධරයන් සඳහා පවත්වන ලද පුහුණු වැඩමුළුව සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සේවය කරන කාර්යාල සේවක සේවයේ මහත්ම මහත්මීන් 09 දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියාකර ඇත.

කොළඹ විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද Master of Cyber Security Degree පාඨමාලාව සඳහා කෑගල්ල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් කේ.එච්.එම්.එස්.පී. කස්තුරිසිංහ මහතා සහභාගී කරවීමට ක්‍රියා කරන ලදී.

වැටුප් පරිවර්තනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් 2024 මාර්තු 15 දින මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයන් 17 දෙනෙකුගේ සහභාගීත්වයෙන් රාජගිරිය, මැතිවරණ මහලේකම් කාර්යාලයේදී පැවැත්වීමට ක්‍රියා කර ඇත.

2024 මැයි මස 30 සහ 31 දෙදින නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) ආයතනය මඟින් පවත්වන ලද ගබඩා කළමනාකරණය හා මිලදී ගැනීම් පිළිබඳ පුහුණු පාඨමාලාව සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ ආර්.කේ.එස්. වීරසිංහ මහතා සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

මොරටුව විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද CISCO Certified Network Associate (CCNA) පාඨමාලාව සඳහා තොරතුරු තාක්ෂණ නිලධාරී ජී.ඩී.ඩී.එම්. වික්‍රමසිංහ මහත්මිය සහභාගී කරවන ලදී.

2024 ජුනි 14 දින නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) ආයතනය මඟින් පවත්වන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කළමනාකරණ සේවා නිලධාරී වන්දිම ජාගොඩආරච්චි මහතා සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) ආයතනය මඟින් පවත්වන ලද රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දෙසතියක පුහුණු පාඨමාලාව සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කළමනාකරණ සේවා නිලධාරී කේ.ඩබ්.පී. මධුරංග මහතා සහභාගී විය.

කොළඹ විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද Master of Admin and Management පාඨමාලාව සඳහා මඩකලපුව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් එම්.බී.එම්. සුෆ්යාන් මහතා සහභාගී වීමට ක්‍රියාකර ඇති බව වාර්තා වේ.

## 32. මැතිවරණ ක්‍රමවේද සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IFES) මඟින් පවත්වන ලද පුහුණු

2024 ජනවාරි 09 දින සිට 2024 ජනවාරි 12 දක්වා සහ 2024 ජනවාරි 16 දින සිට 2024 ජනවාරි 19 දින දක්වා BRIDGE පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුවක් මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයන් 09 දෙනකුගේ සහ විදේශීය මැතිවරණ කළමනාකරණ ආයතනවල නියෝජිතයන්ද ඇතුළුව පහළොස් දෙනෙකුගේ සහභාගීත්වයෙන් වත්තල දී පැවැත්විණි.

ඡන්ද විමසීම්වලට අදාළ මෙහෙයුම් සැලැස්ම හා මැතිවරණ වියදම් සීමා පිළිබඳ පුහුණු වැඩමුළුවක් නිලධරයන් 63 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2024 අප්‍රේල් 03 දින සිට අප්‍රේල් 05 දක්වා කොළඹ, ගලධාරී හෝටලයේදී පැවැත්විණි.

වනිතා සංවර්ධන නිලධරයන්ගේ පුහුණු සංචිතයක් පිහිටුවීම සඳහා වූ පුහුණු වැඩසටහනක් වනිතා සංවර්ධන නිලධාරිණියන් 30 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2024.05.09 සහ 10 දෙදින කොළඹ දී පවත්වන ලදී.

මැතිවරණ මෙහෙයුම් සැලැස්ම පිළිබඳ දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයන් / දිසාපතිවරුන් / දිස්ත්‍රික් ලේකම්වරු සහ ඡන්ද විමසීම්වල මූලික කටයුතු සිදුකරනු ලබන මාණ්ඩලික නිලධරයන් / කමිටු ප්‍රධානීන් සහ ප්‍රමුඛ නිලධරයන් සඳහා පුහුණුව දිස්ත්‍රික්ක 08 කදී ලබා දෙන ලදී. එම දිස්ත්‍රික්ක පහත පරිදි වේ. ගම්පහ, කුරුණෑගල, මාතලේ, යාපනය, බදුල්ල, අම්පාර, පොළොන්නරුව හා කෑගල්ල වේ.

## 33. දේශපාලනික වශයෙන් කාන්තාවන් සවිබල ගැන්වීම

ප්‍රජාතන්ත්‍රීය අයිතීවාසිකම් සුරැකීමෙහිලා කාන්තාවන්ගේ කාර්යභාරය මැයෙන් සියලුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි රාජ්‍ය සේවයේ නියුතු කාන්තා නිලධරයන්, දේශපාලනයේ නියුතු දේශපාලන ප්‍රමුඛ ක්‍රියාකාරීන් 2562 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පුහුණු වැඩමුළු 29 ක් පැවැත්වීමට ක්‍රියා කර ඇත.

## 34. පුහුණුකරුවන් සංචිතයක් ස්ථාපිත කිරීම හා ඔවුන් දැනුම්වත් කිරීම

සිවිල් සංවිධාන හා ග්‍රාමීය ජන සංවිධාන සඳහා “ඡන්ද බලය අන්සතු කළ නොහැකි අයිතියකි” යන තේමාව යටතේ පුහුණුකරුවන් සංචිතයක් ස්ථාපනය කිරීම හා එම කණ්ඩායමට ප්‍රජා නායකයන් / වැවිලි ප්‍රදේශවල ප්‍රමුඛ ක්‍රියාකරුවන් ඇතුළත් අතර, පුහුණුකරුවන් 1210 දෙනෙකු 2024 වර්ෂය තුළදී පුහුණු කිරීමට ක්‍රියා කර ඇත. මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම සඳහා

පහසුකම්කාරකයන් (Facilitators) ලෙස ඔවුන් යෙදවීමට ක්‍රියාකර ඇත.

## 35. ස්ථාන මාරුවීම් හා අනුයුක්ත කිරීම්

මැතිවරණ කොමිෂන් සභාවේ මාණ්ඩලික නොවන පහත තනතුරුවල පැවති පුරප්පාඩු සඳහා ස්ථාන මාරුවී පැමිණීමට කැමැත්ත පළ කර තිබු රජයේ වෙනත් දෙපාර්තමේන්තුවල සේවය කරන ලද නිලධරයන් මැතිවරණ කොමිෂන් සභාවට යෝග්‍යවීම මත ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා මෙම කොමිෂන් සභාව වෙත ස්ථාන මාරු කර ගැනීමට කටයුතු කරන ලදී. තවද මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට ස්ථාන මාරුවීම් ඉල්ලා සිටි නිලධරයන් නිදහස් කිරීමටද කටයුතු කරන ලදී.

| තනතුර | ස්ථාන මාරුවී පැමිණි නිලධරයන් සංඛ්‍යාව | පිටතට ස්ථාන මාරුවී ගිය නිලධරයන් සංඛ්‍යාව |
|---|---|---|
| කළමනාකරණ සේවා නිලධාරි | 19 | 09 |
| සංවර්ධන නිලධාරි | 17 | - |
| තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහකාර | 01 | - |
| කාර්යාල සේවක සේවය | 04 | 06 |

මෙම කොමිෂන් සභාවේ පැවති තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර පුරප්පාඩුවක් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට නව පත්වීම් ලද නිලධරයන් 01 අයෙකු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දීමට කටයුතු කරන ලදී.

මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවීමෙන් පසු සකස් කරන ලද සිවු අවුරුදු උපාය මාර්ගික සැලැස්ම අනුව ක්‍රියාත්මක ව්‍යාපෘති, වැඩසටහන් නිසා පෙරට වඩා (මැතිවරණ දෙපාර්තමේන්තුව පැවති අවධියට) මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය භාරය පුළුල්වී ඇත. මෙම රාජකාරි බහුලත්වය සලකා බලා සංවර්ධන නිලධාරි තනතුරු 25ක් අලුතින් ඇති කර ගැනීමට කටයුතු කරන ලදී.

## 36.වාහන භාවිතය හා නඩත්තුව

මැතිවරණ කොමිෂන් සභාව සතුව වාහන 61 ක සංචිතයක් පවතින අතර ඉන් ප්‍රධාන කාර්යාලයේ ප්‍රවාහන කටයුතු සඳහා වාහන 33 ක් ද වාහන 28 ක් දිස්ත්‍රික් කාර්යාලවල ප්‍රවාහන අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ද යොදවා ගනී. 2024 වර්ෂය තුලදී ප්‍රධාන කාර්යාලය සතු වාහන වල සේවාවන් සහ අළුත්වැඩියා කටයුතු සඳහා වියදම රු. 35,925,334.62 විය. මෙම වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ වාහන වලට ඉන්ධන වියදම රු. 26,927,699.85 විය. මෙම වර්ෂය තුළ ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය ද පැවති අතර එම වියදම් ද ඇතුළත්ව මෙම ගණනය කිරීම් සිදු කර ඇත.

## 37.2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අදාළ කටයුතු

2024.01.01 දින සිට 2024.12.31 දක්වා කාලය තුළ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අදාළව විමසීම් කරන ලද තොරතුරු ඉල්ලීම් 194 කින් 190 ක් සඳහා තොරතුරු ලබා දී ඇති අතර වෙනත් අංශ වෙත යොමු කරන ලද තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව 04 කි.

## 38. මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු

මැතිවරණ කොමිෂන් සභාව විසින් අදාළ කාලය තුළ ගන්නා ලද කොමිෂන් සභා තිරණ, කාර්යයන් හා පැවැත්වීමට නියමිතව තිබූ 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව 2024 වසරේ පවත්වන ලද ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සහ 2024 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය ආයතන, දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම්, ඉදිරිපත් වූ

අපේක්ෂකයින් හා ජනතාව දැනුම්වත් කිරීම සඳහා මාධ්‍ය නිවේදන 211 ක් නිකුත් කර ඇත.

මෙම මාධ්‍ය නිවේදන ද භාෂාත්‍රයෙන්ම නිකුත් කරනු ලැබූ අතර සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත යොමු කරන ලදී. එම ආයතනවලට අයත් මාධ්‍ය මඟින් නිවේදනයේ සඳහන් කරුණු පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීමට කටයුතු සම්පාදනය කර තිබුණි. එසේම මාධ්‍ය නිවේදන මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ද පළ කරන ලදී.

එමෙන්ම ඡන්ද විමසීම් සහ මැතිවරණ කටයුතු පිළිබඳව සියලුම මාධ්‍ය ප්‍රධානීන්, මාධ්‍යවේදීන් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලද අතර, එම සාකච්ඡා මැතිවරණ කොමිෂන් සභාවේ දී සහ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දී පවත්වන ලදී.

සියලුම මාධ්‍ය ආයතනවල ප්‍රධානීන්, කර්තෘවරුන්, ප්‍රවෘත්ති සංස්කාරකවරුන් සහ මාධ්‍යවේදීන් ඇතුළත් WhatsApp සමූහයක් හරහා අදාළ සියලුම තොරතුරු ලබා දීමේ ක්‍රමවේදයක් ද ස්ථාපිත කොට ක්‍රියාත්මක කරන ලදී.

ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීමට සහ පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ ව්‍යවස්ථාපිත හා අත්‍යාවශ්‍යයෙන්ම දැනුම්වත් කළ යුතු කරුණු පිළිබඳව මහජනයා දැනුම්වත් කිරීම පිණිස නිවේදන 08 ක් භාෂාත්‍රයෙන්ම ප්‍රසිද්ධ පුවත්පත්වල පළ කරන ලදී.

මැතිවරණ කොමිෂන් සභාව විසින් IFES ආයතනයේ ද මූල්‍ය අනුග්‍රහය සහිතව "ශ්‍රවාන්ජන" නමින් නව මාධ්‍ය ඒකකයක් ස්ථාපිත කරන ලදී. මෙම ඒකකය මඟින් මැතිවරණ කොමිෂන් සභාව මඟින් ජනතාව වෙත ලබා දෙනු ලබන ව්‍යවස්ථාපිත නිවේදන විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය වෙත ලබාදීම ආදිය සිදු කරන ලදී. එමෙන්ම පසුගිය 2024 ජනාධිපතිවරණයේ දී සහ 2024 පාර්ලිමේන්තු මැතිවරණයේ දී මැතිවරණ කොමිෂන් සභාවේ නිල සමාජ මාධ්‍ය හරහා ඡන්ද විමසීම ආරම්භයේ සිට ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර අවසන් වන තෙක් සජීවී විකාශය හරහා පොදු නිවේදන, දැනුම්වත් කිරීම්, ඡන්ද ප්‍රතිඵල ආදිය ජනතාව වෙත ලබාදීම සිදු කරන ලදී.

## 39.ලේඛනාගාරය

මැතිවරණ කොමිෂන් සභාවේ ලේඛනාගාරයේ කාර්යයන් වඩාත් සංවිධිත අයුරින් පවත්වාගෙන යාමට ක්‍රියාකර ඇත. එහි ඇති ලිපි ලේඛන වඩාත් සුරක්ෂිත කර ගැනීම හා ඒවා අවශ්‍ය වන පරිදි ඕනෑම පාර්ශ්වයකට පහසු පරිශීලනය කිරීම සඳහා නිසි පරිදි ගබඩා කර තබා ගැනීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදී.

## 40.දැනුම් කළමනාකරණ ඒකකය හා කෞතුකාගාරය

මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යයන් හා කර්තව්‍යන් පිළිබඳව තොරතුරු ලබාගැනීම හා ඒ සඳහා ලැබෙන ඉල්ලීම් ප්‍රමාණය දෛනිකව වර්ධනය වෙමින් පවතී. මෙම විෂය පිළිබඳව අධ්‍යයන කටයුතුවල යෙදෙන විද්‍යාර්ථීන්ල පර්යේෂකයින් හා දේශපාලන පක්ෂ නියෝජිතයින්ල මැතිවරණ නිරීක්ෂණ සංවිධාන ඒ අතරින් ප්‍රධාන වේ. එබැවින් මෙම තොරතුරු ගවේෂකයින්ගේ කාර්යයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් ඉටු කරලීම පිණිස මැතිවරණ කොමිෂන් සභාව විසින් දැනුම් කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කරන ලදී. ඒ සඳහා පවත්නා මැතිවරණ නීති රීතිල අණ පනත්ල වාර්තා හා ලේඛන ගබඩා කිරීම හා පරිශීලනය පහසු කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කොට ඇත. මෙයට අමතරව ඡන්ද විමසීම් ක්‍රියාවලිය හා සබැඳි සියළුම තොරතුරු ලබා දීම සඳහා ද කටයුතු සම්පාදනය කොට ඇත. ඉදිරියේ දී මෙම කාර්යයන් වඩාත් පහසුකරලීම සඳහා පැමිණෙන පරිශීලකයන් සඳහා රැඳී සිටීමේ ස්ථානල පරිගණකල මල්ටි මීඩියා පහසුකම් හා ඉ තොරතුරු ලබා ගැනීම දක්වා වූ පහසුකම් ලබාදීමට කොමිෂන් සභාව කටයුතු කර ඇත.

## 41.මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රකාශන

41.1. මැතිවරණ කොමිෂන් සභාවේ 2017-2020 දක්වා වූ සිවු අවුරුදු සහභාගීත්ව උපාය මාර්ගික සැලැස්මේ හඳුනාගන්නා ලද අවධාරිත ක්ෂේත්‍ර යටතේ කොමිෂන් සභාවේ කාර්යයන් හා කර්තව්‍යන් අළලා කාර්තුමය වශයෙන් කතිරයේ බලය නමින් (News Letter) පුවත් සඟරාවක් එළි දක්වන ලදී. එහි කතිරයේ බලය පුවත් සඟරාවේ හත්වන වෙළුමේ තුන්වන කලාපය (ඔක්තෝම්බර් - දෙසැම්බර් 2023), අටවන වෙළුම පළමු කලාපය (ජනවාරි - අප්‍රේල් 2024), අටවන වෙළුමේ දෙවන කලාපය (මැයි - අගෝස්තු 2024) මුද්‍රණය කර ඇත.










41.2 මැතිවරණ කොමිෂන් සභාවේ 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව නියමිත කාලසීමාව තුළදී පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ක්‍රියාකර ඇත.



# III කොටස

## 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ක්‍රියාකාරකම්

1. 2026 - 2030 කාල රාමුව සඳහා කොමිෂන් සභාවේ උපායමාර්ග සැලසුම සකස් කිරීම.
2. සුදුසුකම්ලත් සියලු පුරවැසියන් ඇතුළත් වන අයුරින් 2025 ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය හා පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම.
3. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම හා පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීම සඳහා අවැසි මූලික කාර්යයන් සංවිධානය කිරීම, මෙහෙයුම් සැලසුම සකස් කිරීම හා ඒ අනුව දිස්ත්‍රික් මට්ටමින් නිලධාරීන් පුහුණු කිරීම.
4. 2024 ජනාධිපතිවරණ හා පාර්ලිමේන්තු මැතිවරණ වාර්තා සම්පාදනය කිරීම.
5. ඡන්ද හිමියන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
6. ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව කටයුතු කිරීම සහ අවශ්‍ය සහාය ලබාදීම.
7. මැතිවරණ වියදම් නියාමන පනත බලාත්මක කිරීමට අදාළ දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.
8. ආබාධිත, තරුණ, කාන්තා, ආන්තික ජන කොටස් ආදී සියලු පුරවැසියන් ඇතුළත් ඡන්දදායක අධ්‍යාපන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
9. මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගත් දේශපාලන පක්ෂ නියාමනය සඳහා ඒකාබද්ධ රාමුවක් හඳුන්වා දීමේ අරමුණින් එම පිළිගත් දේශපාලන පක්ෂ සඳහා මාර්ගෝපදේශ ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම හා දේශපාලන පක්ෂවල අභ්‍යන්තර පාලනය විධිමත්ව පවත්වාගෙන යෑම සහ පිළිගත් දේශපාලන පක්ෂයක සෑම සාමාජිකයෙකුටම සම අවස්ථා සලසමින් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට අනුකූලවීම සඳහා ඒකාබද්ධ මඟපෙන්වීමක් සකස් කිරීම.
10. පිළිගත් දේශපාලන පක්ෂ ක්‍රමානුකූලව පවත්වාගෙන යෑම සඳහා එම සෑම පිළිගත් දේශපාලන පක්ෂයකම අනන්‍යතාව තහවුරුවන සේ අනුක්‍රමික අංකයක් සඳහන් කිරීම.
11. 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 වන අධිකාරය) ඡන්දහිමි නාමලේඛනවලට නම් ඇතුළත් කිරීම හා සම්බන්ධ ප්‍රතිපාදනයන් හි සිදුකළ යුතු වෙනස්කම් හඳුනාගෙන ඇති අතර ඒ පිළිබඳව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත ය. එසේම තවදුරටත් අවශ්‍ය සංශෝධන හඳුනාගනිමින් පවතින අතර ඒ අනුව සංශෝධනය කළ යුතු නීති පිළිබඳව තව දුරටත් හඳුනාගැනීම් සිදු කිරීම.
12. මැතිවරණ නීති සංශෝධනය පිණිස පත් කරන ලද පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාව හා විශේෂ ජනාධිපති කොමිෂන් සභා යෝජනා අනුව සහ මැතිවරණ පනත් ක්‍රියාත්මක කිරීමේ දී හඳුනාගන්නා ලද අඩුපාඩු ඇතුළත් පවත්නා මැතිවරණ නීතිවලට අවශ්‍ය සංශෝධන සිදු කිරීම හා මතු දැක්වෙන පනතේ කෙටුම්පත් ව්‍යවස්ථාදායකයෙන් අනුමත කර ගැනීම.
    - ඡන්ද විමසීම් සඳහා තරඟ කරන අපේක්ෂක ඇප තැන්පත් වැඩි කිරීම;
    - උචිත ලකුණින් සලකුණු කිරීමේ ක්‍රමවේද සියලුම මැතිවරණ පනත්වලින් ඉවත් කිරීම;
    - පූර්වයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම;
    - ජංගම ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම;
    - ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා විශේෂ මධ්‍යස්ථාන පිහිටුවීම;
    - ඡන්ද විමසීම්වල දී තරඟ කරනු ලබන අපේක්ෂකයින් සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ආචාරධර්ම සඳහා නෛතික පදනමක් ලබාදීම;

- ඡන්ද විමසීම් කාලසීමාවේ දී මැතිවරණ කොමිෂන් සභාව නිකුත් කරනු ලබන මාධ්‍ය උපමාන සියලුම රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය සඳහා බලාත්මක කිරීම;

13. තොරතුරු තාක්ෂණ භාවිතාවට (ඉ - සේවා) අදාළ ක්‍රියාකාරකම්,
    - ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම සඳහා ජංගම මාර්ගගත ක්‍රමයක් නිර්මාණය කිරීම.
    - ලියාපදිංචි වීම තහවුරු කෙරෙන ස්වයං ක්‍රියාකාරී කෙටි පණිවුඩ පද්ධතියක් නිර්මාණය කිරීම.
    - මාර්ගගත ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ ක්‍රමය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
    - පුරවැසියන්ට පහසුවෙන් ප්‍රවේශ වීමට හැකිවන පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ තොරතුරු ප්‍රකාශයට පත්කිරීම හා යාවත්කාලීන කිරීම.
    - ඉලෙක්ට්‍රොනික ඡන්ද සළකුණු කිරීමේ සහ ගණන් කිරීමේ ක්‍රම ශ්‍රී ලාංකීය මැතිවරණ සංදර්භයට උචිත ද යන්න පරීක්ෂා කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම.
    - නව තාක්ෂණය භාවිතා කිරීමට, මැතිවරණ කොමිෂන් සභාවට හැකිවන පරිදි අවශ්‍ය නීති සංශෝධන සකස් කිරීම.
    - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහ අනෙකුත් අදාළ කාර්ය මණ්ඩලය සඳහා මෘදුකාංග පද්ධති හඳුනාගැනීම සඳහා පුහුණු අවශ්‍යතා තක්සේරුවක් සිදුකිරීම.
    - වාර්ෂිකව පළාත් මට්ටමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
    - ඡන්ද හිමි නාමලේඛන කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම.
    - පවතින මැතිවරණ කාර්ය මණ්ඩල (ඡන්ද නිලධාරී) කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම.
    - මැතිවරණ කළමනාකරණ ක්‍රියාවලියේ සියලුම පාර්ශවකරුවන් සඳහා විද්‍යුත් මාර්ගගත සේවා වැඩිදියුණු කිරීම.
    - අවශ්‍ය ආරක්ෂක තත්ත්වවලට අනුව පවත්නා ඉ තැපැල් පද්ධතිය වැඩි දියුණු කිරීම.
    - සහභාගීත්ව උපාය මාර්ග සැලැස්මෙහි ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ අධික්ෂණ ඒකකයට සහය වීම සඳහා විද්‍යුත් මාර්ගගත අධික්ෂණ පද්ධතියක් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.
    - කාලෝචිත තොරතුරු සමඟ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
    - ආබාධිත පුද්ගල හිතකාමී නිලවෙබ් අඩවියක් පවත්වාගෙන යාම.
    - සමාජ මාධ්‍ය භාවිතය සඳහා උපාය මාර්ග සකස් කිරීම.
    - යාවත්කාලීන වූ තොරතුරු සැපයීම සඳහා පවතින සමාජ මාධ්‍ය වේදිකා වැඩිදියුණු කිරීම.
    - ආබාධිත පුද්ගල හිතකාමී නිල සමාජ මාධ්‍ය වේදිකා පවත්වාගෙන යාම.
    - මාර්ගෝපදේශ සකස් කර ආදාළ පාර්ශවකරුවන් සමඟ හුවමාරු කර ගැනීම.
    - තාක්ෂණය භාවිතා කිරීම පිණිස පාර්ශවකරුවන් සඳහා දිශානතිකරණ වැඩසටහන් පැවැත්වීම.
    - භාවිතාවන් නිරීක්ෂණය කිරීම සහ වාර්තා සකස් කිරීමට කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.

14. ප්‍රජාතන්ත්‍රවාදය, සර්වජන ඡන්ද බලය හා ජනතා පරමාධිපත්‍ය පිළිබඳව ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා පර්යේෂණ සැසියක් (Symposium) හා කෙටි චිත්‍රපට උළෙලක් (Short Film Festival) පැවැත්වීම.

15. කාර්ය මණ්ඩල ධාරිතා වර්ධනය පිණිස විධිමත් සැලසුමක් යටතේ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් හා උසස් අධ්‍යාපන අවස්ථා ලබාදීම.
16. ඡන්ද විමසීම් ඉලක්ක කරගනිමින් රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
17. විදේශීය මැතිවරණ කළමනාකරණ ආයතනය සමඟ සම්බන්ධීකරණය හා අවස්ථාවෝචිත පරිදි විදේශ මැතිවරණ නිරීක්ෂණ හා පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සහභාගී කරවීම.
18. කොමිෂන් සභාව සතු භෞතික සම්පත් වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම.

19. මූල්‍ය පාලනය ශක්තිමත් කිරීම/ විධිමත් කිරීම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

20. මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය කර්තව්‍ය ඇතුළත් වාර්ෂික හා කාර්තුමය ප්‍රකාශන නිකුත් කිරීම

මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission

මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

(+94)112868441-42-43 (+94)112868426 info@elections.gov.lk www.elections.gov.lk
elecomsl SriLankaElectionCommission Election Commission of Sri Lanka Election Commission of Sri Lanka

**මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රකාශනයකි**
**தேர்தல் ஆணைக்குழுவின் வெளியீடு**
**PUBLISH BY ELECTION COMMISSION**